කාර්යක්ෂමව හා
ඒකමුතුව
වඩාත් නිර්මාණාත්මක
නැඹුරුවකින්
ශක්තිමත්ව හා
ඒක්සත්ව
අත්දැකීමෙන්
පිරුණු
කැපවූ අව්‍යාජ
කාර්යභාරයක්
සාමූහිකව
ඉටුකිරීමේ
කාර්යභාරය හා
කණ්ඩායම් හැඟීම මුසුවූ
ජවයක් තුළින්
අභිමානයෙන්
සේවය
ඉටුකිරීමෙහි ලා

ඔබේ හිතට
වඩාත් හොඳින් දැනෙන
යමක් වෙනුවෙන්
අපි හැම ඔබට





ජනතා අපේක්ෂාවන් පුබුදුවාලමින් සැහැල්ලු, නිස්කලංක ජීවිතයකට හා දොම්නසින් තොර ශුභවාදී සිත්වලින් පිරි පැවැත්මකට

පටුන

ආයතනික තත්ත්වය
- ආයතනික තොරතුරු
- දැක්ම, මෙහෙවර හා වටිනාකම්

විධායක තොරතුරු
- සභාපතිගේ පණිවුඩය
- සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය
- අධ්‍යක්ෂ මණ්ඩලය
- ආයතනික කළමනාකරණය

ආයතනික සමාජ වගකීම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ආයතනික පාලනය

අවදානම් කළමනාකරණය

අනුකූලතා වාර්තාව

මානව සම්පත් සංවර්ධනය හා ආයතනික කටයුතු

විගණන කමිටුවේ වාර්තාව

අභ්‍යන්තර පාලන පිළිබඳ සහතික වාර්තාව

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණක වාර්තාව

මූල්‍ය ප්‍රකාශ

වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය

පෙරකලාසි ආකෘති



ආයතනික තොරතුරු

ලියාපදිංචි නාමය
ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

නෛතික තත්වය
1982 අංක 17 දරන සමාගම් පනත යටතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද පොදු වගකීම් සහිත සමාගමකි.
ලියාපදිංචි අංකය ■ N(PBS) 1336
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද අතර PB 296 මගින් නැවත ලියාපදිංචි කරන ලදී.
1988 අංක 30 දරණ බැංකු පනත යටතේ පිහිටුවන ලද බලපත්‍ර ලත් විශේෂිත බැංකුවකි.

ලියාපදිංචි කාර්යාලය
අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07.
දුරකථන අංක : 0112691721 - 2 , 0112674700/1/2/3
ෆැක්ස් : 0112674705/6
විද්‍යුත් තැපෑල : slsbl@sltnet.lk

නීතිගත කළ දිනය
2006 ජූලි 07 වැනි දින

සමාගම් ලේකම්
වයි. එම්. ජේ ප්‍රනාන්දු මහත්මිය
එල්. එල්. බී. (ලංකා), නීතිඥ,
නොතාරිස් හා දිව්රුම් කොමසාරිස්.

විගණකවරු
එස්.ජේ.එම්.එස්. ඇසෝසිඒට්ස් සහ සමාගම
වරලත් ගණකාධිකාරීන්
අංක 02, කාසල් පටුමග, කොළඹ 04.

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව

අධ්‍යක්ෂක මණ්ඩලය
ආරියතිලක දහනායක මහතා (සභාපති)
(2014. 03.19 දිනට වයස අවුරුදු 70 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ගියේය.)

ප්‍රියංග අල්ගම මහතා (භාණ්ඩාගාර නියෝජිත)

කෝසල රත්නවීර මහතා

තිලක් වන්නිගම මහතා

උඩුවගේ දොන් සුමිත් පරාක්‍රම පෙරේරා මහතා

ඉදිගහවෙල ගමගේ පාලිත මහතා

සනත් වීරතුංග මහතා (ක්‍රියාකාරී අධ්‍යක්ෂ)
(2014.03.20 දින සිට සභාපති වශයෙන් පත්කරන ලදී.)

එච්. ජී. සුමනසිංහ මහතා - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
(2013 ඔක්තෝබර් 24 වන දින පත්කරන ලදී.)



ශ්‍රී ලංකාව - හිමෙන් වැසීගත් කඳු ඇති රාජ්‍යය



ශ්‍රී ලංකාව - පාෂාණීය ලෝක උරුම ඇති රාජ්‍යය

අපගේ දැක්ම

ක්ෂුද්‍ර මූල්‍ය සම්පාදන විෂයෙහි ප්‍රමුඛ පෙළ බැංකුවක් වීම.

අපගේ මෙහෙවර

ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරීම මෙන්ම විශේෂයන්ම ක්ෂුද්‍ර ව්‍යවසාය අංශය ඇතුළු ආර්ථිකයේ විවිධ අංශ සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන සම්පත් සැපයීම.





අපගේ වටිනාකම්


අපගේ සේවා සම්පාදනයේදී පහත සඳහන් කරුණු වෙනුවෙන් ඇපකැප වෙමින් කල්පිත න්‍යායන් හා ආචාරධර්ම පිළිගැනීම.


- වෘත්තීයවේදීත්වය
- ඒකාග්‍රතාව
- කාර්යක්ෂමතාවය
- විශ්වාසය
- විවෘත බව
- සමාජ වගකීම


වැදගත් මූල්‍ය තොරතුරු
























වැදගත් මූල්‍ය තොරතුරු






වැදගත් මූල්‍ය තොරතුරු








	වියදම්	පොළී වියදම්	පිරිස් පිරිවැය	කාර්යමණ්ඩල විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	පරිශ්‍ර, උපකරණ හා ආයතනික වියදම්	ගාස්තු හා කොමිස් වියදම්	වෙනත් කාර්යාලයීය වියදම්	මුළු මෙහෙයුම් වියදම්
2012	236	139	43	3	18	7	29	50
2013	297	141	44	4	22	7	83	51



ශ්‍රී ලංකාව - මනස්කාන්ත දිවයින

සභාපතිගේ පණිවුඩය,

“ අප අභිමුඛයේ ඇති අභියෝගයන්ට මුහුණ දෙන ආකාරය පිළිබඳව සමාජය විමසිල්ලෙන් බලා හිඳියි. ”



2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මා ඉදිරිපත් කරන්නේ ඉතාමත් ප්‍රීතියෙනි.

මූලික අවශ්‍යතාවයන්ට කිසිදු ප්‍රවේශයක් නොමැතිව තිබූ ඈත ගම්දනව් වලට සහ ග්‍රාමීය කුඩා ව්‍යවසායකයින්ට පසුගිය අවුරුදු කීපය තුල, පහසුකම් සැලසීමේ අරමුණ පෙරදැරිකරගෙන බැංකුව විසින් රජයේ ආර්ථික සැලැස්ම වන ''මහින්ද චින්තන ඉදිරි දැක්ම'' යටතේ ඒ සඳහා මූල්‍ය පහසුකම් ප්‍රවේශයන් වැඩි කරන ලදී. අඩු ආදායම් ලබන ජනතාව ඇති හැකි අයවලුන් බවට පත්වීම ද ඔවුන් වෙත වඩාත් ප්‍රවේශ වීමද ප්‍රතිපාදන ලෙස අද ඔවුන්ගේ සහජ කුසලතා දෙගුණ තෙගුණ වී වර්ධනය වෙමින් පැවතීමද මෙහි විද්‍යාමාන ලක්ෂණ වේ.

මෙම හිතකර වාතාවරණය මධ්‍යයේ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 2013 වර්ෂයේදී කෘෂිකර්මය පදනම් වූ ජීවනෝපායන්හි ජීවන රටාවන් වැඩිදියුණු කිරීමෙහි තවදුරටත් නිරත විය. අඩු පොලී අනුපාත සහිත විවිධ ණය යෝජනා ක්‍රම යටතේ අඩු ආදායම් ලබන ජනතාවට පහසුකම් සලසන ලද අතර ඒ හරහා ජාතික ආර්ථික සංවර්ධනයේ දායකත්වයක් කරා ඔවුන් යොමු කරවන ලදී. මෙම පසුබිම තුළ මුළු මහත් රටේ ජනතාවගේ අවශ්‍යතාවයන් හා අරමුණු වෙනුවෙන් මූල්‍ය සහාය බැංකුවෙන් සලසා දෙන ලදී. 2013 වර්ෂයේදී අනුරාධපුරය, මන්නාරම සහ මාතර යන නගරවල ශාඛා තුනක් බැංකු ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියක් වශයෙන් විවෘත කරන ලද්දේ අපගේ හිතවත් ගනුදෙනුකාර භවතුන්ගේ පහසු ප්‍රවේශය සඳහාය.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ආරම්භ කරන ලද්දේ අවම පහසුකම් තිබෙන තත්ත්වයක් යටතේ සුළු සේවක සංඛ්‍යාවක් සහිතවය. ව්‍යාපාරය තුළින් අප ලබා ඇති වර්ධනය හේතුකොටගෙන කාර්යමණ්ඩලයේ සංඛ්‍යාව දැන් වැඩි වී තිබේ.

2013 වර්ෂයේදී අප අත්කරගත් ජයග්‍රහණ පහත දැක්වේ.

* දළ ආදායම රු. මිලියන 1,017 දක්වා වර්ධනය. මෙය පසුගිය වසරට සාපේක්ෂක 33%ක වර්ධනයකි.
* ''වැට්'' බද්දට පෙර රු. මිලියන 616.1ක ආදායමක් ඉපැයීම.
* කොටස් හිමියන්ගේ අරමුදල් රු. මිලියන 3,383ක් දක්වා (15% න්) වැඩිවීම.
* ඉහතදී පැවැති ''ප්‍රමුඛ'' බැංකුව විසින් දෙන ලද ණය වලින් රුපියල් මිලියන 1202ක් අයකර ගැනීමට සමත් වීම.
* 18%ක වර්ධනයක් අත්කර ගනිමින් රු.මිලියන 736ක් තැන්පතු ලබා ගැනීම.

මෙහිදී අප වෙත ලබාදෙන ලද ස්ථීර සාර සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාට සහ සියළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මහත් කෘතඥතාව පිරිනමන අතර අපගේ ආයතනයේ නියාමක වශයෙන් කටයුතු කළ ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපතිතුමාට, බැංකු අධිකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීන්ට ඔවුන් ලබාදුන් සහයෝගය හා මග පෙන්වීම වෙනුවෙන් මාගේ ස්තුතිය පුදකරනු කැමැත්තෙමි.


බැංකුවේ ජයග්‍රහණ අත්පත් කර ගැනීම සඳහා නොමඳ සහයක් දුන් හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂක සනත් වීරතුංග මහතාට මාගේ හෘදයාංගම ස්තුතිය හිමිවේ.

තවද, අතිශය තරඟකාරී වාතාවරණයක් තුළ බැංකුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා අනගි සහයක් දෙමින් හා කැපවීමෙන් කටයුතු කළ අධ්‍යක්ෂක මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සේවක මණ්ඩලයට මා කෘතඥතාව පිරි නමමි.

එමෙන්ම, සී/ස ශ්‍රී ලංකා සමූපකාර ග්‍රාමීය බැංකු සම්මේලනය, සමූපකාර සමිති, දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු වෘත්තීය සමිති හා අපගේ හිතෛෂී ගනුදෙනුකරුවන්ට මාගේ කෘතඥතාව හිමිවේ.



ආරියතිලක දහනායක
සභාපති



සාමාන්‍යාධිකාරී /
ප්‍රධාන විධායක නිලධාරී
සමාලෝචනය

“ක්ෂුද්‍ර මූල්‍ය සම්පාදනය තුළින් ධාරිතා වර්ධනය”

සී/ස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

> **“බැංකුවේ ඉලක්කගත වෙළඳපොල වනුයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ය. ජාතික සංවර්ධන හා භාර අරමුදල හා එක්වීමෙන් ඉක්බිතිව අප විසින් ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යවසායන්ට ණය දීමට අප ඇපකැප වූයේ එදාවේල සවිකරගත් දිලිඳුකමින් පීඩා විඳිමින් සිටින පවුල්වලට සැලසුම් සහගතව, වඩාත් හොඳ ආදායමක් ලබමින්, සෞඛ්‍ය සම්පන්න, පෝෂ්‍යය, ජීවිතයක් ගත කිරීමට හා ඔවුන්ගේ දුදරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙමින් ජීවන තත්ත්වය දියුණු කර ගැනීම වෙනුවෙනි.”**

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 2008 මාර්තු 10 දින තම මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර එහි ප්‍රධාන අරමුණු වූයේ කලින් පැවැති ''ප්‍රමුඛ'' බැංකුවේ තැන්පත්කරුවන් හා ආයෝජකයින්ට සහන සැලසීමය. ඉන් ඉක්බිතිව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිරිමසා ගැනීම පිණිස රජය සතු , වත්කම් සහිත සූක්ෂ්ම මූල්‍ය සමාගමක් වන ජාතික සංවර්ධන භාරකාර අරමුදල 2010 සැප්තැම්බර් 30 දින බැංකුව හා ඒකාබද්ධ කරන ලදී.

2013 වර්ෂය බැංකුව සම්බන්ධයෙන් වැදගත් වසරක් වූයේ මන්නාරම, මාතර සහ අනුරාධපුරය යන නගරවල බැංකු ශාඛා පිහිටුවීමත් සමගය. මෙම සැලකිය යුතු ජයග්‍රහණ හිමිකර ගැනීමට පාදක වූයේ බැංකුව විසින් අනුගමනය කරන ලද සාර්ථක ක්‍රමෝපාය නිසාය.

මූල්‍ය ප්‍රතිඵල

2013 වර්ෂයේදී වාර්තා වූ ආදායම වන රු. මිලියන 563 ඉහත වර්ෂයේදී එනම් 2012 දී උපයාගත් ආදායමට සාපේක්ෂව 32% ක වර්ධනයකි. මීට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පොලී ආදායම වැඩි වීමයි. වර්ෂය සඳහා දළ ආදායම රුපියල් මිලියන 1018ක් විය. ණයවලින් සහ අත්තිකාරම්වලින් ලැබූ දළ ආදායම රු. මිලියන 140 සිට 194 දක්වා වර්ධනය විය. මෙයින් රු. මිලියන 151 ක් හා රු. මිලියන 43ක් පිලිවෙලින් ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවලින් ලත් පොලී ආදායම හා ''ප්‍රමුඛ'' ඉතිරි කිරීමේ හා සංවර්ධන බැංකුවේ අක්‍රීය ණය වල පොලී අයකිරීම්වලින් ලැබුනු ඒවා විය. වත්කම් හා වගකීම් සාර්ථක ලෙස කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර ආදායම් සුරැකුම්පත්වලින් ලැබූ පොලිය රු. මිලියන 604 සිට රු. මිලියන 803 දක්වා වර්ෂය තුලදී වැඩිවිය. 2012 වර්ෂයේදී පොලී නොවන ආදායම 50%ක වර්ධනයක් එනම් 2012 වර්ෂයේදී ලැබූ රු. මිලියන 14ට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 21ක පොලී නොවන ආදායමක් බැංකුවට ලබාගත හැකිවිය. ප්‍රධාන වශයෙන්ම දේපොල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ ආදායම මෙම වර්ධනයට දායක වූ සාධක විය.

මූල්‍ය වර්ෂය තුලදී 'ප්‍රමුඛ' බැංකුවේ අක්‍රීය අත්තිකාරම්වලින් පාඩු සේ ගැණුනු රු. මිලියන 110.6ක් ආපසු අයකර ගැනීමට බැංකුව සමත්විය. මෙය 2013 වර්ෂයේදී බැංකුව අත්කරගත් විශේෂ ජයග්‍රහණයක් විය.

අළුතින් ශාඛා ඇති කිරීම සහ සේවකයන්ට ප්‍රතිලාභ වැඩිකිරීම හේතුකොටගෙන ණය පාඩු ප්‍රතිපාදන සැලසීම් නොමැතිව හා ලාභය මත මූල්‍ය සේවා 'වැට්' ප්‍රතිපාදන නොමැතිව ලාභ 45%කින් වැඩිවිය. තැන්පත්කරුවන්ට හා ණය දුන් පුද්ගලයන්ට පොලී ගෙවීම් ප්‍රමාණය රුපියල් මිලියන 141ක් වූ අතර මෙය 2012 වසර සසඳන විට 1.44% වර්ධනයකි. මීට හේතුපාදක වූයේ අළුත් බැංකු ශාඛා තුනක් විවෘත කිරීමත් සමග තැන්පතු පදනම වැඩිවීමයි. ලංකා බැංකු සේවක සංගමයේ සේවකයින් සමග සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නව බඳවා ගැනීම් සහ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් (2012 සිට ක්‍රියාත්මක වන පරිදි) පිරිස් පිරිවැය අදාළ වර්ෂයේදී රු. මිලියන 44ක් විය.

2013 බැංකුවේ පිරිවැය / ආදායම් අනුපාතය 46% ක් වූ අතර 2012 වර්ෂයේදී එය 39%ක් විය. 2013 දී වාර්තා වූ වත්කම් මත ප්‍රතිලාභ (සෘධ්) 6.58% ක් වූ අතර 2012 දී එය 8.07% ක් විය.


තැන්පතු හා ගිණුම් පදනම

මූළු වගකීම් ප්‍රමාණයෙන් 17.93%ක් වර්ෂය සඳහා වූ තැන්පතුවලින් නියෝජනය විය. එහි වටිනාකම රුපියල් මිලියන 749 ක් වූ අතර 2012 වර්ෂය සමග සසඳා බැලීමේදී 12.87%ක වැඩිවීමකි. නව තැන්පතුවල වර්ධනය සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලැබුනේ කාලීන තැන්පතුවලිනි. සමාලෝචිත වර්ෂය තුළදී සූක්ෂ්ම ණය ආයතන සම්බන්ධයෙන් වූ බැංකු අවශ්‍යතා මෙන්ම සේවකයින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවයක් දෙන ලදී.

2012දී බැංකුව වෙත පැවති ගිණුම් සංඛ්‍යාව වූ 7420 සිට 8408 දක්වා වර්ධනය විය.

ණයට ගැනුම්

2013 වර්ෂයේ අවසානය වන විට ණයට ගැනුම්වල අගය රුපියල් මිලියන 1518.31 ක් විය. ජාතික සංවර්ධන භාර අරමුදල ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සමග (භෘඔත) 2010 දී පත් කරනු ලැබීමෙන් ඉක්බිතිව විවිධ ජාත්‍යන්තර මූල්‍ය සම්පාදන




නියෝජ්‍යායතනවලින් ලබාගත් ණය ප්‍රමාණය රු. මිලියන 1439 ක් විය. මෙම අරමුදල් ක්ෂුද්‍ර මූල්‍ය සම්පාදන ආයතන (පාර්ශ්ව සංවිධාන) සඳහා ඔවුන්ගේ ආදායම් උත්පාදන කටයුතු සඳහා සපයන ලදී. ඉතිරියෙන් නියෝජනය වූයේ මූල්‍ය උපකරණ හරහා ආයෝජකයින්ගෙන් 'ප්‍රමුඛ' බැංකුව ලබාගත් මුදල්ය. ශ්‍රී ලංකා මහබැංකුවේ මුදල් මණ්ඩලය විසින් සම්පාදිත වගකීම් නිරවුල් කිරීමේ යෝජනා ක්‍රමය අනුව මෙම ණයට ගැනුම් නිරවුල් කරගෙන යමින් පවතී.

මුළු කොටස්


බැංකුවේ විෂයාංගයට 'ප්‍රමුඛ' බැංකුව ඇතුළත් කිරීමෙන් පසු බැංකුව සතු වූ සෘණ වටිනාකම රු. මිලියන 2141 ක් විය. කෙසේ නමුත් රාජ්‍යායතන විසින් 'ප්‍රමුඛ' බැංකුවේ තැන්පතු ප්‍රාග්ධනීකරණය කිරීම ජාතික සංවර්ධන හා භාර අරමුදල බැංකුව සමග ඒකාබද්ධ කිරීම සංස්ථාගත කිරීමේ සිට රඳවාගත් ඉපැයීම් හේතුකොටගෙන බැංකුව ධන අගයක් සහිත ආයතනයක් බවට පරිවර්තනය විය. ජාතික සංවර්ධන භාර අරමුදලෙහි වත්කම් පැවරීමත් සමග බැංකුවේ වත්කම් පදනම 2010 වර්ෂයේදී සිව්ගුණයකින් පමණ ඉහල ගියේය. මේ හේතුව නිසා බැංකුවේ ණය වත්කම් හා ද්‍රවශීල වත්කම්, එහි වත්කම් සංකලනයේ වෙනසක් ඇති කරමින් වර්ධනය විය.

බැංකුවේ මුළු කොටස් ධාරිතාව 2013 වර්ෂයේදී රු. මිලියන 3833 ක වටිනාකමක් දැරූ අතර 2012 වර්ෂයේදී රු. මිලියන 3274 හා සසඳනකල වැඩිවීමක් වූ අතර මුළු වත්කම්වලින් 47.85% ක් එයින් නියෝජනය විය.



වත්කම්

2012 අවසාන වන විට බැංකුවේ මුළු වත්කම්වල වටිනාකම රු. මිලියන 7342 ක් වූ අතර වත්කම් පදනම 9.11% ක වර්ධනයක් පෙන්නුම් කළේය. බැංකුවල පැවති ද්‍රවශීල වත්කම්, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු වත්කම් වලින් 69.02% ක් නියෝජනය කරයි.



ණය හා අත්තිකාරම්

ණය හා අත්තිකාරම් බැංකුවේ සමස්ත වත්කම්වලින් 40.64% ක් නියෝජනය කළේය. 2013 අවසාන වන විට දළ ණය හා අත්තිකාරම්වල අගය රු. මිලියන 3255ක් විය.

බැංකුවේ ඉලක්කගත වෙළඳපොල වනුයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ය. ජාතික සංවර්ධන හා භාර අරමුදල හා එක්වීමෙන් ඉක්බිතිව අප විසින් ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යවසායන්ට ණය දීමට අප ඇපකැප වූයේ එදාවේල සවිකරගත් දිලිඳුකමින් පීඩා විඳිමින් සිටින පවුල්වලට සැලසුම් සහගතව, වඩාත් හොඳ ආදායමක් ලබමින්, සෞඛ්‍ය සම්පන්න, පෝෂණීය, ජීවිතයක් ගත කිරීමට හා ඔවුන්ගේ දූදරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙමින් ජීවන තත්ත්වය දියුණු කර ගැනීම වෙනුවෙනි. එබැවින් අප නිරතුරුවම ක්ෂුද්‍ර ණය ආයතන වෙතින් අඛණ්ඩව ණය සම්පාදනය කිරීමේ කාර්යයෙහි නිරතව සිටියෙමු.

'ප්‍රමුඛ' බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ වගකීම් නිරවුල් කිරීම

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ආරම්භ කිරීමේදී (ශ්‍රී ලංකා මහබැංකුවේ මුදල් මණ්ඩලය විසින් සම්පාදිත යෝජනා ක්‍රමය අනුව) ඊට පැවරුණු කාර්යභාරය වූයේ 'ප්‍රමුඛ' බැංකුවේ පාර්ශ්ව කරුවන්ගේ බැඳියාවන් නිරවුල් කිරීමය. මේ අනුව බැංකුවේ විශේෂ කර්තව්‍යයක් ලෙස තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ හිමිකම් ඉල්ලීම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය දැනට අනුගමනය කෙරෙමින් පවතින අතර එය 2017 අවසාන වන විට නිමකිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

මානව සම්පත් සංවර්ධනය

අදාල වර්ෂය තුලදී බැංකුවේ සේවක සංඛ්‍යාව 89 දක්වා වැඩිවිය. පසුගිය වසරේ සිටි සේවක සංඛ්‍යාව 72 කි. ආයතනයේ සාර්ථකත්වය සඳහා මානව සම්පත අතිශයින් වැදගත් වන බව අප විසින් විශ්වාස කරන අතර ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණුකිරීමේ වැදගත්කමද අප විසින් හඳුනාගෙන තිබේ. එබැවින් අභ්‍යන්තරික වශයෙන් හා බාහිර වශයෙන්ද කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම මගින් අපි මානව ප්‍රාග්ධන විෂයෙහි අඛණ්ඩව ආයෝජන සිදු කලෙමු.

සමාප්තිය

ගණුදෙනුකාර භවතුන්ට ප්‍රශස්ත සේවාවන් සැපයීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් වෙනුවෙන් ඇපකැපවීම බැංකුවේ ප්‍රධාන වගකීම වේ.

සභාපතිතුමා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂකතුමන් විසින් මෙකී ප්‍රයත්නයන් තුල සපයන ලද මගපෙන්වීම සහ තිරසාර සහයෝගය විශේෂයෙන් මෙහිදී සිහිපත් කරන අතර එය අගයකොට සලකමි.

පසුගිය වර්ෂයන්හිදී බැංකුව විසින් අත්කරගන්නා ලද සාර්ථකත්වයේ ස්ථම්භය වන්නේ

අපගේ කැපවීමයි. මෙහිදී මාහට සහ මාගේ කාර්ය මණ්ඩලයට සභාපතිතුමා, ක්‍රියාකාරී අධ්‍යක්ෂක තුමා සහ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් දක්වන ලද සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් ස්තුතිය පුදකරනු රිසියෙමි.

තවද, අප වෙත දක්වන ලද අනුග්‍රහය වෙනුවෙන් අපගේ සියලු ගනුදෙනු කරුවන්ට සහ බැංකුවේ සාර්ථකත්වය වෙනුවෙන් කාර්ය මණ්ඩලය විසින් දරන ලද කැපවීමට මාගේ හෘදයාංගම ස්තුතිය හා කෘතඥතාව පළ කරමි. තවද මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ කටයුතු කරගෙන යාමේදී, ඔවුන් විසින් සපයන ලද මාර්ගෝපදේශ වෙනුවෙන් අවසාන වශයෙන් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.



එඩ්රියන් වීරසේකර
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී



ශ්‍රී ලංකාව - අසමසම දිවයින

අධ්‍යක්ෂක මණ්ඩලය



SLS Bank

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

இலங்கை சேமிப்பு வங்கி

Sri Lanka Savings Bank





ආරියතිලක දහනායක මහතා
ශාස්ත්‍රවේදී (ශ්‍රී ලංකා), නීතිවේදී (ශ්‍රී ලංකා), නීතීඥ, ප්‍රසිද්ධ නොතාරිස්, සාමදාන විනිශ්චකාර, දිවුරුම් කොමසාරිස්

බැංකුව සංස්ථාපනය කළ 2006 ජූලි 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරියතිලක දහනායක මහතා භාණ්ඩාගාර ලේකම්තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ අතරම 2007 ජූලි 04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙසටද පත් කරන ලදී. 2010 මැයි 07 වන දින ඔහු එම තනතුරෙන් ඉවත් වූ අතර 2010 මැයි 10 වන දින සිට නැවතත් ඔහු ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති ලෙසට පත් කරන ලද අතර 2013.12.31 වන තුරු එම තනතුරේ සේවය කළේය. ඔහු බෙලිඅත්ත විවිධ සේවා සමූපාකාර සමිතියේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකුවේ සභාපති ලෙසටද කටයුතු කරයි. තවද ඔහු සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගමේ සහ සීමාසහිත එක්සත් ශ්‍රී ලංකා සමූපකාර ග්‍රාමීය බැංකු පදනමේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද කටයුතු කරන ආරියතිලක දහනායක මහතා ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.



කෝසල රත්නවීර මහතා
නීතීඥ - ප්‍රසිද්ධ නොතාරිස් , සාමදාන විනිශ්චකාර, නිල නොලත් මහේස්ත්‍රාත්, ධීවර සංස්ථා හිටපු අධ්‍යක්ෂක

කෝසල රත්නවීර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසට භාණ්ඩාගාර ලේකම්තුමා විසින් 2010 මැයි 24 වන දින පත්කල අතර ඔහු අධ්‍යක්ෂවරයෙකු ලෙස එම තනතුරේ මේ වන තෙක් කටයුතු කරයි. ඔහු ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නීතිඥයෙක් ලෙස කටයුතු කරයි. කෝසල රත්නවීර මහතා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.



තිලක් වන්නිගම මහතා
විද්‍යාවේදී (කළමනාකරණ)විශේෂ, විද්‍යාපති (නගර හා ග්‍රාම නිර්මාණ), නීතීඥ, ප්‍රසිද්ධ නොතාරිස් , සාමදාන විනිශ්චකාර, දිවුරුම් කොමසාරිස්.

භාණ්ඩාගාර ලේකම්තුමා විසින් 2007 ජූලි 04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තිලක් වන්නිගම මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසට පත්කරන ලදී. 2010 මැයි 07 වන දින ඔහු එම තනතුරෙන් ඉවත් වුවද ඔහු නැවත එම තනතුර සඳහා 2010 ජූලි 16 වන දින පත් කරන ලදී. තිලක් වන්නිගම මහතා අරමුදල් කළමනාකරණය පිළිබඳ උපදේශකයෙකු ලෙස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු සමූපකාර පදනමේ කටයුතු කරන අතරම සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගමේ නීති උපදේශකයෙකු ලෙසට ද කටයුතු කරයි. තිලක් වන්නිගම මහතා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.



ප්‍රියංග අල්ගම මහතා
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති - නන්යැන්ග් තාක්ෂණ විශ්ව විද්‍යාලය - සිංගප්පූරුව, එම් අයි ටී බොස්ටන් (ඇමරිකා), යාවජීව සාමාජික (ඒ එස් ඒ) සී පී ඒ (ඕස්ට්‍රේලියාව)

භාණ්ඩාගාර නියෝජිත ලෙස 2012 ඔක්තෝබර් 08 වැනි දින ප්‍රියංග අල්ගම මහතා අධ්‍යක්ෂක මණ්ඩලයට භාණ්ඩාගාර ලේකම් විසින් පත්කරන ලදී. ඔහු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාය. ඔහු ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ. ඔහු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක / අධ්‍යක්ෂක (2000 / 2007) වශයෙන් ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (2012) අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් ද කටයුතුකොට ඇති අතර Shared Services Queensland Government Australia (2008 - 2012) හි ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරියෙකි.



ඉදිගහවෙල ගමගේ පාලිත මහතා
වාණිජවේදී විශේෂ

පාලිත ගමගේ මහතා 2007 අප්‍රේල් මස 02 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසට භාණ්ඩාගාර ලේකම්තුමා විසින් පත්කරන ලදී. 2010 මැයි 07 වන දින එම තනතුරෙන් ඉවත් වූ අතර ඔහු නැවතත් 2010 ජූලි මස 15 වන දින සිට එම තනතුරට පත් කර ඇත. එතැන් සිට මේ වන තෙක් ඔහු මේ තනතුරේ කටයුතු කරයි. පාලිත ගමගේ මහතා ප්‍රමුඛ තැන්පත්කරුවන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා වන අතර සීමාසහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ තැන්පත්කරුවන් හා ණය හිමියන් පිළිබඳ උනන්දුවක් දක්වන්නෙකි. පාලිත ගමගේ මහතා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.



සනත් වීරතුංග මහතා

සනත් වීරතුංග මහතා බැංකුව ආරම්භ කල දින වන 2008 අප්‍රේල් මස 10 වන දින සිට 2011 අප්‍රේල් 25 වන දින දක්වා ක්‍රියාත්මක වන පරිදි බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන ලදී. ඉන්පසු ඔහු ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙසට පත්කරන ලදී. 1972 සිට 2006 දක්වා අවුරුදු තිහකට වැඩි කාලයක් මහජන බැංකුවේ කටයුතු කිරීම තුලින් ඔහු සතුව වටිනා අත්දැකීම් සමුදායක් පවතී. සනත් වීරතුංග මහතා ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂ වේ.



උඩුවගේ දොන් සුමිත් පරාක්‍රම පෙරේරා මහතා
නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්

මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා විසින් 2010 ජුනි 30 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කර ගන්නා ලදී. පොල් වගා මණ්ඩලය (2000 - 2002) , ලංකා විදුලි සමාගම (2006 - 2010) , සී/ස ලෙකෝ ප්‍රොජෙක් (පුද්) සමාගම (2008 - 2010) සහ සී/ස ඇන්ටි ලෙකෝ (පුද්.) සමාගම (2008 - 2010) යන ආයතනයන්හි අධ්‍යක්ෂක මණ්ඩලයේ සේවය කොට ඇත. සුමිත් පරාක්‍රම මහතා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.



එච්. ජී. සුමනසිංහ මහතා -(2013.10.24 දින පත් කරන ලදී.)
ව්‍යාපාර සන්නිවේදනය (විශේෂ) කොළඹ විශ්ව විද්‍යාලය
රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාපති (ඕස්ට්‍රේලියාව)

එච්. ජී. සුමනසිංහ මහතා 2013 ඔක්තෝබර් 24 දින භාණ්ඩාගාරයේ ලේකම් විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදී. ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා අතර ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකි.

(ආයතනික කළමනාකරණය)

අනවරත සේවා සම්පාදනය තුලින් ජයග්‍රහණ අත්පත්කර ගැනීම



නමොත්පාදනය,
කැපවීම හා
ජයග්‍රහන තුලින්
හැකියා ශක්තීන්
හඳුනා ගැනීම්





හේමප්‍රිය ඒඩ්රියන් වීරසේකර මහතා
එම්බීඒ (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය). ඒ අයි බී.
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

ඒඩ්රියන් වීරසේකර මහතා 2012.01.17 දින බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාරගත්තේය. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බැංකු කර්මාන්තය පිළිබඳව 20 වසරක් තුල මහත් දැනුම් සම්භාරයක් ඔහු අත්කරගෙන තිබේ. බැංකු මෙහෙයුම් ණය මූල්‍ය හා ආයතනික බැංකු කටයුතු මෙන්ම අවදානම් කළමනාකරණය පිළිබඳව ඔහුට මනා පරිචයක් ඇත.



කේ.ඒ.ටී.එම්. දමයන්ති මහත්මිය
එෆ් සී ඒ, එම් බී ඒ (දකුණු ක්වීන්ස්ලන්තය),
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී
මූල්‍ය සහ සැලසුම්



ජී. එම්. එස්. එන්. කේ ගුරුසිංහ මහතා
බී එස් සී ව්‍යාපාර පරිපාලණ (ශ්‍රී ජයවර්ධනපුර)
සීබීඑෆ් (අයිබීඑස්එල්)
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
මෙහෙයුම්



රොහාන් ඒ. ඒ. විජේසුන්දර මහතා
ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාධාරී
අනුකූලතා නිලධාරී



කේ. කේ. කේ. කීරවැල්ල මහතා
බී කොම් (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
එම් ඒ ඒ ටී
ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරී
(අයි බී එස් එල්)
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය)



එච්. වීරසේකර මහත්මිය
එම් බී ඒ (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
ඒ සී අයි එස් (එංගලන්තය)
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී
මානව සම්පත් හා ආයතනික



ජී. අයි. ආර්. විතානගේ මහතා
එම් බී සී එස්
ජ්‍යෙෂ්ඨ කළමනාකරු

කළමනාකරණ (අනාගත



කණ්ඩායම පොරොන්දුව





CSR 2013 ආයතනික සමාජ වගකීම

අනාගත අපේක්ෂාවන් මුදුන් පැමිණවීම හා අනාගතයට නව අරුතක් දීම



ආයතනික සමාජ වගකීම

අඩු ප්‍රතිලාභ භුක්ති විඳින ජනතාව අතර දරිද්‍රතාවය අඩු කෙරෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමෙහි ලා අප ඉටුකරන පුළුල් කාර්යභාරය සෙසු මූල්‍ය ආයතනවලට ආදර්ශයක් වී ඇති බව ප්‍රීතියෙන් සඳහන් කිරීමට කැමැත්තෙමු. අපගේ ආයතනික සමාජ වගකීම ආරම්භ කලේ ''ජන හදින් ජනිත'' යන අපගේ බැංකු මුද්‍රාමය තේමාව යටතේය.

මෙම පුළුල් පරාසය යටතේ ආධාර කිරීමට වඩා දිලිඳුකම පිටුදැකීම කෙරෙහි ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරකම සඳහා බැංකුව වඩාත් අවධානයක් යොමු කරමින් සිටිති. එනම් ආධාර මගින් මිනිසුන් තුල තම තමන්ගේ අනාගත අභිවෘද්ධිය ඇති කිරීමට දරන උත්සාහය සහ ඔවුන් තුල ඇති අභිප්‍රේරණය හීන වීම සිදු කරයි.













අනාගත අපේක්ෂාවන් මුදුන් පැමිණවීම හා අනාගතයට නව අරුතක් දීම





ශ්‍රී ලංකාව - සැමගේ නිවහන හා ආරක්ෂිත ස්ථානය

2013 සුවිශේෂී අවස්ථා

නමොත්පාදනය, කැපවීම හා ජයග්‍රහන තුලින් හැකියා ශක්තීන් හඳුනා ගැනීම.



මාතර ශාඛාව අතිගරු ජනාධිපතිතුමා විසින් විවෘත කිරීම



2013.02.10 දින බොරැල්ලේ ප්‍රධාන කාර්යාලයේදී පිරිත් සජ්ජායනා කිරීම



මන්නාරම ශාඛාව විවෘත කිරීමේ උත්සවය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජධීර, කර්මාන්ත වාණිජ අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මෙම අවස්ථාවට සහභාගි වූහ.



සී/ස ඉතිරි කිරීමේ බැංකුවේ මන්නාරම ශාඛාවේ සේවක පිරිස ප්‍රවර්ධන වැඩසටහනක නිරත වූ අවස්ථාවක්







2013 මාර්තු 22 දින මාතර ශාඛාව විවෘත කළ දිනයේදී ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම



බාලවයස්කාර තැන්පතු ගිණුම් හිමියෙකුට ත්‍යාග ප්‍රධානය කිරීම



අනුරාධපුර ශාඛාව විවෘත කිරීම බැංකුවේ සභාපති ආර්යතිලක දහනායක මහතා ඉදිරිපිට පැමිණ සිටි අමුත්තෙක් චිරාගත පොල්තෙල් පහන දැල්වීම





අනුරාධපුරය ශාඛාවේදී චිත්‍ර තරඟයේ ජයග්‍රාහකයින්ට ත්‍යාග බෙදා දීම



අනුරාධපුර පාසල්අත්පන්දු කණ්ඩායමට අනුග්‍රාහකත්වය ලබාදීම





එක්සත් බැංකු ක්‍රමයක් සඳහා වූ ගිවිසුමට එළඹීම

උකස් සේවාව ප්‍රධාන කාර්යාලයේදී ආරම්භ කරමින්

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ මහත් සතුටිනි.

ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

සභාපති තුමාගේ පණිවුඩය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ සාමාන්‍යාධිකාරීගේ / ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය මගින් 2013.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත්කොට තිබේ. මීට අමතර වශයෙන් වරලත් ගණකාධිකාරී ආයතනයක් වන SJMS Associates ආයතනය විසින් බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ඉදිරිපත් කරන ලද සම්පූර්ණ විස්තරයක් විගණන වාර්තාව තුළින් පිළිබිඹු කොට තිබේ.

බැංකුවේ නෛතික තත්ත්වය

මෙම බැංකුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපනය කොට අංක භ(ඡී) 1336 යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් වශයෙන් බැංකුවට බලපත්‍ර ප්‍රදානය කරන ලද අතර 2008 මාර්තු 10 වැනි දින බැංකුවේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කෙරිණි.

අධ්‍යක්ෂක මණ්ඩලය

සමාලෝචිත වර්ෂය තුළදී සී/ස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අධ්‍යක්ෂකවරුන් සත් දෙනෙකුගෙන් සමන්විතව 2013 ඔක්තෝබර් 24 දින තෙක් ක්‍රියාත්මක වූ අතර ඉන් ඉක්බිතිව අධ්‍යක්ෂකවරුන් අට දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක විය. සංගමික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂක මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලැබ තිබේ. අධ්‍යක්ෂක මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වතාවක් රැස්වන අතර ඒ අනුව 2013 වර්ෂයේදී 13 වතාවක් රැස්වීම් පවත්වා තිබේ. 2013 වර්ෂයේදී කටයුතු කළ අධ්‍යක්ෂකවරුන් පහත දැක්වේ.

ආරියතිලක දහනායක මහතා
ප්‍රියංග අල්ගම මහතා
කෝසල රත්නවීර මහතා
උඩුවගේ දොන් සුමිත් පරාක්‍රම මහතා
ඉදිගහවෙල ගමගේ පාලිත මහතා
සනත් වීරතුංග මහතා (ක්‍රියාකාරී අධ්‍යක්ෂ)
එච්. ජී. සුමනසිංහ මහතා (2013.10.24 දින පත්කරන ලදී)

නම	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගි වූ රැස්වීම් ගණන
ආරියතිලක දහනායක මහතා	13	13
ප්‍රියංග අල්ගම මහතා	13	12
කෝසල රත්නවීර මහතා	13	13
තිලක් වන්නිගම මහතා	13	13
උඩුවගේ දොන් සුමිත් පරාක්‍රම මහතා	13	10
ඉදිගහවෙල ගමගේ පාලිත මහතා	13	13
සනත් වීරතුංග මහතා	13	10
එච්. ජී. සුමනසිංහ මහතා (2013.10.24 දින පත්කරනු ලැබූ)	පත්වීමේ දින සිට 03	03

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂක වරුන්ගේ සම්බන්ධතා

මූල්‍ය ප්‍රකාශනයන්හි 34 වැනි සටහන මගින් හෙලිදරව්කොට ඇති පරිදි හැර බැංකුව සමග කිසිදු සෘජු හෝ වක්‍ර ගිවිසුම් සම්බන්ධතාවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තු සමග අධ්‍යක්ෂකවරුන්ගේ සම්බන්ධතාවක් නොමැත.

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම දරයි. තවද බැංකුව විසින් සියලු ගණුදෙනු පිළිබඳව විධිමත් ලෙස ගිණුම් පොත් පවත්වා ගැනීම සහ අදාළ වර්ෂය තුළ බැංකුවේ කටයුතු පිළිබඳව හා ලාභ/අලාභ සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු වන අයුරු මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම යන කරුණු සම්බන්ධයෙන් සහතික වීමේ වගකීම ද ඔවුන් වෙත පැවරී තිබේ. තමන් සහභාගී වන ක්‍රමික සැසිවාර සමාලෝචන හා විගණන කමිටු වාර්තා හරහා කෙරෙන මූල්‍ය වාර්තා කිරීම්වලදී අධ්‍යක්ෂක මණ්ඩලය තම කළමනාකරණ වගකීම් අධීක්ෂණය කරති.

අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධති

බැංකු කටයුතු නිසි පිළිවෙලට ක්‍රියාත්මක කිරීම උදෙසා මූල්‍ය මෙහෙයුම් කටයුතු අනුකූලතාව හා අවදානම් කළමනාකරණය යන දෑ වෙනුවෙන් ඵලදායී හා ප්‍රළුල් ක්‍රම පද්ධතියක් ඇති කිරීම පිණිසද බැංකුවේ වත්කම් හා වගකීම් ආරක්ෂා කිරීම, වාර්තාවන්හි විශ්වාසනීයත්වය මෙන්ම ඒවාගේ නිරවද්‍යතාවය සහතික කිරීම පිණිසද අධ්‍යක්ෂක මණ්ඩලය ප්‍රයත්න දරා තිබේ.

ආයතනික පාලනය

ආයතනික පාලනය අනුගමනය කිරීම සහතික කරනු වස් ක්‍රම පද්ධති හා ක්‍රියාපරිපාටීන් ක්‍රියාත්මක කෙරේ. මේ සම්බන්ධයෙන් ගනු ලැබූ විශේෂිත ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අංක 40 දරන පිටුවේ විස්තර කොට ඇත.

විගණන කමිටු

මණ්ඩලයේ පහත දැක්වෙන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් මණ්ඩලයේ විගණන කමිටුවේ සාමාජිකයන් ලෙස ක්‍රියා කළහ. විගණන කමිටුවේ වාර්තාව 74 වැනි පිටුවේ දැක්වේ.

ප්‍රියන්ත අල්ගම මහතා - සභාපති
තිලක් වන්නිගම මහතා - අධ්‍යක්ෂ
කෝසල රත්නවීර මහතා - අධ්‍යක්ෂ

තිලක් වන්නිගම මහතා 2013 ඔක්තෝබර් 28 වැනි දින දක්වා විගණන කමිටුවේ සේවය කළේය. එච්. ජී. සුමනසිංහ මහතාව 2013 නොවැම්බර් 25 දින විගණන කමිටුවට පත්කරන ලදී.

දැක්ම, මෙහෙවර හා ආයතනික චර්යාව

බැංකුවේ දැක්ම හා මෙහෙවර මෙම වාර්තාවේ 07 වැනි පිටුවේ දක්වා ඇත. බැංකුවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා බැංකුවේ ව්‍යාපාරික කටයුතු ප්‍රශස්ත සදාචාරාත්මක මට්ටමකින් සිදු කරන ලදී.

විගණකයින්

වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශ SJMS වරලත් ගණකාධිකාරී සමාගම විසින් විගණනය කරන ලදී. විගණකයින් පත්කිරීම අනුමත කිරීම පිළිබඳ යෝජනාව වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරන ලදී.

කාර්ය මණ්ඩලය

2013 දෙසැම්බර් මස 31 දින වන විට බැංකුව විසින් සේවයේ යොදවා තිබූ සේවක සංඛ්‍යාව අනුවක් (90) විය. මෙම සංඛ්‍යාව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී	1
සහකාර සාමාන්‍යාධිකාරී	-
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	6
කළමනාකරුවන්	4
ශාඛා කළමනාකරු	1
නියෝජ්‍ය කළමනාකරු	3
සහකාර කළමනාකරු	5
ණය නිලධාරී	5
ණය ආපසු අයකර ගැනීමේ නිලධාරී	1
කළමනාකරණ අභ්‍යාසලාභීන්	5
ජ්‍යෙෂ්ඨ බැංකු සහකාර	5
ලේකම්	3
බැංකු සහකාර	31
නීති සහකාර	1
පිළිගැනීමේ නිලධාරී	1
ජ්‍යෙෂ්ඨ රියදුරු	1
රියදුරු	5
ජ්‍යෙෂ්ඨ කාර්යාල සහායක	1
කාර්යාල සහායක	4
කම්කරු	1
භාරකරු	3
අභ්‍යාසලාභීන්	3
මුළු ගණන	90

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා සාමාන්‍යාධිකාරී වන අතර ඔහු/ ඇය පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂක මණ්ඩලය විසිනි. සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම්වලට සහභාගි වන්නේ ආරාධනයෙනි.

ක්‍රියාත්මක වන සමාගමක්

ඉදිරි අනාගත කාල සීමාව තුල තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා බැංකුව සතුව ප්‍රමාණවත් තරම් සම්පත් තිබෙන බවට බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය සැහීමකට පත්ව සිටී. ඒ අනුව, දිගින් දිගට ක්‍රියාත්මක වෙමින් පවතින සමාගමක් යන සංකල්පය මත පිහිටා මූල්‍ය ප්‍රකාශ පිළියෙලකොට ඇත.

මූල්‍ය ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති, 1988 අංක 30 දරන බැංකු පනත හා ඊට වූ සංශෝධන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලවන අයුරින් හා දිගින් දිගට ක්‍රියාත්මකව පවතින සමාගමක්ය යන සංකල්පය මත පදනම්ව බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට තිබේ. මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කිරීමේදී අවශ්‍ය තන්හි සාධාරණ හා විවක්ෂණ තීරණ හා තීන්දුවලට එළඹී තිබේ.

(මිලියන)

අවසන් වූ වර්ෂය	31.12.2012 (රුපියල්)	31.12.2013 (රුපියල්)
බද්දට පෙර ලාභය	592	551
බදු අයකිරීම	(167)	12
බද්දට පසු ලාභය	425	563
රඳවාගත් ලාභ/ (පාඩු) (ඉදිරියට ගෙනා)	2,825	2,325
විසර්ජනය සඳහා ඇති ලාභ	425	563
අධ්‍යක්ෂක වරුන් විසින් සංචිතයට පහත සඳහන් විසර්ජන සිදුකොට ඇත.	(25)	(132)
ඉදිරියට ගෙනා රඳවාගත් බදු	1894	2825

ආදායම

2013 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සමස්ත දළ ආදායම රුපියල් මිලියන 1004 ක් විය. ආදායම් විශ්ලේෂණය ගිණුම් සටහන් අංක 05 හි දක්වා ඇත.

ප්‍රාග්ධන වියදම්

දේපොළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම් වෙනුවෙන් වර්ෂය තුලදී දරන ලද මුළු වියදම රුපියල් මිලියන 23කි. ගිණුම් සටහන්වල අංක 85 දරන පිටුවෙහි ඒ පිළිබඳ විස්තර දැක්වේ.


ව්‍යවස්ථාපිත ගෙවීම්

තම දැනුම හා විශ්වාසයට අනුව රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ල නියමිත කාලයන් තුළ ගෙවා ඇති බවට අධ්‍යක්ෂකවරුන් සැහීමකට පත්ව සිටිති.

පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ගිණුම්වල ගැලපීම් හෝ පැහැදිලි කිරීම් සිදුකලයුතු සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයෙන් පසුව උද්ගත වී නැත.

මණ්ඩලයේ නියමය පරිදි



වයි. එම්. ජේ. ප්‍රනාන්දු
මණ්ඩලයේ ලේකම්
ශ්‍රීලංකා ඉතිරිකිරීමේ බැංකුව

දිනය : 2014.09.01
කොළඹදීය.

ආයතනික පාලනය

බැංකුවේ සියළු මෙහෙයුම් අංශ සම්බන්ධයෙන් යහපත් ආයතනික පාලනයක් ඇති කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. තවද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා මහබැංකුව හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නියෝග හා මාර්ගෝපදේශ තුළින් නිර්දේශිත පරිචයන් භාවිතා කිරීමට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව පියවර ගෙන ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක නොවන අධ්‍යක්ෂක වරුන් 7 දෙනෙකුගෙන් සහ එක් විධායක අධ්‍යක්ෂක වරයෙකුගෙන් සමන්විත විය. බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සමස්ත වගකීම පැවරී ඇත්තේ මෙම අධ්‍යක්ෂක මණ්ඩලයටය. මේ සම්බන්ධයෙන් ගත්කල බැංකුවේ මෙහෙයුම් කටයුතු සඵලදායී හා කාර්යක්ෂම අයුරින් මෙහෙයවනු ලැබීම හා පාලනය කරනු ලැබීම සහතික කරනුවස් ක්‍රම පද්ධති හා ක්‍රියාපරිපාටීන් පාලනාධිකාරිය විසින් ඇතිකොට තිබේ. ක්‍රමෝපායීය ඉලක්ක සැකසීමත්, අවශ්‍ය නායකත්වය සලසා දීමත් වාර්තා කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත් යන පියවර තුලින් පාර්ශ්වකරුවන්ගේ වගකීම් සම්බන්ධයෙන් වගවීම සහතික තොට තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් මසකට වරක් පැවැත්වෙන අතර අවශ්‍ය වුවහොත් විශේෂ රැස්වීම් පැවැත්වේ. 2013 වසර තුලදී රැස්වීම් වාර 13 ක් පැවැත්විණි. අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්, දැන්වීම් සහ න්‍යාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් සභාපති සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීගේ අදහස් විමසා පිළියෙල කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව දැනුම්දීම් සිදුකෙරෙන්නේ යටත් පිරිසෙයින් ඒවා පැවැත්වීමට දින 7කට කලිනි. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන්හි ඇතුලත් වන අතර රැස්වීම පැවැත්වීමට දින 7කට පෙරාතුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතර ඒවා බෙදා හරිනු ලැබේ. අවසන් තීරණයකට එළඹීමට පෙර අධ්‍යක්ෂක වරුන් විසින් මෙකී තොරතුරු සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂක මණ්ඩලයේ සියලු යෝජනා සම්මතයන් හා තීරණ මණ්ඩලයේ ලේකම් විසින් වාර්තාගත කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පමණක් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග හා මාර්ගෝපදේශ අනුව පාලනාත්මක තීරණ ගැනීම සඳහා අධිකාරී බලය පැවරී ඇත්තේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී වෙතය.

ආයතනික සැලසුම සහ අයවැය

ආයතනික පාලනය පිළිබඳ කටයුතු ඉටුකිරීම උදෙසා පුළුල් ආයතනික සැලැස්මක් සහ අයවැයක් අත්‍යාවශ්‍ය බව අධ්‍යක්ෂක මණ්ඩලය විශ්වාස කරයි. මෙමගින් බැංකුවේ ශක්තීන්, දුර්වලතාවන්, ප්‍රස්ථාවන් සහ එල්ල වී ඇති අභියෝගයන් හඳුනා ගැනීමට පාලනාධිකාරියට හැකියාව ලැබේ. තවද එම නිසා බැංකුවට තම කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු හඳුනා ගැනීමට මෙන්ම ඒවා සාක්ෂාත් කරගැනීමට හැකියාව ලැබේ.

සියලු මට්ටම්වලදී වගවීම

ඵලදායී ලෙස ආයතනික පාලනයක් සාක්ෂාත් කරගැනීම සඳහා සෑම මට්ටමකදීම කාර්ය මණ්ඩලය විසින් කැපවීම තුලින් වගවීම අවශ්‍යයය. එමෙන්ම, තමන්ට පැවරී ඇති විවිධ කාර්යයන්ට අදාළ වගකීම් මොනවාද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලය සෑම මට්ටමකදීම දැනුවත් කළ යුතුය.

මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කිරීම සිදුකොට ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද ජාතන්තර මූල්‍ය රෙගුලාසි (IFR) ප්‍රමිතීන්ට අනුකූලවය.

මෙම වාර්තාවේ ඇතුලත් 2013 වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශ (පිටු අංක 81 සිට 120 දක්වා) බැංකුවේ ගිණුම් පොත් වලින් උපුටා ගන්නා ලදී. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ජාතන්තර මූල්‍ය රෙගුලාසි (IFR) සහ ප්‍රමිතීන්හි දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති මත පදනම් වී ඇත.

විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර එහි මූලික අරමුණ වන්නේ බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම, පාලනාත්මක අනුකූලතාවය, මූල්‍ය වාර්තාකරණය හා විගණනය යන කරුණු සම්බන්ධයෙන් අධියකක්ෂ මණ්ඩලය සහය වීම වේ .

වාර්තා ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන්නේ අභ්‍යන්තර විගණන කළමනාකරු විසිනි. විගණකවරුන් විසින් නිකුත් කරනු ලබන කළමණාකරණ වාර්තාව විගණන කමිටු රැස්වීමේදී සවිස්තරාත්මකව සාකච්ඡා කරනු ලැබේ. 2013 වර්ෂයේදී ත්‍රිමාසික විගණන කමිටු රැස්වීම් හතරක් (4) ක් පවත්වන ලදී.

ආයතනික පාලනය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙක් , සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අයත්වේ. තවද ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා යාවත්කාලීන කළ සැලසුම් ඇතුළු සියළු අවදානම් කළමනාකරණ අංග ඇගයීම පිණිස කමිටුව විසින් ත්‍රෛමාසික රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලබන අතර සමාලෝචන වර්ෂය තුලදී මෙවැනි රැස්වීම් වාර 4 ක් පවත්වන ලදී.

වත්කම් හා වගකීම් කමිටුව

මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ මෙම කමිටුවට බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සහ අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුලත් වන අතර අවශ්‍ය ආකාරයට හා අවශ්‍ය විටෙක රැස්වේ.

මෙම කමිටුව විසින් ආයතනික සැලැස්ම වාර්ෂික අයවැය සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර අයවැය අනුව බැංකුවේ ප්‍රතිඵල අන්වේෂණය කරනු ලබයි. අතිරික්ත අරමුදල් ආයෝජන සමාලෝචනය කර නිර්දේශ කිරීම, නිමැවුම්වල මිල නියම කිරීම සහ ප්‍රාග්ධන වියදම් ආදිය සමාලෝචනය කර නිර්දේශ කිරීමද මෙමගින් සිදුකරනු ලබයි. 2013 වර්ෂය තුලදී වත්කම් හා වගකීම් කමිටුව විසින් රැස්වීම් වාර 06ක් පවත්වන ලදී.

මානව සම්පත් ගෙවීම් කමිටුව

මෙම කමිටුවට අධියගක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙක් ඇතුළත් වේ. සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයේ වැටුප් කමිටු රැස්වීම් වාර 45 තුලදී සමාලෝචනය කරනු ලැබ ඇත. 2013 වර්ෂය තුලදී මානව සම්පත් වැටුප් කමිටුව රැස්වීම්වාර 10ක් පවත්වා ඇත.

ප්‍රියංග අල්ගම මහතා	- සභාපති
සුමිත් පරාක්‍රම පෙරේරා මහතා	- අධ්‍යක්ෂක
පාලිත ගමගේ මහතා	- අධ්‍යක්ෂක

වැටුප් කමිටුව ලෙස මෙම කමිටුව එකම අධ්‍යක්ෂ වරුන්ගෙන් සමන්විත වේ. සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයේ පත්වීම් මෙම කමිටුව මගින් සමාලෝචනය කරනු ලබයි. අවශ්‍යතාව අනුව මෙම කමිටු ඒ ඒ අවස්ථාවලදී රැස්වේ.


ප්‍රසම්පාදන කමිටු

මෙම කමිටුවට සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, සහ 2013 අප්‍රේල් 01 දක්වා සේවය කර ඉවත්වූ භාණ්ඩාගාර නියෝජිත ප්‍රියන්ත අල්ගම මහතා ඇතුළු අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු අයත් විය. අල්ගම මහතා වෙනුවට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් ආර්. එච්. එම්. අජිත් චන්ද්‍ර මහතා නම් කරන ලදී. සාමාජිකත්වයට සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු සහ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් කළමනාකරු ඇතුළත් විය. රුපියල් 100,000/= වැඩි සියළු ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන්නේ මෙම කමිටුව විසිනි. 2013 වර්ෂයේදී ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 10ක් පවත්වන ලද අතර ප්‍රියන්ත අල්ගම මහතා මුල් රැස්වීමට පමණක් සහභාගි වන්නට යෙදුනේ ඔහුගේ ඉවත්වීම නිසා ආර්. එච්. එම්. අජිත් චන්ද්‍ර මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නම් කරන ලද බැවිනි.

ව්‍යාපාරික අවදානම්

බැංකුවේ මෙහෙයුම් කටයුතු ආශ්‍රිතව පැන නැගෙන ව්‍යාපාරික අවදානම් ක්‍රමික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන අතර එබඳු අවදානම් අඩුකිරීම සඳහා යෝග්‍ය පියවර ගනු ලබයි. අනිවාර්ය බැංකු හා ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව කටයුතු කෙරෙන්නේදැයි අන්වේෂණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමින් සිදුකෙරේ.

මණ්ඩලයේ නියමය පරිදි
වයි. එම්. ජේ. ප්‍රනාන්දු
අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම්



දිනය : 2014.09.01
කොළඹ.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(1) මණ්ඩලයේ වගකීම්	
3(1)(1) පහත දැක්වෙන දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මගින් මණ්ඩලය බැංකුවේ ආරක්ෂාව හා ස්ථීරසාරභාවය ශක්තිමත් කළ යුතුය.	
(අ) බැංකුවේ ක්‍රමෝපායීය අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීම සහ ඒවා බැංකුව පුරා සන්නිවේදනය කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ආ) සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ පරිපාටීන් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා මාපනය කළ හැකි ඉලක්ක සහිත යාන්ත්‍රණ ඇතුළු බැංකුවේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය අනුමත කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ඇ) ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ බුද්ධිගෝචර අයුරින් අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍යාකාරයේ ක්‍රම පද්ධති ක්‍රියාවේ යෙදවීම සහතික කිරීම.	අනුකූලව කටයුතු කර තිබේ.
(ඈ) තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස් හිමියන් සහ ණයගැනුම්කරුවන් ඇතුළු සියලු පාර්ශවකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ඉ) බැංකුවේ අභ්‍යන්තරික පාලන ක්‍රම පද්ධතිවල හා කළමනාකරණ තොරතුරු ක්‍රම පද්ධතිවල ප්‍රමාණවත් බව හා ඒකාග්‍රතාව සමාලෝචනය කිරීම.	අනුකූලව කටයුතු කර තිබේ.
(ඊ) අභ්‍යන්තර විගණන ප්‍රමිතීන්හි නිර්වචනය කර ඇති පරිදි පහත දැක්වෙන දෑ සඳහා හැකියාවන් ඇති ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනා ගැනීම හා නම් කිරීම. (i) ප්‍රතිපත්ති කෙරෙහි කැපී පෙනෙන ලෙස බලපෑම් කිරීමට හැකිවීම. (ii) ක්‍රියාකාරකම් සඳහා විධානය කළ හැකිවීම. (iii) ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය පාලනය කළ හැකි වීම	
(උ) අධ්‍යක්ෂක මණ්ඩලයේ හා ප්‍රධාන කළමනාකරුවන්ගේ අධිකාරී බල ක්ෂේත්‍රයන් හා ප්‍රධාන වගකීම් අර්ථ කථනය කිරීම.	අනුකූලව කටයුතු කර තිබේ.
(ඌ) ප්‍රධාන කළමනාකරුවන්ගේ පිරිස් විසින් බැංකුවේ කටයුතු පිළිබඳ විධිමත් ලෙස අධීක්ෂණයක් පවතින බව සහතික කිරීම.	අනුකූලව කටයුතු කර තිබේ.
(එ) පහත දැක්වෙන කරුණු ඇතුළත්ව අධ්‍යක්ෂක මණ්ඩලයේ පාලන පරිචයන් වල කාර්යක්ෂමතාවය කලින් කලට අගැයීම. (i) අධ්‍යක්ෂක මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරවන්, තෝරා ගැනීම, නාමයෝජනා ඉදිරිපත් කිරීම හා තෝරා පත් කර ගැනීම. (ii) මත ගැටුම් කළමනාකරණය ; සහ (iii) දුර්වලතා හඳුනා ගැනීම හා අවශ්‍ය තන්හි දී සංශෝධන සිදුකිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ඒ) ප්‍රධාන කළමනාකරුවන් සඳහා යෝග්‍ය අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුවට ඇති බව සහතික කිරීම.	බොහෝ ප්‍රධාන තනතුරු සඳහා සුදුසු පිරිස් හඳුනාගෙන ඇති අතර අනුප්‍රාප්තික සැලැස්ම පිළියෙල කෙරෙමින් පවතී.
(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම හා ආයතනික අරමුණු සම්බන්ධයෙන් ප්‍රගතිය අන්වේෂණය කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ඕ) පාලනාත්මක පරිසරය අවබෝධ කරගැනීම සහ බැංකු නියාමකයින් සමග ඵලදායී සම්බන්ධතා පවත්වා ගන්නා බව සහතික කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
(ක) බාහිර විගණකයින් යොදා ගැනීම හා ඔවුන් අධීක්ෂණය කිරීමේදී අනලස්ව කටයුතු කිරීම.	
3(1) (ii) මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නියෝග මාලාවේ 3(5) නියෝගය ප්‍රකාරව නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම කළ යුතුය.	මණ්ඩලය විසින් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත්කොට ඔවුන්ගේ නිලයන්ට අදාල කාර්යයන් හා වගකීම් අනුමතකොට තිබේ.

	ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(1) (**iii**)	මණ්ඩලය ක්‍රමිකව රැස්විය යුතු අතර අඩු තරමින් මාසයකට වරක් බැගින් දොලොස් වරක්වත් රැස්වීම් පැවැත්විය යුතුය. මෙම රැස්වීම්වලට අධ්‍යක්ෂක වරුන්ගේ බහුතරයක සක්‍රීය සහභාගිත්වය තිබිය යුතුය. චක්‍ර ලේඛන, ලිඛිත යෝජනා / පත්‍රිකා බෙදාහැරීම මගින් මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීමෙන් හැකිතාක් දුරට වැලකිය යුතුය.	මණ්ඩල රැස්වීම් ක්‍රමිකව පැවැත්වෙන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතා ඇතිවන ආකාරයට ඒ ඒ අවස්ථාවන්හිදී නියම කෙරේ.
3(1) (iv)	ක්‍රමිකව පැවැත්වෙන මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට බැංකුවේ ප්‍රවර්ධනය, අවදානම් කළමනාකරණයට අදාළ කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂක වරුන්ට හැකිවනසේ විධිවිධාන සලස්වා ඇති බවට මණ්ඩලය සහතික විය යුතුය.	ක්‍රමිකව පැවැත්වෙන රැස්වීම්වල න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමට හැකිවන සේ වර්ෂාරම්භයේදීම මාසික රැස්වීම් නියමකොට මණ්ඩලය දැනුම් දෙනු ලැබේ.
3(1) (v)	සියළු අධ්‍යක්ෂවරුන්ට සහභාගිවිය හැකි වන සේ ක්‍රමික මණ්ඩල රැස්වීම් පැවැත්වීම පිළිබඳව අවම වශයෙන් දින 07ක දැන්වීමක් කළ යුතුවීම අධ්‍යක්ෂක මණ්ඩල ක්‍රියාපරිපාටියෙන් සහතික විය යුතුය. සෙසු සියළු මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ දැනුම්දීමක් සිදුකළ යුතුය.	කලින් රැස්වීම දින සිට දින 07ක් ඉක්මගිය පසු රැස්වීම් සඳහා දැන්වීමක් කරනු ලැබේ. න්‍යාය පත්‍රය හා මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින 05කට කලින් අධ්‍යක්ෂකවරුන්ට දෙනු ලබන්නේ ඒවාට සහභාගී වීමට හා හදිසි යෝජනාවන් ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිසය.
3(1) (vi)	අධ්‍යක්ෂක මණ්ඩලයේ ක්‍රියාපරිපාටියට අනුව අධ්‍යක්ෂකවරයෙක් රැස්වීම්වලින් තුනෙන් දෙකකට පූර්වාසන්න දොලොස් මාසයන් තුළ අනුගාමී රැස්වීම් 03 කට සහභාගී නොවිනි නම් හෙතෙම තවදුරටත් අධ්‍යක්ෂකවරයෙක් සේ නොසැලකිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලට විකල්පමය අධ්‍යක්ෂවරයෙක් හරහා සහභාගි වීම සහභාගිවීමක් ලෙස පිළිගත හැකිය.	අධ්‍යක්ෂ වරුන්ගේ පැමිණීම් ආයතනික පාලන නීති සංග්‍රහය ප්‍රකාරව ඇගයීමකට ලක් කරනු ලැබේ. කිසිදු අධ්‍යක්ෂකවරයෙක් 03 වරක් අනුගාමීව රැස්වීම්වලට නොපැමිණ නැත. සියලු අධ්‍යක්ෂකවරුන් වර්ෂයේ රැස්වීම් වාර 2/3කට වඩා සහභාගි වී ඇත.
3(1) (vii)	1988 අංක 30 දරන බැංකු පනතේ 76 H වගන්තිය සමග කියැවිය යුතු 43 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂක මණ්ඩලයේ හා කොටස් හිමියන්ගේ රැස්වීම්වල ලේකම් කටයුතු කිරීමට හා ව්‍යවස්ථාවන් හා සෙසු රෙගුලාසි මගින් නියමකොට ඇති කටයුතු ඉටු කිරීම සඳහා සමාගම් ලේකම්වරයෙක් මණ්ඩලය විසින් පත් කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තිය ප්‍රකාරව වෙසෙසින්ම අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් කටයුතු කිරීම සඳහා පත්කරනු ලැබ ඇත.
3(1) (viii)	මණ්ඩලීය ක්‍රියාපරිපාටීන් හා අදාළ සියලු නීති රීති හා රෙගුලාසි අනුගමනය කරන්නේද යන්න සහතික කිරීමෙහිලා සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සම්බන්ධයෙන් සියලු අධ්‍යක්ෂකවරුන්ට ප්‍රවේශයක් තිබිය යුතුය.	මණ්ඩලයේ ක්‍රියාපරිපාටීන්, නීතිරීති කටයුතු පසු විපරම් කිරීම, රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය, බැංකුවේ වාර්තා පවත්වා ගැනීම පිළිබඳ වගකීම පැවරී ඇති සමාගම් ලේකම් වෙත අධ්‍යක්ෂක වරුන්ට ප්‍රවේශයක් ඇත.
3(1) (ix)	ලේකම් විසින් අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා පවත්වාගත යුතු අතර ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුට එම වාර්තා සාධාරණ කාලයක් තුළ සාධාරණ දැනුම් දීමකින් පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතුය.	ලේකම් විසින් සියලු මණ්ඩල වාර්තා පවත්වාගෙන යනු ලබන අතර ඒවා අධ්‍යක්ෂක

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
	මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට බෙදාහරිනු ලැබේ. එසේම පසුගිය මණ්ඩල පත්‍රිකා හා වාර්තා ලේකම් හරහා ලබා ගැනීමේ හැකියාවද අධ්‍යක්ෂකවරුන්ට තිබේ.
3(1) (x) තම කාර්යයන් නිසි සැලකිල්ලෙන් හා අනලස්ව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉටු කළේද යන්න පිළිබඳව දැන ගැනීමට හැකිවන පරිදි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා ගත කළ යුතුය. මෙම වාර්තා අධ්‍යක්ෂක මණ්ඩලවලදී ගන්නා ලද තීරණවල සාරානුකූල භාවය තක්සේරු කිරීමට පාලන හා අධීක්ෂණ අධිකාරීන්ට හැකිවන යොමුවක් සේ පැවතිය යුතුය. (අ) මණ්ඩලය විසින් තීරණ ගැනීමේදී භාවිතා කරන ලද දත්ත හා තොරතුරු සාරාංශය. (ආ) මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු (ඇ) අධ්‍යක්ෂක මණ්ඩලය තම රාජකාරී නිසි සැලකිල්ලෙන් යුක්තව හා අනලස්ව ඉටුකරමින් සිටින්නේද යන වග තහවුරු කරගැනීම්වස් කරුණු සෙවීම, සාකච්ඡා පැවැත්වීම හා විසංමිතික ගැටළු. (ඈ) මණ්ඩලයේ ක්‍රමෝපායයන් හා අදාළ නිතීරීති හා රෙගුලාසි කෙරෙහි අදාළ විධායක නිලධාරීන්ගේ අනුකූලභාවය පිළිබිඹුවන සාක්ෂි හා තහවුරු වීම්. (ඉ) බැංකුවට මුහුණදීමට තිබෙන අවදානම් පිළිබඳව මණ්ඩලයේ අවබෝධය හා යොදා ඇති අවදානම් කළමනාකරණ පියවර පිලිබඳ විස්තරයක් ; සහ (ඊ) තීරණ හා මණ්ඩලයේ යෝජනා සම්මත	රැස්වීම්වලට වාර්තාවන්ට ඇතුළත් වන දේ නම් : (අ) මණ්ඩලය විසින් තීරණ ගැනීමේදී භාවිතා කරන ලද දත්ත හා තොරතුරු සාරාංශය. (ආ) මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු (ඇ) මණ්ඩලයේ උප කමිටු වල වාර්තා ඇතුළු තීරණ හා මණ්ඩලයේ තීරණ.
3(1) (xi) සාධාරණ ඉල්ලීමක් මත යෝග්‍ය අවස්ථාවන්හිදී බැංකුවේ වියදමින් අධ්‍යක්ෂකවරුන්ට වෘත්තීමය උපදෙස් ලබාගැනීමට අවස්ථාව ලැබෙන පරිදි මණ්ඩලය මගින් එකඟ වූ ක්‍රියාපරිපාටියක් තිබිය යුතුය. බැංකුවට තම රාජකාරී ඉටුකිරීම පිණිස අදාළ අධ්‍යක්ෂකවරයාට / අධ්‍යක්ෂකවරුන්ට සහාය වනු පිණිස ස්වාධීන වෘත්තීය උපදෙස් වෙන් වෙන් වශයෙන් ලබා ගැනීම සඳහා මණ්ඩලය යෝජනා සම්මත කළ යුතුය.	තමන්ගේ වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂකවරුන්ට අවශ්‍ය පරිදි හා අවශ්‍ය විටෙක ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත හැකිය.
3(1) (xii) අධ්‍යක්ෂකවරුන් තම කටයුතු ඉටුකිරීමේදී වෙනත් සංවිධාන හෝ පාර්ශ්වයන් සමඟ බැඳියාවන් පිළිබඳ ගැටළු ඇති නොකර ගත යුතුය. කිසියම් අධ්‍යක්ෂක වරයෙකුට මණ්ඩලය විසින් සලකා බැලිය යුතු කරුණක් පිළිබඳව වගකීම් සම්බන්ධ ගැටළුවක් තිබේ නම් හා එය වැදගත් කරුණක් සේ මණ්ඩලය සලකනු ලැබේ නම්, එම ගනුදෙනුව පිළිබඳ වැදගත් බැඳියාවක් නොමැති විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් සහභාගි වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී (3(2)(සඩ) නියෝග ප්‍රකාරව පවත්වන) එකී කරුණු සලකා බැලිය යුතුය. තවද මණ්ඩලය විසින් කරනු ලබන එවන් යෝජනාවකට සම්බන්ධ අධ්‍යක්ෂවරයෙකුට ඡන්දය දීමෙන් වැලකිය යුතු අතර ඔහුගේ ඡන්දය අදාළ න්‍යාය පත්‍රයේ ගණපූරණයට අවශ්‍ය සංඛ්‍යාවට ගණන් නොගත යුතුය.	2007 ආයතනික පාලන නියෝග අංක 11 අනුව, බැඳියාවන් පිළිබඳ ගැටළු වලදී ඔවුන්ගේ වගකීම් මොනවාදැයි යන්න පිළිබඳව අධ්‍යක්ෂකවරු අවබෝධයෙන් සිටිති.
3(1) (xiii) බැංකුවේ නියමයන් හා පාලනය ඉඳුරාම එහි අධිකාරී බලයට යටත් බව සහතික කෙරෙන අයුරින් මණ්ඩලයට තීරණ ගැනීම සඳහා විශේෂයෙන්ම එයටම වෙන්වූ විධිමත්ව උපලේඛණ ගත කරන ලද කරුණු ඇතුලත් ලේඛණයක් තිබිය යුතුය.	බැංකුවේ නියමයන් හා පාලනය ඉඳුරාම එහි අධිකාරී බලයට යටත් බව සහතික කෙරෙන සේ පාලනාත්මක නීති සංග්‍රහයන්, මාර්ගෝපදේශ හා ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුව මණ්ඩලයට තීරණ ගැනීම සඳහා එයටම විශේෂිත වූ කරුණු ඇතුලත් උපලේඛණයක් තිබේ.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(1) (xiv) බැංකුව ස්වකීය බැඳියාවන් ඉටුකිරීමට අපොහොසත් වේ නම් හෝ එසේ වීමට ඉඩ තිබෙන බව මණ්ඩලය අදහස් කරයි නම් හෝ බැංකුව බංකොලොත් (බුන්වත්) වීමට ආසන්න වී තිබේ නම් හෝ තැන්පත්කරුවන්ට සහ වෙනත් ණය හිමියන්ට කළයුතු ගෙවීම් නතර කිරීමට සැරසේ නම් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ බව වහාම බැංකු අධ්‍යක්ෂක වෙත දැන්විය යුතුය.	බැංකුව බුන්වත් බවට පත්වේ නම් ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රථම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්වීමේ අවශ්‍යතාවය දනී.
3(1) (xv) ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයට සහ අනෙකුත් බුද්ධිගෝචර කරුණු වලට අනුව මූල්‍ය මණ්ඩලය විසින් නියම කරන ලද මට්ටම්වලට බැංකුව ප්‍රාග්ධනීකරණය කර ඇති බවට මණ්ඩලය සහතික විය යුතුය.	මාසික පදනමක් මත මණ්ඩලය විසින් ප්‍රාග්ධන ප්‍රමාණවත් බව හා අනෙකුත් බුද්ධිගෝචර පාලනාත්මක නියමතාවන් අන්වේෂණය කරනු ලැබේ. බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාත්මක වේ.
3(1) (xvi) මෙකී නියෝගයන්හි අංක 3 දරන නියෝගයට අනුකූල වෙමින් බැංකුව විසින් තම වාර්ෂික වාර්තාව තුල ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කල යුතුය.	බැංකුවේ වාර්ෂික වාර්තාව තුල ආයතනික පාලන වාර්තාව බැංකුව විසින් ප්‍රකාශයට පත් කරයි.
3(1) (xvii) එක් එක් අධ්‍යක්ෂකවරයා විසින් වාර්ෂිකව ස්වයං තක්සේරුවක් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් මණ්ඩලය විසින් භාවිතා කළ යුතු අතර එකී වාර්තා පවත්වා ගැනීම කළ යුතුය.	එක් එක් අධ්‍යක්ෂකවරයා විසින් වාර්ෂිකව ස්වයං තක්සේරුවක් කිරීම සඳහා යෝජනා ක්‍රමයක් මණ්ඩලය විසින් භාවිතා කර ඇති අතර එම වාර්තා මණ්ඩලයේ ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබේ.
3(2) මණ්ඩලයේ සංයුතිය 3(2) (i) මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව 07කට නොඅඩු විය යුතු අතර 13 ට නොවැඩි විය යුතුය.	ශ්‍රී ලංකා මහබැංකුවේ නියෝග පරිදි 2013 වර්ෂයේදී මණ්ඩලය අධ්‍යක්ෂකවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත විය.
3(2) (ii) (අ) ප්‍රධාන විධායක තනතුරක් දරන අධ්‍යක්ෂක වරයෙක් හැර අධ්‍යක්ෂක වරයෙකුගේ මුළු සේවා කාලය අවුරුදු 09 නොඉක්මවිය යුතුය. නිල කාලය දැරූ එකී කාල සීමාවට 2008 ජනවාරි 01 දින දක්වා සේවය කළ කාල සීමාව ඇතුලත් විය යුතුය.	මණ්ඩලයේ සේවා කාලය වසර 09 ඉක්මවූ අධ්‍යක්ෂකවරුන් නැත.
(ආ) මේ තත්වය යටතේ පහත දැක්වෙන සංක්‍රාන්තීය විධිවිධාන අදාල වේ. (අ) මණ්ඩලයේ එක් අධ්‍යක්ෂකවරයෙක් පමණක් සිටින විටදී හා ඔහු / ඇය 2008 ජනවාරි 01 දිනට අවුරුදු 09ට වඩා සේවයේ යෙදී ඇත්නම් 2008 දෙසැම්බර් මස 31 දිනට ඔහු / ඇය අධ්‍යක්ෂක වරයෙක් වශයෙන් සේවය අතහැර ගියා සේ සැලකේ. (ආ) මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් සිටින විටදී හා ඔවුන් 2008 ජනවාරි 01 වන දිනට අවුරුදු 09 ට වඩා සේවයකොට ඇත්නම් පහත දැක්වෙන විධිවිධාන අදාල වේ. (i) සේවා කාලය අවුරුදු 09 ඉක්මවා ඇති අධ්‍යක්ෂකවරුන්ගෙන් වැඩිම කාලයක් සේවයකොට ඇති අධ්‍යක්ෂකවරයා 2008 දෙසැම්බර් 31 දින සේවය අතහැර ගියා සේ සැලකේ. (ii) ඉන් ඉක්බිතිව එක් එක් ඊළඟ අවුරුද්දේදී ඉතිරි අධ්‍යක්ෂකවරුන් අනුපිලිවෙලට එක් වසරකට එක් අයෙකු බැගින් 2008 ජනවාරි 01 වන දිනට අවුරුදු 09 ක සේවා කාලය ඉක්මවූ අධ්‍යක්ෂක සේවය අතහැර ගියාසේ සැලකේ. එසේ වී නමුත්, 2008 ජනවාරි 01 වන දිනට වසර 09ට වඩා බැංකුවේ සේවයකොට ඇති අධ්‍යක්ෂකවරුන් 2001 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගියාසේ සලකනු ලැබේ.	

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
(ඇ) 2008 ජනවාරි 01 දින හෝ 2010 දෙසැම්බර් 31 අතර කාලය තුළ 09 වසරක සේවා කාලය සම්පූර්ණ වීමට නියමිත අධ්‍යක්ෂකවරුන් වේ නම්, නියෝග 3(2)(සස)(ආ)(ආ) මගින් දක්වා ඇති පරිදි එක් එක් ඊළඟ අවුරුද්දේදී අනුපිළිවෙළට ඉතිරි අධ්‍යක්ෂකවරුන් එක් වසරකට එක් අයෙකු බැගින් සේවය අතහැර ගියාසේ සලකනු ලැබේ. එසේ වූ නමුත් මෙහි වූ උප නියෝගය (ඇ) මගින් ආවරණය වී ඇති එකී සියලු අධ්‍යක්ෂකවරුන් 2011 දෙසැම්බර් 31 වන විට හෝ ඊට පෙර සේවය අතහැර ගියාසේ සැලකේ.	
3(2) (iii) බැංකුවේ සේවකයෙකු, බැංකුවේ අධ්‍යක්ෂ වරයෙකු (මෙහි මින් මතු ''විධායක අධ්‍යක්ෂක'' වශයෙන් හැඳින්වෙන) වශයෙන් පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම කළ හැකිය. එසේ වී නමුත් මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂක වරුන්ගේ සංඛ්‍යාව මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා නොඉක්මවිය යුතුය. එබඳු අවස්ථාවකදී විධායක අධ්‍යක්ෂකවරුන්ගෙන් එක් අයෙක් ප්‍රධාන විධායක නිලධාරී විය යුතුය.	මෙම නියමයට අනුකූලව බැංකුවේ එක් විධායක අධ්‍යක්ෂකවරයෙක් හා විධායක නොවන අධ්‍යක්ෂකවරුන් 06 දෙනෙක් සිටිති.
3(2) (iv) මණ්ඩලය තුළ අඩුම ගණනේ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක වරුන් තිදෙනෙක් හෝ මුළු අධ්‍යක්ෂකවරුන්ගේ ගණනින් තුනෙන් එකකට සමාන ගණනක් යන දෙකින් වැඩි සංඛ්‍යාවකින් යුක්ත විධායක නොවන අධ්‍යක්ෂකවරුන් ගණනක් සිටිය යුතුය. මෙම උප නියෝගය 2010 ජනවාරි 01 දින සිට ඉදිරියට අදාළ විය යුතුය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් කාරණා මත ස්වාධීන තැනැත්තෙකු සේ නොසැලකේ : (අ) බැංකුවේ කොටස් වලින් 1% වැඩි සෘජු හෝ වක්‍ර කොටස් ධාරිත්වයක් තිබීම. (ආ) ඔහුගේ / ඇයගේ පත්වීමට පූර්වාසන්න අවුරුදු දෙක තුළ මෙහිවූ නියෝගය 3(7) හි විස්තරකොට ඇති පරිදි බැංකුවේ පාලනාත්මක ප්‍රාග්ධනයෙන් 10%ක් ඉක්මවන ව්‍යාපාරික ගණුදෙනුවක් තිබීම.	මණ්ඩලයේ කිසිවෙකුත් ස්වාධීන අධ්‍යක්ෂවරුන් සේ නොසැලකෙන්නේ ඔවුන් සියලු දෙනාම භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත්කරනු ලබන බැවිනි.
(ඇ) අධ්‍යක්ෂක වරයෙක් වශයෙන් පත්වීමට පූර්වාසන්න අවුරුදු දෙක තුල බැංකුවේ සේවයේ යෙදී සිටීම. (ඈ) බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂක වරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියෙක් හෝ ප්‍රධාන කළමනාකරණ පිරිසක සාමාජිකයෙක් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම හෝ වැදගත් කොටස් හිමිකරුවෙකුවීම. මෙම කාර්යාර්ථයේදී ''සමීප සබඳතාවක්'' යනුවෙන් කලත්‍රයා හෝ මූල්‍යය වශයෙන් යැපෙන දරුවෙක් අදහස් වේ. (ඉ) බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කිරීම. (ඊ) පහතින් දක්වා ඇති සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක සේවකයෙක් හෝ අධ්‍යක්ෂකවරයෙක් හෝ වැදගත් කොටස් ධාරියෙක් වීම. (i) එකී සමාගම නියෝග මාලාවේ 3(7) නියෝගය ප්‍රකාරව දැනට ගණුදෙනු කිරීම් කරන හා එකී බැංකුවේ පාලනාත්මක ප්‍රාග්ධනයෙන් 10% ට වැඩි හිමිකමක් තිබීම හෝ (ii) සෙසු අධ්‍යක්ෂකවරුන්ගෙන් කිසිවෙක් අංක 3(7) නියෝගය අනුව එකී බැංකුවේ පාලනාත්මක ප්‍රාග්ධනයෙන් 10% ට වැඩි හිමිකරුවෙක් වීම. හෝ (iii) බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂකවරුන්ට නියෝග 3(7) හි අර්ථ දක්වා ඇති පරිදි පාලනාත්මක ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගණුදෙනුවක් තිබීම.	වර්ෂය තුලදී කිසිදු විකල්ප අධ්‍යක්ෂකවරයෙක් පත් නොකරන ලදී.
3(2) (v) ස්වාධීන අධ්‍යක්ෂක වරයෙකු නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂකවරයෙකු පත් කරනු ලබන අවස්ථාවකදී එසේ පත් කරන ලද තැනැත්තා ස්වාධීන අධ්‍යක්ෂකවරයාට අදාල නිර්ණායක සපුරාලිය යුතුය.	

ආයතනික පාලන වගන්තිය හා නීති		අනුකූලතා මට්ටම
3(2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂකවරුන් ක්‍රමෝපාය, කාර්යසාධනය හා සම්පත් සම්බන්ධයෙන් ස්වාධීන නිගමනවලට එලඹීමට හැකි විශ්වාසදායක ඉතිහාසයක් ඇති සහ අවැසි නිපුණතාව හා පළපුරුද්ද ඇති අය විය යුතුය.	සාංගමික ව්‍යවස්ථාව අනුව භාණ්ඩාගාරයේ ලේකම් විසින් අධ්‍යක්ෂක වරුන් පත් කරනු ලැබේ.
3(2) (vii)	රැස්වීමකට අධ්‍යක්ෂකවරුන්ගෙන් අඩකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් පැමිණ නැත්නම් රැස්වීමක ගණපූරණයට අවශ්‍ය අධ්‍යක්ෂකවරුන් පැමිණ සිටියේ වී නමුදු අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමක් නොපැවැත්විය යුතුය. මෙම උප නියෝගය 2010 ජනවාරි 01 දින සිට අදාල විය යුතුය.	මෙම නියමය තරයේ පිළිපැද ඇති අතර බහුතරයක් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් බව සඳහන් කරනු ලැබේ.
3(2) (viii)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක වරුන් බැංකුවේ අධ්‍යක්ෂක වරුන්ගේ නම් සඳහන් කෙරෙන ආයතනික සන්නිවේදන කටයුතුවලදී එලෙසින්ම සඳහන් කළ යුතුය. මණ්ඩලයේ සංයුතිය, අධ්‍යක්ෂක වරුන්ගේ ගණය කුමක්දැයි යන්න හා සභාපතිගේ, විධායක අධ්‍යක්ෂක වරුන්ගේ හා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක වරුන්ගේ නම් වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ සඳහන් කළ යුතුය.	අධ්‍යක්ෂක වරුන්ගේ ගණයන් ඇතුළුව සභාපතිගේ, විධායක අධ්‍යක්ෂ වරුන්ගේ හා ස්වාධීන විධායක අධ්‍යක්ෂ වරුන්ගේ, ක්‍රියාකාරී අධ්‍යක්ෂක වරුන්ගේ නම් ආයතනික පාලන වාර්තාවේ සඳහන් කරනු ලැබේ.
3(2) (ix)	මණ්ඩලයට නව අධ්‍යක්ෂකවරුන් පත්කිරීම සඳහා විධිමත් හා හොඳින් සළකාබලනු ලැබූ සහ විනිවිද බවින් යුත් ක්‍රියාපරිපාටියක් තිබිය යුතුය. තවද, මණ්ඩලයට කෙරෙන පත්වීම් අනුපිළිවෙල අනුප්‍රාප්තිකව සිදු කිරීම සඳහා ක්‍රියා පරිපාටියක් තිබිය යුතුය.	භාණ්ඩාගාරයේ ලේකම් සමඟ මණ්ඩලය විසින් විවිධ නිපුණතා සහ වෘත්තීන් ඇති සාමාජිකයන් සඳහා අනුප්‍රාප්තික පත්වීම් සැලැස්මක් පිළියෙල කිරීමට නියමිතය.
3(2) (x)	අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා සියළුම අධ්‍යක්ෂකවරු ඔවුන්ගේ පත්වීම්වලින් පසුව පැවැත්වෙන ප්‍රථම මහා සභා රැස්වීමේදී කොටස්කාරීන් විසින් ඡන්දයෙන් තෝරාගැනීමට යටත් වෙති.	කිසිවෙකුත් නැත.
3(2) (xi)	අධ්‍යක්ෂවරයෙක් ඉල්ලා අස්වේනම් හෝ නිලයෙන් ඉවත් කෙරේ නම් මණ්ඩලය විසින්	
(අ)	ඔහුගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිවේදනය කිරීම සහ එකී ඉල්ලා අස්වීමට හේතුව හෝ ඉවත්වීමට හේතුව, එහෙත් ඔහු බැංකුව සමඟ මතභේදයට තුඩුදුන් කරුණුවලට සීමා නොවිය යුතුය; සහ	
(ආ)	කොටස්කාරීන්ට දැන්විය යුතු කරුණු තිබේද නැද්ද යන්න තහවුරු කෙරෙන ප්‍රකාශයක් නිකුත් කිරීම	
3(2) (xii)	(යම් බැංකුවක් වෙනත් බැංකුවක ශාඛාවක් හෝ ආශ්‍රිත සමාගමක් වන අවස්ථාවකදී හැර) බැංකුවක අධ්‍යක්ෂවරයෙකු, සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂක වරයෙක් වශයෙන් පත් කිරීම තෝරාගැනීම හෝ නම්කිරීම නොකළ යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් තීරණ ගැනීමේදී මෙම නියමය සැළකිල්ලට ගනී.
3(3)	අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව ඇගැයීම පිණිස වූ නිර්ණායක 1988 අංක 30 දරණ බැංකු පනතේ 76ඃ වගන්තිය සමඟ කියැවිය යුතු 42 වගන්තියේ විධිවිධානයන්ට අමතරව බැංකුවේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස සේවය කරන හෝ සේවය කිරීමට අදහස්කරන තැනැත්තෙකුගේ යෝග්‍යතාව නිර්ණය කිරීම සඳහා පහත දැක්වෙන නිර්ණායක අදාල කරගත යුතුය. මෙහි දක්වා ඇති කිසිදු නිර්ණායකයකට අනුකූලව කටයුතු නොකිරීම හේතුකොටගෙන කිසියම් තැනැත්තෙකු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කිරීමට, තෝරාගැනීමට හෝ නම් කරනු ලැබීමට හෝ තවදුරටත් අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කිරීමට නුසුදුස්සෙකු වේ.	
3(3) (i)	අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් සේවය කරන තැනැත්තෙකු අවුරුදු 70 නොඉක්මවිය යුතුය.	2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 70 ඉක්මවන අධ්‍යක්ෂවරුන් නොමැත
දැනට බැංකුවක වැඩකරන අධ්‍යක්ෂකවරයෙකු 2008 ජනවාරි 01 ට අවුරුදු 70		

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
ඉක්මවන්නේ නම් පහත දැක්වෙන සක්‍රීය විධිවිධාන ඇතුලත් විය යුතු අතර මීට වූ නියෝග 3(2) (ii) හි දක්වා ඇති විධිවිධානවලට යටත් විය යුතුය. (අ) 2008 ජනවාරි 01 දිනට යම් අධ්‍යක්ෂකවරයෙක් අවුරුදු 75 ඉක්මවන්නේ නම් එවන් අධ්‍යක්ෂවරයෙක් 2008 දෙසැම්බර් 31 දිනෙන් ඔබ්බට දීර්ඝ නොකරන කාලසීමාවක් සඳහා පමණක් සේවය කළ යුතු අතර 2008 දෙසැම්බර් 31 දින සේවය අත්හැර ගියාසේ සැලකේ. (ආ) 2008 ජනවාරි 01 දිනට යම් අධ්‍යක්ෂකවරයෙකු වයස 70 සහ 75 අතර වයස් සීමාවක සිටී නම් එවන් අධ්‍යක්ෂකවරයෙක් 2009 දෙසැම්බර් 31 දිනෙන් ඔබ්බට දීර්ඝ නොකරන කාලසීමාවක් සඳහා පමණක් සේවය කළ යුතු අතර 2009 දෙසැම්බර් 31 දින සේවය අතහැර ගියාසේ සලකනු ලැබේ. (ඇ) බැංකුවක සේවය කරන යම් අධ්‍යක්ෂවරයෙකු 2008 ජනවාරි 01 සහ 2009 දෙසැම්බර් 31 අතරතුර කාලයේදී වයස 70 ක් වේ නම් එවැනි අධ්‍යක්ෂකවරයෙකු නියෝග අංක 3(2)(සස) ප්‍රකාරව, 2010 දෙසැම්බර් 31 දිනෙන් පසු සේවය අතහැර ගියාසේ සැලකේ.	
3(3) (ii) යම් තැනැත්තෙක් අධ්‍යක්ෂකවරයෙක් ලෙස බැංකුවේ ආශ්‍රිත/උපකාරක සමාගම් ඇතුළු සමාගම්/ආයතන 20 කට වඩා සේවය නොකළ යුතුය. එකී සමාගම් 20 න් 10 ක්, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත ප්‍රකාරව විශේෂිත ව්‍යාපාරික ආයතන වශයෙන් වර්ගීකරණය කරන ලද ඒවා විය යුතුය.	ආයතන 20 ට වඩා සංඛ්‍යාවක නිලයක් දරණ අධ්‍යක්ෂකවරුන් කිසිවෙක් නැත.
3(4) මණ්ඩලය විසින් පවරන ලද කළමනාකරණ කටයුතු 3(4) (i) අධ්‍යක්ෂකවරුන් විසින්, පැවරීම්, විධිවිධාන සැළකිල්ලෙන් අධ්‍යයනය කර පැහැදිලිව තේරුම්ගත යුතුය.	මණ්ඩලය විසින් කලින් කලට පැවරීම් කටයුතු සමාලෝචනය කරන අතර, පැවරීම් ප්‍රමාණය බැංකුවේ අවශ්‍යතා පිළිබඳ ගැටළු විසඳීමට ප්‍රමාණවත් වනබව සහතික කෙරේ.
3(4) (ii) මණ්ඩලය විසින් කිසිදු කරුණක් මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂකවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට, මණ්ඩලයේ කාර්යයන් සමස්තයක් වශයෙන් ඉටුකිරීමට මණ්ඩලයේ කටයුතු කිරීමේ හැකියාව කැපී පෙනෙන අයුරින් බාධාවක් වන හෝ එය අඩුකෙරෙන අයුරින් නොපැවරිය යුතුය.	
3(4) (iii) පැවරීමේ ක්‍රියාවලීන් බැංකුවේ අවශ්‍යතාවන්ට අදාලව පවතින බව සහතික කිරීම සඳහා කලින් කලට ඒවා මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතුය.	
3(5) සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී 3(5) (i) සභාපතිගේ හා ප්‍රධාන විධායක නිලධාරිගේ කාර්යභාරය වෙන් වෙන් ඒවා විය යුතු අතර එකම තැනැත්තෙකු විසින් ඉටු නොකළ යුතුය.	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිගේ කාර්යභාරය වෙන් වෙන්ව ඉටු කෙරේ.
3(5) (ii) සභාපති විධායක නොවන නිලධාරියෙක් විය යුතු අතර, ස්වාධීන අධ්‍යක්ෂකවරයෙක්ද වේ නම් වඩාත් යෝග්‍ය වේ. සභාපති ස්වාධීන අධ්‍යක්ෂකවරයෙක් නොවන විටදී බැංකුව විසින් යෝග්‍යාකාරයේ නිශ්චිත ලිඛිත කාර්යභාරයක් සහිතව ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු, ප්‍රශස්ත ස්වාධීනතාවක් උදෙසා, නම් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා නම් කිරීම බැංකුවේ වාර්ෂික වාර්තාව මගින් හෙළිදරව් කළ යුතුය.	සභාපති විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරයෙක් නොවේ.
3(5) (iii) තම වාර්ෂික වාර්තාවේම කොටසක් වන ආයතනික පාලන වාර්තාව තුල සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාව, (මූල්‍ය, ව්‍යාපාරික, පවුල් හෝ වෙනත් වැදගත් අදාල සම්බන්ධතා) ඇතුලුව සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ මණ්ඩලයේ වෙනත් සාමාජිකයන් අතර සම්බන්ධතා හෙළිදරව් කළ යුතුය.	සභාපති, මණ්ඩලයේ සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ අන්‍යතාව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර තිබේ. සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී හා මණ්ඩලයේ සෙසු සාමාජිකයින් අතර වැදගත්, මූල්‍ය, ව්‍යාපාරික හෝ පවුල් සම්බන්ධතා (වාර්ෂික ප්‍රකාශනයට අනුව) නොමැත.

ආයතනික පාලන වගන්තිය හා නීති		අනුකූලතා මට්ටම
3(5) (iv)	සභාපති විසින් (අ) මණ්ඩලයට නායකත්වය සැපයිය යුතුය. (ආ) මණ්ඩලය කාර්යක්ෂම ලෙස කටයුතු කරනබව හා තම වගකීම් ඉටුකරන බව හා (ඇ) ප්‍රධාන හා සුදුසු ගැටළු කාලානුරූපීව මණ්ඩලය විසින් සාකච්ඡා කරන බව සහතික කිරීම ද කළ යුතුය.	මණ්ඩලය සභාපතිගේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම් අනුමත කරයි.
3(5) (v)	න්‍යායපත්‍රයට ඇතුලත් කිරීම සඳහා සෙසු අධ්‍යක්ෂකවරුන් විසින් යෝජනා කරන ලද වෙනත් යම් යම් යෝජනා තිබේ නම් ඒවා පිළිබඳවද සුදුසු පරිදි සැලකිල්ල යොමු කරමින්, එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කිරීම හා අනුමත කිරීම පිළිබඳ මූලික වගකීම සභාපති දැරිය යුතුය. න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේ කටයුත්ත සභාපති විසින් සමාගම් ලේකම් වෙත පැවරිය යුතුය.	සභාපතිගේ අදහස් විමසීමෙන් අනතුරුව රැස්වීම් න්‍යාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් පිළියෙල කරනු ලබයි.
3(5) (vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී උද්ගතවන ගැටළු පිළිබඳව සියලු අධ්‍යක්ෂකවරුන්ට විධිමත් ලෙස කරුණු පැහැදිලි කිරීම් සිදුකරන බවට හා අධ්‍යක්ෂකවරුන්ට ප්‍රමාණවත් ලෙස නිසි කලට තොරතුරු ලැබෙන බවට සභාපති සහතික විය යුතුය.	මණ්ඩලයේදී උද්ගතවන කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට කරුණු පැහැදිලි කිරීම් හා දැනුම්දීම් මණ්ඩලයේ සභාපති විසින් සිදුකරයි. පහත දැක්වෙන ක්‍රියා පරිපාටි ඒ සඳහා අනුගමනය කෙරේ. ■ මණ්ඩලය රැස්වීම්වලට දින 5 කට කලින් මණ්ඩල පත්‍රිකා බෙදාහැරේ. ■ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන් පැහැදිලි කිරීම් සඳහා සෑමවිටම සූදානම්ව සිටිති. ■ බැංකුවේ කාර්ය සාධනය හා ස්වාධීනතාව පිළිබඳව අගැයීමට අධ්‍යක්ෂකවරුන්ට හැකිවන සේ කළමනාකරණ තොරතුරු ගිවිසගත් ආකෘති මගින් සපයනු ලැබේ.
3(5) (vii)	මණ්ඩලය බැංකුවේ උපරිම යහපත තකා කටයුතු කරන බව සහතික කරනු වස් මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් ලබාදෙමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටුකිරීමට සභාපති විසින් අධ්‍යක්ෂකවරුන් උනන්දු කරවිය යුතුය.	සියලු අධ්‍යක්ෂකවරුන් මණ්ඩල රැස්වීම්වලට සක්‍රියව සහභාගි වෙති.
3(5) (viii)	සභාපති විසින් විශේෂයෙන්ම විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ කාර්යක්ෂම සහභාගීත්වය වෙනුවෙන් පහසුකම් සැලසිය යුතු අතර විධායක නොවන හා විධායක අධ්‍යක්ෂකවරුන් අතර ඵලදායී සම්බන්ධතා සහතික කළ යුතුය.	මණ්ඩලයේ සාමාජිකයින් 7 දෙනෙකුගෙන් 6ක්ම විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වන අතර, එයින් සක්‍රිය සහභාගීත්වයක් නිර්මාණය වීමට වාතාවරණයක් සැලසේ. සියලු විධායක නොවන අධ්‍යක්ෂකවරුන් මණ්ඩලයේ උප කමිටුවලට සහභාගීවන අතර එමඟින් තවදුරටත් අවස්ථා විවර වේ.

ආයතනික පාලන වගන්තිය හා නීති		අනුකූලතා මට්ටම
3(5) (ix)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් යම් යම් විධායක රාජකාරී සම්බන්ධ කටයුතු කිසිවක් සඳහා සෘජු අධීක්ෂණයක් සභාපති විසින් නොකළ යුතුය.	සභාපති, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් යම් විධායක රාජකාරී සම්බන්ධ කටයුතු කිසිවක් සඳහා සෘජු අධීක්ෂණය නොකරයි.
3(5) (x)	කොටස්කාරීන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගැනීම සඳහා යෝග්‍ය පියවර ගන්නා බව හා කොටස් කරුවන්ගේ අදහස් මණ්ඩලයට දන්වන බව සභාපති විසින් සහතික විය යුතුය.	වාර්ෂික මහා සභා රැස්වීම් වලින් ඉක්බිතිව කොටස් කාරීන්ගේ සම්බන්ධතා රැස්වීම් පැවැත්වේ.
3(5) (xi)	ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික මට්ටමින් එදිනෙදා කෙරෙන ප්‍රධාන මට්ටමේ විධායක කළමනාකරණ කටයුතුවල භාරකරු වශයෙන් ක්‍රියා කළ යුතුය.	බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරී වෙත පවරා ඇත.
3(6) මණ්ඩලය විසින් පත්කරනු ලබන කමිටු		මණ්ඩලය විසින් එක් උපකමිටුවක් (ඉටු කළ යුතු කාර්යභාරය ලිඛිතව සඳහන් කරමින්) පත්කරනු ලැබ තිබේ. බැංකුවේ සේවකයින් උප කමිටුවල ලේකම්වරුන් වශයෙන් කටයුතු කරන අතර, ඒ ඒ සභාපතිවරුන් විසින් අධීක්ෂණය කරනු ලැබූ වාර්තා පවත්වා ගනිති. ■ මණ්ඩලයේ විගණන කමිටුව ■ මණ්ඩලයේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ■ මණ්ඩලයේ නම් කිරීමේ කමිටුව ■ මණ්ඩලයේ අවදානම් කළමනාකරණ කමිටුව ■ මණ්ඩලයේ නෛතික හා අයකර ගැනීම් කමිටුව ■ මණ්ඩලයේ ණය කමිටුව ■ මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව ■ මණ්ඩලයේ වත්කම් හා වගකීම් කමිටුව
3(6) (i)	මෙකී විධානයන් අතර අංක 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(V) නියෝගයන් මගින් දක්වා ඇති පරිදි එක් එක් බැංකු සඳහා අඩුම තරමින් මණ්ඩල කමිටු 4 ක් තිබිය යුතුය. එක් එක් කමිටුව සෘජුවම බැංකුවට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ, රැස්වීම් සංවිධානය කිරීමට, වාර්තා පවත්වා ගැනීම ආදිය පිණිස කමිටුව විසින් ලේකම්වරයෙකු පත්කළ යුතුය. මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් එක් කමිටුවේ රාජකාරී හා කාර්යභාරයේ කාර්ය සංවිධානය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.	
3(6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන නීතිරීති අදාල වේ.	3(2)(iv)හි විස්තර කොට ඇති පරිදි විගණන කමිටුවේ සභාපති වන්නේ ස්වාධීන විධායක නොවන හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේ. ඔහුට සිංගප්පූරුවේ නැන්යැං තාක්ෂණික සරසවියේ MBA උපාධියක්ද, එක්සත් ජනපදයේ වොෂින්ටන්හි MIT උපාධියක්ද, ඔස්ට්‍රේලියාවේ CPA හි ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ.
	(අ) කමිටුවේ සභාපති, ගිණුම් හා/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු විය යුතුය.	

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
(ආ) කමිටුවේ සියළු සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් විය යුතුය.	මණ්ඩලයේ විගණන කමිටුවේ සියලු සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ය.
(ඇ) කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. (i) අදාල ව්‍යවස්ථාවන්ට අනුකූලව විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම. (ii) විගණකයින්ට වරින් වර මහබැංකුවෙන් නිකුත් කරනු ලබන ාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම (iii) අදාල ගිණුම් ප්‍රමිතීන් භාවිතා කිරීම සහ (iv) විගණකයෙකුගේ සේවා කාලය විගණන ගාස්තු සහ කිසියම් ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කරනු ලැබීම විගණකයෙකු යොදා ගැනීමේ කාල සීමාව අවුරුදු 5 කට වඩා වැඩි නොවිය යුතුය. එකී විගණකයා කලින් නිල කාලය අවසන් වූ දින සිට වසර 3 කට කලින් නැවත සේවයට යොදා නොගත යුතුය.	පවරා ඇති විෂයන්ට අනුව මණ්ඩලයේ විගණන කමිටුව පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කොට ඇත. ■ විගණන සේවා සඳහා බාහිර විගණකයෙකු පත්කිරීම අදාල ව්‍යවස්ථාවන්ට අනුව සැලසීමට නියමිතය. ■ වරින්වර විගණකයින්ට නිකුත්කරන ශ්‍රීලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම. ■ අදාල ගිණුම් ප්‍රමිතීන් භාවිතා කිරීම.
(ඈ) අදාල ප්‍රමිතීන් හා ප්‍රශස්ත පරිචයන් අනුව බාහිර විගණකයාගේ ස්වාධීනත්වය, අපක්ෂපාතීත්වය සහ කාර්යක්ෂමතාවය පිළිබඳව කමිටුව සමාලෝචනය කිරීම හා අන්වේෂණය කිරීම සිදු කළ යුතුය.	මණ්ඩලයේ විගණන කමිටුව විසින් බාහිර විගණකයාගෙන් එහි ස්වාධීනතාව මෙන්ම විගණනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය සිදුකල බවට කරුණු බාහිර විගණකයාගෙන් ලබා ගනු ලැබේ.
(ඉ) අදාල ව්‍යවස්ථාවන්, රෙගුලාසි, නියමතාවන් හා මාර්ගෝපදේශයන් යටතේ අවසරදී ඇති විගණන නොවන සේවාවන් ලබාගනු පිණිස බාහිර විගණකයෙකු යොදාගැනීම පිණිස කමිටුව විසින් ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාවේ යෙදවිය යුතුය. මෙසේ ක්‍රියාකිරීම මගින් විගණන නොවන සේවාවක් බාහිර විගණකයෙකු හරහා ලබා ගැනීම තුලින් බාහිර විගණකයාගේ ස්වාධීනත්වය හෝ අපක්ෂපාතිත්වයට හානියක් නොවන බවට කමිටුව සහතික විය යුතුය. විගණන නොවන සේවාවන් සැලසීම සම්බන්ධයෙන් බාහිර විගණකයාගේ ස්වාධීනත්වයට හා අපක්ෂපාතිත්වය තක්සේරු කරන විට කමිටුව විසින් පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුවේ. i. විගණන සමාගමේ නිපුණතාව හා අත්දැකීම් අනුව විගණන නොවන සේවාවන් සැලසීමට ඊට සුදුසුකම් තිබේ ද යන්න. ii. බාහිර විගණකයා විසින් එකී සේවා සැපයීමේදී ඔහුගේ ස්වාධීනතාවට සහ/හෝ අපක්ෂපාතිත්වයට තර්ජනයක් එල්ල නොවන බවට ආරක්ෂක විධිවිධාන යොදා තිබේද යන්න. iii. විගණන නොවන සේවාවන්හි ස්වභාවය, ඒවාට අදාල ගාස්තු මට්ටම් සහ ගාස්තු වෙන් වෙන් වශයෙන් හා පොදුවේ ගත් කළ විගණන සමාගමට ඇති අදාලත්වය බාහිර විගණකයාගේ ස්වාධීනතාවට හා අපක්ෂපාතිත්වයට තර්ජනයක් වේද යන්න.	බාහිර විගණකයින්ගෙන් එවැනි සේවා ලබා ගැනීමේදී මණ්ඩලයේ විගණන කමිටුවෙන් පූර්ව අනුමැතිය ලබා ගැනේ.
(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් කාරණා ඇතුලත්ව බාහිර විගණකයන් සමඟ විගණනයේ විෂය පථය හා ස්වභාවය ගැන සාකච්ඡා කර අවසන නිගමනයකට පැමිණිය යුතුය. i. ආයතනික පාලනය හා මූල්‍ය වාර්තාකරණය පිළිබඳව ii. අදාල ගිණුම් ප්‍රතිපත්ති හා වාර්තා කිරීමේ බැඳියාවන්ට අනුව බාහිර කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම iii. එක් විගණන සමාගමකට වඩා සම්බන්ධ වී ඇති සමාගම් සමඟ සමායෝජනය	විගණනයට පහත සඳහන් දෑ ඇතුලත් වන බව තහවුරු කිරීම පිණිස කමිටුව විගණකයා සමඟ එහි විෂය පථය හා ස්වභාවය පිළිබඳව සාකච්ඡා කර අවසන් කර තිබේ. ■ ආයතනික පාලනය හා මූල්‍ය වාර්තාකරණය පිළිබඳව කළමනාකාරිත්වයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වන නියෝගවලට අනුකූලවීම සම්බන්ධයෙන් ඇගයීම.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
	■ අදාල ගිණුම් ප්‍රතිපත්ති හා වාර්තා කිරීමේ බැඳියාවන්ට අනුව බාහිර කාර්යාර්ථයන් උදෙසා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම
(උ) බැංකුවේ මූල්‍ය වාර්තා, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් හා ත්‍රෛමාසික වාර්තා සහ ඒවායේ අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ තීන්දුවල ඒකාග්‍රතාවය අන්වේෂනය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිය යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් හා ත්‍රෛමාසික වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. i. ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර ii. ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි වෙනස්කම් කිසිවක් වේනම් ඒවා iii. විගණනයෙන් උද්ගතවන කැපී පෙනෙන ගැලපීම් iv. දිගින් දිගටම ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේ උපකල්පනයන් සහ v. අදාල ගිණුම් ප්‍රමිතීන් හා නීතිමය නියමතාවන්ට අනුකූලවීම	විගණන කමිටු පහත සඳහන් කරුණු සමාලෝචනය කොට ඒවා පිළිබඳව අවධානය යොමු කරන ලදී. ■ ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර ■ ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි වෙනස්කම් වේනම් ඒවා ■ විගණකයන් උදෙසා කැපී පෙනෙන සීරුමාරු කිරීම් ■ අදාල ගිණුම් ප්‍රමිතීන් හා නීතිමය නියමතාවන්ට අනුකූල වීම
(ඌ) කමිටුව විසින් අන්තර් හා අවසාන විගණනවලින් උද්ගත වන්නා වූ ගැටළු, ප්‍රශ්ණගත කරුණු මෙන්ම ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සහභාගීත්වයකින් තොරව සාකච්ඡා කළ යුතුයැයි විගණකවරයා අදහස් කරන්නේ නම් එම කරුණුද සාකච්ඡාවට භාජන කළ යුතුය.	
(එ) බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය කමිටුව විසින් සමාලෝචනය කළ යුතු අතර කළමනාකාරීත්වයේ ප්‍රතිචාරයද කමිටුව සමාලෝචනය කළ යුතුය.	විගණක කමිටුව බාහිර විගණකයින්ගේ කළමනාකරණ ලිපිය හා ඊට වූ කළමනාකරණ ප්‍රතිචාරය සමාලෝචනය කර ඇත.
(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය. i. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්ය කටයුතු සහ සම්පත්වල ප්‍රමාණවත් භාවය සමාලෝචනය කිරීම සහ දෙපාර්තමේන්තුවට තම කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අධිකාරී බලයක් තිබේදැයි යන්න පිළිබඳව සෑහීමකට පත්විය යුතුය. ii. අභ්‍යන්තර විගණන වැඩ සටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටදී, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම. iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාර්ය සාධනය අගැයීම් හෝ තක්සේරු කිරීම් සමාලෝචනය කිරීම. iv. අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා බාහිර වශයෙන් බඳවා ගන්නා ලද සේවා සම්පාදකයින් පත්කිරීම හෝ සේවය නතර කිරීම් සඳහා නිර්දේශ කිරීම. v. ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ පිටතින් බඳවාගත් සේවා සම්පාදකයින් ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් අගැයීම හා ඔවුන් ඉල්ලා අස්වීමට හේතු දැන්වීමට අවස්ථාවක් ලබාදීම සහතික කිරීම. vi. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විගණනය කරන දෑ පිළිබඳව ස්වාධීනව කටයුතු කරන බවත් එම කටයුතු අපක්ෂපාතීව, කාර්යක්ෂමව හා නිසි වෘත්තීමය සැලකිල්ලකින් සිදුකරන බව සහතික කිරීම.	i. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්ය හා සම්පත්වල ප්‍රමාණවත් භාවය සමාලෝචනය කිරීම හා දෙපාර්තමේන්තුවට තම කාර්යභාරය ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් අධිකාරී බලයක් තිබෙන බව සහතික කිරීම. ii. අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
	iii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යසාධනය අගැයීම සමාලෝචනය කෙරේ. iv. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව තමන් විසින් විගණනය කරන දෑ ස්වාධීනව කරන බවත් ඒවා අපක්ෂපාතීව කාර්යක්ෂමව හා නිසි වෘත්තීමය සැලකිල්ලෙන් සිදු කරන බවත් සහතික කෙරේ.
(ඔ) අභ්‍යන්තර විමර්ෂණවලදී සොයාගත් ප්‍රධාන කරුණු හා කමිටුව විසින් සමලෝචනය කර ඒවාට කළමනාකාරීත්වයෙන් ලැබෙන ප්‍රතිචාර කමිටුව විසින් සළකා බැලිය යුතුය.	අභ්‍යන්තර විමර්ෂණ වලදී සොයාගත් ප්‍රධාන කරුණු විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඒවා සම්බන්ධයෙන් කළමනාකාරීත්වයෙන් ලැබෙන ප්‍රතිචාර සලකා බලනු ලැබේ. විමර්ෂණවලින් ඉක්බිතිව කෙරෙන නිර්දේශ විගණන කමිටුව විසින් ක්‍රියාවට නැංවීම සහතික කෙරේ.
(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක බාහිර විගණකයින්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම්වලට සහභාගී විය යුතුය. කමිටුවේ ආරාධනය මත මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරී ද රැස්වීම්වලට සහභාගී විය යුතුය. කෙසේ නමුත් වසරකට දෙවතාවක්, විධායක අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වයක් නොමැතිව කමිටුව හා බාහිර විගණකයින් රැස්විය යුතුය.	සාමාන්‍යයෙන් අභ්‍යන්තර විගණන පිළිබඳ කළමනාකරු හා විගණන කමිටුවේ සාමාජිකයින් රැස්වීම්වලට සහභාගී වෙති. කමිටුවේ ආරාධනය මත ආයතනික කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් රැස්වීම්වලට සහභාගී වෙති.
(ක) කමිටුව සම්බන්ධයෙන් පහත ලක්ෂණ තිබිය යුතුය: (i) නියමකොට ඇති විෂයන්ට අදාලව විමර්ශණ සිදු කිරීමට නිසි අධිකාරී බලයක් තිබිය යුතුය. (ii) එසේ කිරීමට අවශ්‍ය සම්පත් තිබිය යුතුය. (iii) තොරතුරු ලබාගැනීමට සියලු පහසුකම් තිබිය යුතුය. (iv) බාහිර වෘත්තීමය උපදෙස් ලබා ගැනීමට හා අවශ්‍ය වේ නම් අදාල පළපුරුද්ද ඇති බාහිර පුද්ගලයන්ට පැමිණීමට ආරාධනය කිරීමට බලතල තිබිය යුතුය.	මණ්ඩලයේ විගණන කමිටුවට නියම කොට ඇති විෂයන්ට අදාලව (අ) විමර්ශණ සිදු කිරීමට නිසි අධිකාරී බලය තිබේ. (ආ) එසේ කිරීමට අවශ්‍ය සම්පත් තිබේ. (ඇ) තොරතුරු ලබා ගැනීමට සියලු පහසුකම් තිබේ. (ඈ) බාහිර වෘත්තීමය උපදෙස් ලබා ගැනීමට බලතල තිබේ.
(ග) සාකච්ඡා කිරීමට ඇති ප්‍රශ්ණගත කරුණු සම්බන්ධයෙන් නිසි දැනුම්දීමකින් පසුව කමිටුව ක්‍රමිකව රැස්විය යුතු අතර, තම රාජකාරී හා වගකීම් ඉටු කිරීමේදී ගන්නා ලද නිගමන වාර්තා කළ යුතුය.	අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලයේ විගණන කමිටුව ක්‍රමිකව ත්‍රෛමාසික රැස්වීම් නියම කොට තිබේ. ඒ අනුව වර්ෂය තුල කමිටුව රැස්වීම් 04 ක් පවත්වා තිබේ. තම රාජකාරී හා වගකීම් ඉටු කිරීමේදී ගන්නා ලද නිගමන රැස්වීම් වාර්තාවන්හි වාර්තාගත කොට ඇති අතර ඒවා ලේකම් විසින් පවත්වා ගෙන යනු ලැබේ.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
(ජ) මණ්ඩලය විසින් පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතුය. (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් (ii) වර්ෂය තුලදී පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන සහ (iii) එක් එක් රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂකවරයා පැමිණීම පිළිබඳ විස්තර.	මණ්ඩලයේ විගණන කමිටුවේ වාර්තාවට පහත සඳහන් කරුණු ඇතුලත් වේ. (i) මණ්ඩලයේ විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර (ii) මණ්ඩලයේ විගණන කමිටු රැස්වීම් වාර ගණන (වර්ෂය තුල) (iii) එක් එක් රැස්වීමට අධ්‍යක්ෂකවරයා සහභාගී වීම පිළිබඳ විස්තර
(ට) කමිටුවේ ලේකම් (සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ ප්‍රධානී) කමිටු රැස්වීම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තා තබාගත යුතුය.	අභ්‍යන්තර විගණන පිළිබඳ කළමනාකරු මණ්ඩලයේ විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර, කමිටුවේ වාර්තා පවත්වා ගනියි.
(ඩ) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කරුණු පිළිබඳව ඇතිවිය හැකි අක්‍රමිකතාවයන් පිළිබඳව බැංකුවේ සේවකයින් රහසිගතව හෙළිකිරීමට තිබෙන තොරතුරු ලබා ගැනීමට ඇති විධි විධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව, එබඳු කරුණු සාධාරණව හා ස්වාධීනව විමර්ශණය කිරීමට විධිමත් විධිවිධාන සලසා ඇති බවට හා විධිමත් පසුවිපරම් කටයුතු කිරීමට මෙන්ම බාහිර විගණකවරයා සමඟ බැංකුවේ ඇති සම්බන්ධතාවය සුපරීක්ෂණය කිරීමට ප්‍රධාන නියෝජිත අංගයක් ලෙස ක්‍රියා කිරීම සහතික කළ යුතුය.	බැංකුවේ සේවකයින්, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කරුණු පිළිබඳව සිදුවිය හැකි අක්‍රමිකතා පිළිබඳව ඇති යම් යම් කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ තිබෙන අතර එවැනි දේ පිළිබඳ දැනුම් දීම් (හා නිර්නාමික දැනුම්දීම්) විගණන කමිටුවේ සභාපති වෙත දන්වනු ලබන අතර ඔහු විසින් සුදුසු පරිදි ඒවා පිළිබඳව කටයුතු කරයි.
3(6) (iii) මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුවකට පහත දැක්වෙන නීතිරීති අදාල වේ.	
(අ) කමිටුව විසින් අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සම්බන්ධයෙන් වන පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍ය ගෙවීම්) නිර්ණය කළ යුතුය.	ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පරිශ්‍රමික සඳහා කමිටුව විසින් ප්‍රතිපත්තියක් සම්පාදනය කරනු ලැබේ.
(ආ) කමිටුව විසින් අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ඉලක්ක හා අරමුණු පිළියෙල කළ යුතුය.	වර්ෂය සඳහා පිළියෙල කළ ක්‍රමෝපායීය/ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රධාන විධායක නිලධාරීන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු ඇතුලත් කොට තිබේ.
(ඇ) දී ඇති අරමුණු හා ඉලක්ක අනුව කලින් කලට කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්ය සාධනය අගැයීමකට ලක්කල යුතු අතර පරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්ය සාධනය මත පදනම් වූ අනෙකුත් ගෙවීම් සඳහා පදනම තීරණය කළ යුතුය.	මේ සඳහා කමිටුවේ නිර්ණේය විෂයන් මණ්ඩලය විසින් අනුමත කොට තිබේ
(ඈ) ප්‍රධාන විධායක නිලධාරී සම්බන්ධ කරුණු සාකච්ඡා කරමින් තිබෙන විටදී හැර, කමිටුවේ සියලු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහභාගී විය යුතුය.	
3(6) (iv) නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීතිරීති අදාල වේ.	

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
(අ) නව අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීමට/පත් කිරීමට කමිටුව විසින් ක්‍රියා පරිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	භාණ්ඩාගාරයේ ලේකම්ට, නව අධ්‍යක්ෂකවරුන් පත් කිරීමේ බලය තිබෙන බැවින් හා මෙකී නිර්ණායකයන් බැංකුවට අදාල නැති බැවින් බැංකුව විසින් ශ්‍රී ලංකා මහබැංකුවේ අනුමැතිය ලබාගෙන තිබේ.
(ආ) මණ්ඩලයේ සමස්ත වගකීම්භාරය ඉටු කිරීමෙහි ලා වත්මන් අධ්‍යක්ෂකවරුන් (නැවත තෝරාපත්කර ගැනීමේදී) අධ්‍යක්ෂකවරයාගේ කාර්ය සාධනය හා දායකත්වය ගැන සැලකිල්ල යොමු කරමින් කමිටුව විසින් තම නිර්දේශ ඉදිරිපත් කිරීම/නොකිරීම කළ යුතුය.	ඉහත 3(6) (iv) 'අ' හි දක්වා ඇති පරිදි වේ.
(ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත් කිරීමට හෝ උසස් කිරීමට සළකා බලනු ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් පලපුරුද්ද හා ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක, කමිටුව විසින් තීරණය කළ යුතුය.	ප්‍රධාන විධායක නිලධාරී තනතුර ඇතුළු තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ගුණාංග ඇතුළු සුදුසුකම් පිළිබඳ නිර්ණායක කමිටුව විසින් නියම කෙරේ. අදාල කරගත යුතු ව්‍යවස්ථා හා මාර්ගෝපදේශ, නිර්ණායක සකස් කිරීමේදී කමිටුව සැළකිල්ලට ගනී.
(ඈ) ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි හා නියෝග අංක 3(3) හි දක්වා ඇති නිර්ණායක මගින් නියමකොට ඇති පරිදි අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් එකී තනතුර දැරීම සඳහා යෝග්‍ය හා උචිත අයවලුන් බව කමිටුව සහතික විය යුතුය.	3(3) හි දැක්වෙන නිර්ණායක අනුව ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් තමන් ඒ තනතුරුවලට යෝග්‍යම හා උචිත අයවලුන් බවට වාර්ෂිකව ප්‍රකාශයක් කමිටුව මගින් ලබා ගනී.
(ඉ) විශ්‍රාම යන අධ්‍යක්ෂකවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය වන අතිරේක අවශ්‍යතා/නව විශේෂඥ දැනුම මෙන්ම අනුප්‍රාප්තික විධිවිධාන කමිටුව විසින් විටින් විට සැලකිල්ලට ගෙන නිර්දේශ කළ යුතුය.	නව විශේෂඥතා දැනුම පිළිබඳ අවශ්‍යතාවය කළමනාකාරීත්වය හෝ එහි කමිටු මගින් හඳුනාගෙන මණ්ඩලයේ නාමයෝජනා කමිටුවට දැනුම්දෙන අතර එකී කමිටුව මගින් නිසි ක්‍රියාමාර්ග ගනු ඇත.
(ඊ) කමිටුවේ සභාපතිත්වය ස්වාධීන අධ්‍යක්ෂකවරයෙක් විසින් දැරිය යුතු අතර, බහුතරය ස්වාධීන අධ්‍යක්ෂකවරුන්ගෙන් යුක්ත වීම වඩාත් යෝග්‍ය වේ. ආරාධනා කිරීම මත ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම්වලට සහභාගී විය යුතුය.	කමිටුව, ස්වාධීන අධ්‍යක්ෂකවරයකුගේ සභාපතිත්වය යටතේ රැස්වේ. සෙසු සාමාජිකයන් ස්වාධීන අයවලුන් නොවේ.
3(6) (v) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන නීති රීති අදාල වේ.	කමිටුවට විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී, සහකාර කළමනාකරු (අවදානම්), අනුකූලතා නිලධාරී සහ ණය, මෙහෙයුම් හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇතුලත් වේ. කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කරන අතර කමිටුවට පවරා ඇති බලතල හා වගකීම් රාමුව ඇතුලත ක්‍රියා කරයි.
(අ) කමිටුවට අඩු ගණනේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු ද ප්‍රධාන විධායක නිලධාරී සහ පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂනය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇතුලත් විය යුතුය. උදා:- ණය, වෙළඳපොල, ද්‍රවශීලතා මෙහෙයුම් හා ක්‍රමෝපායීය අවදානම් වශයෙනි. කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කළ යුතු අතර කමිටුවට පවරා ඇති බලතල හා වගකීම් රාමුව ඇතුලත මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
(ආ) බැංකුවට මුහුණ දෙන්නට සිදුවන සියලු අවදානම් එනම්: ණය, වෙළඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම් හා ක්‍රමෝපායීය අවදානම් මාසික පදනමක් යටතේ යෝග්‍ය අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා කමිටුව විසින් තක්සේරු කළ යුතුය. උපකාරක සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් ගත්කළ අවදානම් කළමනාකරණය කළ යුත්තේ බැංකු පදනමකින් හා කණ්ඩායම් පදනමකිනි.	කමිටුව විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුමත කරනු ලැබ ඇති අතර එමගින් අවදානම් කළමනාකරණය හා තක්සේරුව සිදු කෙරේ. බැංකුවේ අවදානම් තක්සේරු කිරීමට හා අගැයීමට කමිටුවට ක්‍රියාවලියක් තිබේ. සොයාගත් කරුණු පිළිබඳ වාර්තාවක් හා ගැටළු සමාලෝචනය කොට ක්‍රියාමාර්ග ගැනීම සඳහා මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
(ඇ) කමිටුව විසින් නියම කොට ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක සීමාවන් තුල පිහිටා විශේෂිත අවදානම් සඳහා සුදුසු කටයුතු සිදු කිරීමට මෙන්ම ඒවා කළමනාකරණය කිරීම සඳහා ණය කමිටුව හා වත්කම් වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්බව හා කාර්යක්ෂම භාවය කමිටුව විසින් සමලෝචනය කළ යුතුය.	ඒ ඒ කමිටුවලින් පවසා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක සීමාවන් තුල පිහිටා විශේෂිත අවදානම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු සිදු කිරීම මෙන්ම කළමනාකරණය කිරීමේ දී කමිටුව විසින් කළමනාකරණ මට්ටමේ කමිටුවල සඵලදායී බව පිළිබඳ වාර්තා සමාලෝචනය කරනු ලැබේ.
(ඉ) යාවත්කාලීන කල ව්‍යාපාරික සංතති සැලසුම් ඇතුළු අවදානම් කළමනාකරණ පිළිබඳ සියළු අංශ අගැයීම පිණිස කමිටුව යටත් පිරිසෙයින් ත්‍රෛමාසිකව රැස්විය යුතුය.	කමිටුව ක්‍රමිකව ත්‍රෛමාසික රැස්වීම් පවත්වන අතර අවශ්‍ය පරිදි හා අවශ්‍යවිට අතිරේක රැස්වීම් නියම කරයි.
(ඊ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට නොහැකිවීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කමිටුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු අතර කමිටුව විසින් නිර්දේශ කරන ලද අයුරු ඒවා නිවැරදි කිරීමේ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ/හෝ විශේෂිත නියෝග නිකුත් කිරීම ද කළ යුතුය.	ALCO සහ ණය කමිටුව වැනි අදාල කමිටු විසින් සියලු විශේෂිත අවදානම් සීමාවන් හඳුනාගන්නා ලදී. තීරණ සාමූහිකව ගනු ලැබේ.
(උ) මණ්ඩලයේ අදහස්, අනුමැතිය/හෝ විශේෂිත නියෝග සඳහා එක් එක් රැස්වීමේ දින සිට සතියක් ඇතුලත කමිටුව විසින් අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.	එක් එක් කමිටු රැස්වීමෙන් අනතුරුව රැස්වීම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලේකම් විසින් මණ්ඩලයේ දැන ගැනීම, අනුමැතිය හා නියෝග පිණිස ඉදිරිපත් කරනු ලැබේ.
(ඌ) නීති රීති, රෙගුලාසි, පාලනාත්මක මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනය හා ව්‍යාපාරික කටයුතුවලට අදාල සියළු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන අනුමත ප්‍රතිපත්ති පිළිබඳව බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීමට අනුකූලතා ශ්‍රිතයක් කමිටුව විසින් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් තෝරාගත් අනුකූලතා නිලධාරියෙක් විසින් අනුකූලතා කටයුත්ත සිදුකොට කාලීනව (periodically) කමිටුවට වාර්තා කළ යුතුය.	නීති රීති, රෙගුලාසි, පාලනාත්මක මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනක්‍රම හා ව්‍යාපාරික කටයුතුවලට අදාල සියළු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන අනුමත ප්‍රතිපත්ති පිළිබඳව බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීමට 'අනුකූලතා ශ්‍රිතයක්' කමිටුව විසින් ස්ථාපනය කොට ඇත. මෙම කටයුත්තට ඒ සඳහාම කැප වූ අනුකූලතා නිලධාරියෙක් ඇති අතර ඔහු කමිටුවට වාර්තා කරයි.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(7) ආශ්‍රිත පාර්ශව ගනුදෙනු 3(7) (ස) මෙම නියෝගයේ කාර්යාර්ථයන් උදෙසා, ඕනෑම තැනැත්තෙකු සමඟ බැංකුව ගනුදෙනු කිරීමේදී ඇතිවන සම්බන්ධතා ගැටුම් විශේෂයෙන්ම, ආශ්‍රිත පාර්ශව යනුවෙන් සලකනු ලබන පහත දැක්වෙන පුද්ගල ගණයන් සමඟ ඇතිවන සම්බන්ධතා ගැටුම් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. (අ) බැංකුවේ ඕනෑම උපකාරක සමාගමක් (ආ) බැංකුවේ ඕනෑම ආශ්‍රිත සමාගමක් (ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂකවරයෙක් (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ඕනෑම අයෙක් (ඉ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුගේ ළඟම නෑදෑයෙක් හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුගේ නෑදෑයෙක් (ඊ) බැංකුවේ වැදගත් සම්බන්ධතාවයක් ඇති නිලධාරියෙක් (උ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂකවරයෙකු හෝ බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුගේ ළඟම නෑදෑයෙක් හෝ එහි වැදගත් කොටස් ප්‍රමාණයක් හිමි තැනැත්තෙක්	ආශ්‍රිත පාර්ශව, ආශ්‍රිත පාර්ශව ගනුදෙනු විධි හා ඒ සම්බන්ධයෙන් ඇතිවන සම්බන්ධතා ගැටුම් වලදී ඒවා වැළැක්වීමට මණ්ඩල සාමාජිකයන්ට දෙනු ලබන හිතකර සහාය වෙනුවෙන් මණ්ඩලය විසින් ලේඛණගත ක්‍රියාවලියක් අනුමත කරනු ලැබ ඇත. ආශ්‍රිත පාර්ශව ගනුදෙනුවල නිරත අධ්‍යක්ෂකවරුන්ගෙන්, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව ඔවුන්ගේ ගනුදෙනු ප්‍රකාශ කරන සේ පොද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ.
3(7) (ii) මෙම නියෝගය මගින් ආවරණය විය යුතු ආශ්‍රිත පාර්ශව සමඟ වන ගනුදෙනුවල ස්වභාවය පහත දැක්වෙන පරිදි විය යුතුය. (අ) මුදල් මණ්ඩලයේ නියෝගයන්හි නිර්වචනය කොට ඇති පරිදි ඕනෑම ආකාරයක නවාතැන් සැපයීම (ආ) තැන්පතු, ණයට ගැනුම් හා ආයෝජන ස්වභාවයෙන් යුත් බැදියාවන් ඇති කිරීම. (ඇ) මූල්‍යමය හා මූල්‍යමය නොවන ඕනෑම ස්වභාවයේ සේවාවක් බැංකුවට සැපයීම හෝ ලබා ගැනීම (ඈ) වෙනත් යම් යම් ආශ්‍රිත පාර්ශවවලට වාසියක් වන අයුරු රහසිගත හෝ සංවේදී තොරතුරු ඔවුන්ට අත්පත් කර ගැනීමට තුඩුදෙන සේ වාර්තා කිරීමේ ක්‍රම හා තොරතුරු ප්‍රවාහයන් නිර්මාණය කිරීම.	මණ්ඩලයේ ක්‍රියාවලිය හා අධ්‍යක්ෂකවරුන්ගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ ප්‍රකාශයට ආවරණය වන ආශ්‍රිත පාර්ශව ගනුදෙනු අර්ථ දැක්වීම්වලට පහත සඳහන් විෂයයන් ඇතුලත් වේ. (i) මුදල් මණ්ඩලයේ නියෝග මගින් අර්ථ දක්වා ඇති පරිදි මොනයම් ආකාරයක හෝ නවාතැන් සැලසීම. (ii) තැන්පතු, ණයට ගැනුම් හා ආයෝජන ස්වභාවයෙන් යුත් බැදියාවන් ඇති කිරීම. (iii) මූල්‍යමය හා මූල්‍යමය නොවන මොනයම් ආකාරයේ සේවාවක් බැංකුවට සැපයීම හෝ ලබා ගැනීම. (iv) වෙනත් යම් යම් ආශ්‍රිත පාර්ශවවලට වාසියක් වන අයුරු රහසිගත හෝ සංවේදී තොරතුරු ඔවුන්ට අත්පත් කර ගැනීමට තුඩුදෙන සේ බැංකුව සහ ඕනෑම ආශ්‍රිත පාර්ශවයක් සමඟ වාර්තා කිරීමේ ක්‍රම සහ තොරතුරු ප්‍රවාහයන් ඇතිකොට පවත්වාගෙන යාම.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(7) (iii) නියෝග 3(7)(1) හි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි බැංකුව සම්බන්ධව කිසිදු පාර්ශවයක් සමඟ ගණුදෙනු නොකරන බවට සහතික වන අතර බැංකුව සමඟ ව්‍යාපාර කටයුතුවල නිරත සෙසු පාර්ශවකාර ආයතනවලට වඩ වඩාත් හිතවත් සේවාවක් ලබාදීම මෙයට ඇතුලත්ය. වඩාත් හිතවත් සේවාවක් යන්න පහත පරිදි නිර්වචනය කොට ඇත. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ, බැංකුවේ මූලික ප්‍රාග්ධනයෙන් ප්‍රශස්ත ප්‍රතිශතය ඉක්මවමින් සම්බන්ධිත පාර්ශවයන්ට ඉඩ පහසුකම් සැලසීම. (ස) ඉඩ පහසුකම් සැලසීම යනුවෙන් අදහස් කළ යුත්තේ උපරිම ඉඩපහසුකම් පිළිබඳව දැක්වෙන 2007 අංක 8 දරණ බැංකු පනතේ නියෝගයෙන් දැක්වෙන පහසුකම්වල උපරිම වටිනාකම. (සස) සම්පූර්ණ පහසුකම්වල වටිනාකම ගණනය කරනු ලබන්නේ මුළු පහසුකම්වලින් මුදල් ඇප හා සම්බන්ධිත පාර්ශව විසින් ආයෝජනය කරන ලද අවු. 5 ක් හෝ ඊට වැඩි කාලයකින් කල් පිරෙන ණය, උපකරණ හා කොටස් ප්‍රාග්ධනය. (අා) බැංකුවේ හොඳම ණය පොලී අනුපාතයට වඩා අවම පොලී අනුපාතයක් අය කිරීම හෝ අසම්බන්ධිත ප්‍රති පාර්ශවයන් සමඟ සමාන ගණුදෙනු සඳහා බැංකු තැන්පතු අනුපාතය ඉක්මවා ගෙවීම. (ඈ) අගැයීම් ක්‍රියාවලියකින් තොරව ආශ්‍රිත පාර්ශව වෙත සේවා ලබාදීම හෝ සේවා ලබා ගැනීමට කටයුතු කිරීම. (ඇ) වාසි සහගත සේවාවන් සැපයීම, අසම්බන්ධිත පාර්ශව සමඟ ඇති කර ගන්නා ලද සාමාන්‍ය ව්‍යාපාර එකඟතා ඉක්මවා වාසිදායක කොන්දේසිවලට අනුව වෙළඳ අලාභ ආවරණය හා/හෝ කොමිස් ගාස්තු ලබාදීම. (ඉ) සම්බන්ධිත පාර්ශව සමඟ සංවේදීව තොරතුරු හෝ රහසිගත තොරතුරු ගලායාම හා වාර්තා කිරීමේ ක්‍රමවේද නඩත්තු කිරීම මෙන්ම අවශ්‍ය කාර්ය සාධනයන්ගේ නීතිමය කටයුතු හා ක්‍රියාකාරකම් වලින් පරිබාහිරව සිදුවේ.	බැංකුවට සමාන ව්‍යාකපාරික කටයුතුවල නිරත බැංකුවේ සෙසු පාර්ශවකාර ආයතනවලට වඩාත් හොඳ සැලකීම් දක්වනු ලබන අයුරින් ඉහත නියෝග 3(7)(ස) හි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි ආශ්‍රිත පාර්ශව සමඟ බැංකුව ගනුදෙනුවල නිරත නොවීම සහතික කොට තිබේ. මීට අමතර වශයෙන් 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගය පරිදි පහසුකම් සැපයීමෙන් (granting accommodation) වලකින ලෙස චක්‍රලේඛ මාර්ගයෙන් දැනුම් දී තිබේ. නියෝගය මගින් දක්වා ඇති පරිදි ''වැඩි සැලකිලි දැක්වීම්'' දැක්වීම පිළිබඳව අන්වේෂණය කිරීමට හා බැංකුව එවැනි කටයුතුවල නිරත නොවීම සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් අනුදත් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කොට තිබේ.
3(7) (iv) අදාල අධ්‍යක්ෂකවරයා හැර මණ්ඩලයේ තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාවක් විසින් ඉඩ වෙන් කිරීම අනුමත නොකොට ඇති කල්හි බැංකුව කිසි අධ්‍යක්ෂකවරයෙකුට මුදල් ලබාදීම නොකළ යුතුය. මුදල් මණ්ඩලය විසින් ද නිර්ණය කරනු ලබන සුරැකුම් මුදල් ලබාදීමේ දී තිබිය යුතුය.	අධ්‍යක්ෂකවරුන්ට හෝ ඔවුන්ගේ සමීප නෑදෑයින්ට මුදල් ලබාදීම පිණිස ක්‍රියාවලියක් දියත් කොට තිබේ. අදාල අධ්‍යක්ෂකවරයා හැර මණ්ඩලයේ තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාවක් විසින් මුදල් ලබාදීම අනුමත කිරීම අවශ්‍ය ය. මෙම පහසුකමේ නියමයන් හා කොන්දේසිවලට ව්‍යාතිරේඛයක් එනම්, මුදල් මණ්ඩලය විසින් ද විටින් විට එය නිර්ණය කළ යුතු බව දැක්වෙන විධි විධානයන්ද ඊට ඇතුලත්ය.

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
3(7)(v) (අ) කිසියම් තැනැත්තෙකුට හෝ ඔහුගේ සමීපතම ඥාතියෙකුට හෝ එකී පුද්ගලයාට සෑහෙන පමණ සම්බන්ධතාවක් ඇති සමාගමකට බැංකුව විසින් ඉඩ පහසුකමක් ලබා දෙනු ලැබ ඇති විටකදී සහ එබඳු තැනැත්තෙකුට බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්කරනු ලැබ ඇති විටෙක බැංකුව විසින් අනුමත කරනු ලබන ඊට අවශ්‍ය සුරැකුම් එකී පුද්ගලයා අධ්‍යක්ෂක තනතුරට පත්වූ දින සිට වසරක් ඇතුලත ලබා ගැනීම සඳහා බැංකුව විසින් කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් සියලු අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශ/දිවුරුම් ප්‍රකාශ ඔවුන්ගේ පත්වීම්වලට පෙරාතුව ලබා ගනී. තවද කිසියම් ගණුදෙනුවක් වේ නම් ඒවාද හෙළිදරව් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම තත්වය මේ දක්වා බැංකුව තුල උද්ගත වී නැත.
(ආ) ඉහත 3(7)(v) (අ) නියෝගයේ දක්වා ඇති කාලය එළඹෙන විටදී එබඳු සුරැකුමක් සපයා දී නොමැති විටදී මුදල් ලබාදීමේ අවස්ථාවේදී නියමකොට දක්වන ලද කාලය තුල හෝ එවැනි අධ්‍යක්ෂකවරයකුගේ පත්වීම් දින සිට මාස 18 ක කාලයක් පිරීමෙන් ඉක්බිතිව එළඹෙන වඩා ආසන්න දිනයේ දී පොලිය සමඟ එවැනි මුදල් දීමකින් පසුව ලැබීමට ඇති මුදල් ප්‍රමාණය අයකර ගැනීමට බැංකුව විසින් ක්‍රියා කළ යුතුය.	මෙම තත්වය මේ දක්වා බැංකුව තුල උද්ගත වී නැත.
(ඇ) ඉහත දැක්වෙන උප නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වන ඕනෑම අධ්‍යක්ෂකවරයෙකු අධ්‍යක්ෂක නිලය අතහැර ගියාසේ සැලකෙන අතර බැංකුව විසින් ඒ බව මහජනතාවට නිවේදනය කළ යුතුය.	මෙම තත්වය මේ දක්වා බැංකුව තුල උද්ගත වී නැත.
(ඈ) මූල්‍ය අනුග්‍රහ ලබාදෙන අවස්ථාවේදී බැංකුවේ සේවකයෙක්ව සිටි අධ්‍යක්ෂකවරයෙකුට මෙම උප නියෝගය අදාල නොවන අතර එම අනුග්‍රහය එකී බැංකුවේ සියලු සේවකයන්ට අදාලවන යෝජනා ක්‍රමයක් යටතේ දෙනු ලැබ ඇත්නම් ද එය අධ්‍යක්ෂකවරයෙකුට අදාල නොවේ.	මෙම තත්වය මේ දක්වා බැංකුව තුල උද්ගත වී නැත.
3(7) (vi) ඉහත සඳහන් නියෝග 3(7)(v) අනුව දී ඇති අනුග්‍රහ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද සුරැකුම් වලින් ආරක්ෂාව සලසා ඇති විටකදී හෝ එබඳු බැංකුවක සේවකයින්ට අදාල වන යෝජනා ක්‍රමයකින් හැරුණු කොට ඕනෑම සේවකයෙකුට හෝ එකී සේවකයාගේ ළඟම ඥාතියෙකු හෝ එම සේවකයා හෝ ඔහුගේ ළඟම ඥාතියා සෑහෙන පමණ සම්බන්ධයක් ඇති ඕනෑම සමාගමක ගාස්තු සහ/හෝ කොමිස් සම්බන්ධයෙන් වඩාත් වාසිදායක සැලකීම් හෝ අනුග්‍රහ බැංකුව විසින් ප්‍රදානය නොකළ යුතුය.	කාර්ය මණ්ඩලයට දෙනු ලබන ප්‍රතිලාභ හැර බැංකු සේවකයින්ට වාසිදායක සැලකීම්/අනුග්‍රහ සලසනු නොලැබේ. වෙනත් සේවකයින්ට හෝ ඔවුන්ගේ සමීප ඥාතීන්ට හෝ සේවකයෙක් හෝ සමීප ඥාතියෙක් සෑහෙන පමණ සම්බන්ධයක් ඇති ඕනෑම සමාගමකට අනුග්‍රහශීලී සැලකීම් දැක්වීම නොකළ යුතු බවට විවිධ මාර්ගවලින් බැංකුවේ සේවකයින් දැනුවත් කර තිබේ.
3(7) (vii) නියෝග අංක 3(7)(ඩ) සහ 3(7)(ඩඍ) යටතේ ප්‍රදානය කරන ලද අනුග්‍රහයක්, එහි කොටසක්, ඊට ලැබෙන පොලිය, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රේෂණය නොකළ යුතු අතර අනුමැතියෙන් තොර එවැනි ප්‍රේෂණ ශුන්‍ය හා හිස් ඒවා බවට පත් කළ යුතුය.	මේ සම්බන්ධයෙන් ගත් කල අද දක්වා බැංකුවේ එවැනි තත්වයක් ඇති වී නැත.
3(8) **හෙළිදරව් කිරීම්** 3(8) (i) මණ්ඩලය පහත සඳහන් කරුණු අනුව ක්‍රියාකරන බවට සහතික විය යුතුය. (අ) අධීක්ෂණාත්මක හා පාලනාත්මක අධිකාරීන් විසින් නියමකොට දක්වන ලද ආකෘතීන් හා අදාල ගිණුම් ප්‍රමිතීන් අනුව වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛමාසික මූල්‍ය වාර්තා	අධීක්ෂනාත්මක හා පාලනාත්මක අධිකාරීන් විසින් නියම කොට දක්වන ලද ආකෘති අනුව වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය

ආයතනික පාලන වගන්තිය හා නීති	අනුකූලතා මට්ටම
පිළියෙල කරන බවට සහ (ආ) එකී ප්‍රකාශ සංක්ෂිප්ත ආකාරයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් පුවත්පත්වල පළකරන බවට මණ්ඩලය සහතික විය යුතුය.	ප්‍රකාශ හා තෙමාසික මූල්‍ය වාර්තා පිළියෙල කොට ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර ඒවා සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.
3(8) (ii) පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ පළ කරන බවට මණ්ඩලය සහතික විය යුතුය. (අ) විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුලත්ව විගණික වාර්ෂික මූල්‍ය ප්‍රකාශ අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා පාලනාත්මක නියමතාවන්ට අනුව පිළියෙල කොට ඇති බවට ප්‍රකාශයක්.	කරුණාකර අධ්‍යක්ෂක-වරුන්ගේ වාර්තාව බලන්න (වාර්ෂික වාර්තාව පිටු අංක 37-39)
(ආ) මූල්‍ය වාර්තාකරණ ක්‍රමය පිළියෙල කොට තිබෙනුයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය පිළිබඳව විශ්වසනීයත්වය සාධාරණ ලෙස සහතික කෙරෙන අයුරින් මෙන්ම පරිබාහිර කාර්යාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ තිබෙන්නේ අදාල ගිණුම්කරණ මූලධර්ම අනුව බවත් තහවුරු කෙරෙන ආකාරයට බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇති බවට මණ්ඩලයෙන් වාර්තාවක්.	අභ්‍යන්තර පාලනයන් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තා කරුණාකර බලන්න (වාර්ෂික වාර්තාව පිටු අංක 37-39)
(ඇ) 2008 දෙසැම්බර් 31 දිනට පසුව පිළියෙල කෙරෙන හෝ ප්‍රසිද්ධ කෙරෙන ප්‍රකාශයක් පිළිබඳව ඉහත නියෝග 3(8)(සස) (ආ) හි දක්වා ඇති අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි සඵලදායී බව සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගෙන් සහතිකයක්.	වාර්ෂික වාර්තාව පිටු අංක 76-77
(ඈ) අධ්‍යක්ෂකවරුන්ගේ නම්, යෝග්‍යතාව හා චර්යාව, බැංකුව සමඟ ගණුදෙනු සහ බැංකුව විසින් ගෙවනු ලබන ගාස්තු/පාරිශ්‍රමික පිළිබඳව විස්තර.	පිටු අංක 116 හි සටහන් බලන්න.
(ඉ) එක් එක් සම්බන්ධිත පාර්ශවයට, 3(7)(iii) මගින් අර්ථ දක්වා ඇති අයුරින්, සලසන ලද අනුග්‍රහ එක් එක් සම්බන්ධිත පාර්ශවයට සලසන ලද අනුග්‍රහයන්හි මුළු ප්‍රමාණය බැංකුවේ පාලනාත්මක ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළි දරව් කළ යුතුය.	සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සටහන් සඳහා පිටු අංක 116 බලන්න.
(ඊ) ගෙවන ලද පාරිශ්‍රමික, දෙන ලද අනුග්‍රහ සහ බැංකුව වෙත වූ තැන්පතු හෝ ආයෝජන ආදී වශයෙන් බැංකුව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන ලද සමුච්චිත පාරිශ්‍රමිකයන්හි වටිනාකම සහ ඔවුන් සමඟ කරන ලද ගණුදෙනුවල සමුච්චිත වටිනාකම්.	ගිණුම් පිළිබඳ සටහන් බලන්න. පිටු අංක 116, ගිණුම් පිළිබඳ සටහන් අංක 34
(උ) 2010 ජනවාරි 10 ට පසුව ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික ආයතනික පාලන වාර්තාවෙහි මෙකී නියෝග සම්බන්ධයෙන් දක්වා ඇති අනුකූලතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ සහතිකය.	කරුණාකර පිටු අංක 70-71 බලන්න.
(ඌ) බුද්ධිගෝචර නියමතාවන්ට හා නීති රීති හා රෙගුලාසිවලට හා අභ්‍යන්තර පාලන විධීන්ට අනුකූලවීම හා සැලකිය යුතු කිසියම් අනනුකූලතාවයක් වීනම් ඒවා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග විස්තර කෙරෙන වාර්තාවක්.	පිටු අංක 70-71 බලන්න.
(ඔ) බැංකුවේ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදු වූ දෝෂයන් පිළිබඳව පාලනාත්මක හා අධීක්ෂණාත්මක අයුරින් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.	පිටු අංක 61-69 බලන්න.

අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව

ශ්‍රී ලංකාවේ විශේෂිත බලපත්‍ර ලත් බැංකු සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනතේ 12 වැනි නියෝගය ප්‍රකාරව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සී/ස ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී. මෙම කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලයේ අනු කමිටුවක් වශයෙන් කටයුතු කරන අතර ඊට බැංකුවේ අවදානම් පිළිබඳ කටයුතු කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය සඳහා වූ අනිවාර්ය නීති සංග්‍රහය මගින් නියමකොට දක්වා ඇති රෙගුලාසිවලට අනුකූලවීම සහතික වන අයුරු කටයුතු කිරීම ඇතුළුව අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම් පැවරී ඇත.

කමිටුවේ සාමාජිකයන්

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පහත සඳහන් අධ්‍යක්ෂකවරුන් කමිටුවේ සාමාජිකයන් වශයෙන් පත්කරනු ලැබ තිබේ.

එච්.ජී. සුමණසිංහ මහතා (කමිටුවේ සභාපති)
කෝසල රත්නවීර මහතා (නීතිඥ)
පාලිත ගමගේ මහතා

බැංකුවේ සභාපතිතුමා ක්‍රියාකාරී අධ්‍යක්ෂක රැස්වීම්වලට සහභාගීවන්නේ ආරාධනා කිරීම් මතය. සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල් හා ක්‍රම සම්පාදන), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්), අනුකූලතා නිලධාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් සංවර්ධන හා ආයතනික), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ), කළමනාකරු (නීති කටයුතු) හා සමාගමේ ලේකම් සෙසු ස්ථිර සාමාජිකයෝ වෙති.

බැංකුවේ අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පැවරී ඇති බැවින් වරින් වර ප්‍රතිපත්ති හා උපදෙස් ක්‍රියාත්මක කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු

අවදානම් ඇතිවීමේ හැකියාව අඩු කෙරෙමින් ගනුදෙනුකරුවන්ට උපරිම සේවාවක් සැපයීම සඳහා නිර්මාණශීලී නිපැයුම් සංවර්ධනය කරමින් ව්‍යාපාරික ඒකකවලට සාධනීය ලෙස සහාය සැලසීම මෙහි අරමුණ වේ. තරඟකාරීත්වය ඉදිරියේ අවදානම් කළමනාකරණ හැකියාවන් පිළිබඳ ප්‍රශස්ත තොරතුරු හා දැනුම අත්පත් කර ගැනීම වූ කලී ව්‍යාපාරික ඒකකයේ ශක්තිය හා පරිකල්පනයයි.

කමිටුව තෙමසකට වරක් රැස්වන අතර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාත්මක කළ අවදානම් ඉලක්ක එහිදී සාකච්ඡා කරනු ලබන අතර කළමනාකරණ කමිටුව එහි වත්කම් වගකීම් කමිටුවේ හා ණය කමිටුවේ කාර්ය සාධනයන් සමාලෝචනය කරයි. අවදානම් කළමනාකරණ කමිටුව වෙත කළමනාකරණ තොරතුරු හා දත්ත වාර්තා කරනු ලබයි. එයට ණය ව්‍යුහය, තැන්පතුවල තත්වය, ද්‍රවශීලතා අනුපාත ඇතුලත්ය. එක් එක් දෙපාර්තමේන්තු (ණය, මෙහෙයුම්, මූල්‍ය) විවිධ අවදානම් නිසා ඇතිවන විශේෂිත වූ බලපෑම අධ්‍යයනය කරයි. මෙහිදී අදාළ දෙපාර්තමේන්තු විසින් ස්වාධීනව තොරතුරු අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමුකරනු ලබන අතර එම වාර්තා පිළියෙල කෙරෙන්නේ තෙමසකට වරක්ය.

සමාලෝචනයට අදාල වර්ෂයේදී සහ 2014 ජනවාරි මාසයේදී කමිටුව 4 වතාවක් රැස්වූ අතර ණය ව්‍යුහය, ප්‍රධාන අවදානම් දර්ශක, ද්‍රවශීලතා තත්වය සහ වෙළඳපොල අවදානම සහ බැංකුවේ නෛතික අවදානම් පිළිබඳව සමාලෝචනය කර තිබේ. තවද, කමිටුව විසින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙන් බාහිර වශයෙන් සේවා ලබාගැනීමේ ප්‍රතිපත්තිය, සන්නිවේදන ප්‍රතිපත්තිය, අනුකූලතා ප්‍රතිපත්තිය, ගනුදෙනුකාර ප්‍රප්තිය, රඳවා ගැනීමේ සැලැස්ම හා ආතති පරීක්ෂා ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂය තුලදී කමිටුව විසින් අනුමත කරන ලදී.

බැංකුවේ අවදානම් ව්‍යුහය පුළුල් වශයෙන් ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළඳපොල අවදානම් වශයෙන් වර්ග කළ හැකිය. මීට අමතර වශයෙන් ද්‍රවශීල අවදානම, නෛතික අවදානම,

අනුකූලතා අවදානම හා බැංකුවේ නාමය සම්බන්ධ අවදානම, යනාදිය බැංකුවට අතිරේකව එල්ල විය හැකි අවදානම් වන අතර ඒවා වැලැක්වීම සඳහා ඒවා ගැන වැඩි අවධානයක් යොමු කරන ලදී.

ණය අවදානම කළමනාකරණය කිරීම

ගත් ණය ආපසු ගෙවීමට ණය ගැණුම්කරුවෙකු අපොහොසත් වීම තුලින් ඇතිවන ප්‍රාග්ධන අහිමිවීමක් හෝ මූල්‍යමය ලාභයක් අහිමිවීමක් හෝ ණය ගැණුම්කරු ගිවිසුම්ගත බැඳියාවන් ඉටු කිරීමට අපොහොසත්වීම ''ණය අවදානම'' යනුවෙන් අදහස් වේ. ණය අවදානම් උද්ගත වන්නේ බැංකුවේ සේවාලාභීන්/ප්‍රති පාර්ශවකරුවන් විසින් බැංකුවට ඇති බැඳියාවන් ඉටු කිරීමට අපොහොසත් වීමෙනි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්තිය බැංකුව ක්‍රියාත්මක කරයි. එයින් බැංකුවේ ණය සංස්කෘතිය දැක්වේ. මෙය ක්‍රියාත්මක කෙරෙන්නේ පැහැදිලි මාර්ගෝපදේශ හා ක්‍රියාපරිපාටීන් මගින් දක්වා ඇති ණය ප්‍රතිපත්තිය හරහාය.

ණය අවදානම් වලට ගැනෙන සාමාන්‍ය ක්ෂේත්‍රය

ගෙවීම් පැහැර හැරි ප්‍රමුඛ බැංකුවේ ව්‍යාපාරික කටයුතු 2007 අගෝස්තු 01 දින ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට පැවරීම මගින් එකී බැංකුවේ තැන්පත්කරුවන්ට හා ආයෝජකයින්ට සහන සැලසීමේ කාර්යභාරය ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට භාර කරන ලදී. මෙම කටයුතු 2010 සැප්තැම්බර් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික සංවර්ධන භාර අරමුදලේ කටයුතුද ඊට පැවරුනි. බැංකුව ණය අවදානමට බලපෑමක් වියහැකි තත්වයන් පිළිබඳ වගකීමට විධායක ණය කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත ණය කමිටුව බැඳී සිටී.

ණය අවදානම බැංකුවේ දැක්ම හා මෙහෙවරෙහි කොටසකි. සමාලෝචිත වර්ෂය තුලදී විශේෂයෙන්ම සූක්ෂම ණය ලබාදීමේදී පාලනාත්මක බලධාරීන් විසින් නිකුත් කොට ඇති මාර්ගෝපදේශ පිළිපදිමින් බැංකුවේ ණය අවදානම අවම වන අයුරින් එම කටයුතු සිදුකරන ලෙස අවධාරණය කරනු ලැබ තිබේ. ''සූක්ෂම ණය ලබාදීමේ ප්‍රධාන බැංකුවක් වීම'' යන දැක්ම මත, දරිද්‍රතාවය පිටුදැකීම හා රැකියා වියුක්තිය පහත හෙලීම සඳහා සූක්ෂම ආයෝජන ප්‍රවර්ධනය පිණිස ණය පහසුකම් මෙයින් ලබාදේ.

විධායක ණය කමිටුවේ ප්‍රධාන අරමුණු

- තිරසාරව ඉපැයීම් වර්ධනය කිරීම
- ස්ථිරසාර අවදානම් කළමනාකරණය තුලින් ණය විනය හා ලේඛණගත කිරීම සහතික කිරීම
- තැන්පතු යෝජනා ක්‍රමය ණය යෝජනා ක්‍රමය ගැලපීම මගින් තැන්පතු පදනම වැඩිදියුණු කිරීමේ හැකියාව
- බැංකුවේ ව්‍යාපාරික කටයුතු හා ප්‍රතිරූපය නැංවීම
- ජාතික සංවර්ධනය සඳහා දායකත්වය

අවදානම් අඩු කිරීම සඳහා ණය කමිටුවේ ප්‍රධාන ක්‍රමෝපායට පහත කරුණු ඇතුලත්ය.

- ඉහල ප්‍රතිලාභ මත පදනම් වූ ණය අනුමත කිරීමට බැංකුවේ ඇති අභිප්‍රාය සීමා කිරීම
- ඉලක්කගත වෙළඳපොලවල් හඳුනා ගැනීම
- රුචි විවිධාංගීකරණය හා සංකේන්ද්‍රණය අන්වේෂණය කිරීම
- ආපසු නොගෙවන අත්තිකාරම් අවම කිරීම සඳහා ණයට දීමේදී දැරීමට සිදුවන ප්‍රාග්ධන පිරිවැය විශ්ලේෂණය කිරීම
- ණය යොමු කිරීම
- එකිනෙක අංශ සඳහා මූල්‍ය සීමා හඳුන්වා දීම
- ගැටළු ඇතිවිය හැකි ගනුදෙනුකාර කණ්ඩායම්වලට නිරාවරණය වීම වැලැක්වීමේ සීමාකාරක
- සීමාව ඉක්මවන ණයට ගැණුම් සීමාකිරීමට ආරක්ෂණ තැන්පතු/සීමා පැනවීම


ණය කමිටුවේ වගකීම් වාර්තා කිරීම

- එක් එක් කමිටු රැස්වීම අවසානයේදී ණය කමිටුවේ කාර්ය පිළිබඳව කමිටුවේ සභාපති විසින් විධිමත්ව ණය කමිටුවට වාර්තා කරනු ලැබේ.
- එම කමිටුවේ වෙනත් කටයුතුවලට අනුව මණ්ඩලයේ ණය කමිටුවට හැඟීයන පරිදි තම නිර්දේශ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් ඇතුළත් ණය කමිටුවට ඉදිරිපත් කළ යුතුය
- තම කාර්යසාධනයන් ව්‍යවස්ථාවට අනුව හා නියමිත කාර්යයන්ට අනුව උපරිම කාර්යක්ෂමතාවයෙන් ඉටුකර ඇති බවට සහතික කිරීමට කමිටුව වාර්ෂිකව තම කාර්යයන් සමාලෝචනය කිරීම හා නිර්දේශ සම්බන්ධව නිසි පියවර ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය යොමුකල යුතුය.

ණය සංකේන්ද්‍රණය

බැංකුවේ ණය ව්‍යුහය පහත දැක්වෙන අයුරු සම්පාදනය වී ඇත.

සක්‍රිය ණය ප්‍රමාණය (2013. 12. 31 දිනට %)



බැංකුවේ ණය ව්‍යුහය බාහිර හා අභ්‍යන්තර සාධක මත රඳා පවතී. විවිධ අංශ හා ව්‍යාපාරික ක්‍රමවේදයන් හරහා තම ණය කළඹ මැනවින් පාලනය කර ගනිමින් පවත්වාගෙන යාමට බැංකුව උත්සාහ දරයි. මෙම විවිධාංගයන්ගෙන් යුත් ගනුදෙනුකරුවන්ට සේවා සැපයීම සඳහා ඊට යෝග්‍ය නිපැයුම් සංකලනයක් යොදා ගැනේ.

2011 සිට බැංකුව ණයදීම ආරම්භ කළ අතර ප්‍රධාන ශාඛාව, මන්නාරම, මාතර හා අනුරාධපුරය යන නගරවල පිහිටි තම ශාඛා වලින් 2013.12.31 දින වන විට දී ඇති ණය හා අත්තිකාරම්වල වටිනාකම රුපියල් මිලියන 1821.6 කි. මීට ඉහත සඳහන් ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ ණය සහ විවිධාංග නිෂ්පාදන ද ඇතුලත්ය.

වෙළඳපොල අවදානම කළමනාකරණය කිරීම

බැංකුවේ වත්කම් හා වගකීම්වලට අදාල වෙළඳපොල පොලී ප්‍රමාණයන් උච්චාවචනය වීමෙන් ඇතිවන බලපෑම වෙළඳපොල අවදානම යනුවෙන් හැඳින්වේ. ස්ථීර ආදායම් ලැබෙන සුරැකුම්වල කෙරෙන ආයෝජන මත එයින් වන බලපෑම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් සැදුම්ලත් වත්කම් වගකීම් කළමනාකරණ කමිටුව දෛනික අවදානම් කටයුතු සමායෝජනය කිරීම හා ඒවා ඉටුකිරීමෙහි නියැලී සිටී. වෙනත් කරුණු අතර

වත්කම් වගකීම් කළමනාකරණ කමිටුව පහත දැක්වෙන කරුණු මාසිකව සමාලෝචනය කරයි.

- පොලී අනුප්‍රමාණ
- ද්‍රවශීල අනුපාතය
- තරඟකාරී පොලී අනුපාතයට එරෙහිව බැංකුවේ පොලී අනුපාතය පිළිබඳව බැංකුව දරණ මතය

වෙළඳපොල අවදානම් කළමනාකරණය උදෙසා පිළියෙල කරන ලද අවදානම් ඉලක්ක මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, ත්‍රෛමාසික පදනමක් මත සමාලෝචනය කරයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මූල්‍ය) නිරන්තරව පොලී අනුපාතික නිරීක්ෂණය කරන අතර ඒවායේ හැසිරීම, අවශ්‍යතා පදනමක් මත සමාලෝචනය කොට තීරණවලට එළඹීම සිදු කරන අතර එම තීරණ වත්කම් වගකීම් කළමනාකරණ කමිටු රැස්වීම් වලදී නිරන්තරව සමාලෝචනය කෙරේ.

ආයෝජන ව්‍යුහය	වසරකට අඩු රු.මිලියන	වසරකට වැඩි රු.මිලියන	ආයෝජිත මුළු ප්‍රාග්ධනය රු.මිලියන	බර තැබීම
භාණ්ඩාගාර බිල්පත්	90.4		90.5	1.7%
ප්‍රතිමිලදී ගැනීම්	628.8		628.8	12.1%
ස්ථාවර තැන්පතු	4,486.5		4,486.5	86.0%
භාර සහතිකපත්		10.0	10.0	0.2%
එකතුව	5,205.7	10.0	5,205.7	100%

වෙළඳපොල නිරතුරුවම අභ්‍යන්තර හා බාහිර කම්පනයන්ට ගොදුරුවන එකක් බැවින් බැංකුවට ලාභ හෝ පාඩු සිදුවිය හැකිය. එබැවින්, පොලී අනුපාත අඩුවීම හා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල වෙළඳපොල අගය අඩුවීම මත කාර්යක්ෂම හෝ ඵලදායී ලෙස අවදානම් / ප්‍රතිලාභ තීරණ ගැනීම පහසුකිරීමට බැංකුව බලාපොරොත්තු වේ. එමනිසා ආදායම් සංවලනය අන්වේෂණය කිරීම අවශ්‍යව ඇත. බැංකුව තම මුළු ආයෝජනවලින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබ ඇත්තේ 1.7% ක් පමණි. ස්ථිර ආදායම් අනුපාත වෙනස්වීම් දිනපතා අධීක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

රජයේ ප්‍රධාන බැංකුවල ස්ථිර තැන්පතු ලෙස රුපියල් බිලියන 4.4 ක් බැංකුව විසින් ආයෝජනය කරනු ලැබ තිබේ. බැංකුවේ මුළු ආයෝජනවලින් 86% ක් ස්ථිර තැන්පතුය. ආයෝජනවලින් ලැබෙන ලාභ උපරිම මට්ටමකට ගෙන ඒම මගින් ප්‍රමුඛ බැංකුවේ තැන්පතුකරුවන්ට ප්‍රතිලාභ ලබාදීමට බැංකුව සහතික විය යුතුව තිබේ. බැංකුවේ ප්‍රධාන ආදායම ලැබෙන්නේ ආයෝජන හා ණය වලිනි. එහෙත් පහත වැටෙන වෙළඳපොල බැංකුවේ පොලී ව්‍යාප්තියට අහිතකර ලෙස බලපා තිබේ.


අක්‍රිය (Non performing) ආයෝජන සඳහා ප්‍රතිපාදන

ආයතනය	ආයෝජන අනුප්‍රමාණය (රු.මිලියන)
වනික් ඉන්කෝපරේෂන්	57.2
පෝර්බිස්	30.0
ප්‍රශ්නගත තැන්පතුව (හබීබ් බැංකුව)	78.4
	165.6
අඩුකලා ප්‍රතිපාදන	(165.6)
	0.0

බැංකුව ඉහත ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ආයෝජන සඳහා 100%ක ප්‍රතිපාදන වෙන්කර ඇත.

බැංකුවේ නිමැවුම් නිරාවරණය

2013.12.31 දිනට බැංකුවේ තැන්පතු පදනම (රු.000' වලින්)



මෙහෙයුම් අවදානම් කළමනාකරණය

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගල හෝ ක්‍රම පද්ධති හෝ බාහිර සිද්ධිවලින් පාඩු උද්ගත වීමේ අවදානම මෙහෙයුම් අවදානම යනුවෙන් අර්ථ දැක්වේ.

සියළු නිමැවුම්, ක්‍රියාකාරකම් සහ ක්‍රම පද්ධති සහ මෙහෙයුම් අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම බැංකුවේ අවදානම් කළමනාකරණ විෂයෙහි මූලිකාංගයක් බවට පත්ව තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමන්ගේ කාර්යභාරය, නිමැවුම්, ක්‍රියාකාරකම් හා ක්‍රම පද්ධතිවල ඵලදායී බව, අධ්‍යක්ෂක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ පිළිබිඹුවක් බවට පත්ව තිබේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය වෙනස්වෙමින් ඉදිරියට යන්නක් වන අතර නිරන්තරයෙන්ම බැංකු වාතාවරණය වෙනස්වීම්වලට භාජන වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු මෙහෙයුම් විසින් ප්‍රතිපත්ති, ක්‍රියාවලි හා ක්‍රම පද්ධතිවල සෑහෙන පමණ ශක්තිමත් බව සහතික විය යුතුය.

මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ අරමුණු

- ප්‍රශස්ත මෙහෙයුම් පාලනයක් සහතික කිරීම
- මෙහෙයුම් අසාර්ථක වීම් වලින් ඇතිවන පාඩු අඩුකිරීම හා විය හැකි පාඩු අඩු කිරීම
- මෙහෙයුම් අවදානම් පිළිබඳව තමන් විසින්ම අවදානම් තක්සේරු කිරීම මගින්, බැංකුවේ ඉහල සිට පහළ කාර්ය මණ්ඩලය, මෙහෙයුම් අවදානම් පිළිබඳව දැනුවත් කිරීම.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා බැංකුවේ එක් එක් ව්‍යාපාරික ශ්‍රිතයන් විසින්, බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් තම මෙහෙයුම් හඳුනා ගැනීම, මැන බැලීම හා පාලනය කිරීම සිදු කිරීම අවශ්‍යය.

අඛණ්ඩ පදනමක් මත ක්‍රියාත්මකවීමේ හැකියාව සහතික කරනු පිණිස මෙන්ම ව්‍යාපාර කටයුතු ව්‍යාකූලවන අවස්ථාවන්හිදී පාඩු සීමා කරගැනීම පිණිස ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ව්‍යාපාරික හා අවිච්ඡින්න සැලැස්මක් හඳුන්වා දී තිබේ.

කළමනාකරණ කටයුතු අධීක්ෂණය

මෙහෙයුම් අවදානම සුවිශේෂී එකක් බව හා එය පාලනය කළ හැකි බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හඳුනා ලැබ තිබෙන අතර ඊට යෝග්‍ය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපරිපාටි හා පරිචයන්, ස්වාධීන විගණන හා එකී යාන්ත්‍රණ සමාලෝචනය කිරීම සිදු කරයි.

මෙහෙයුම් අවදානම් මැන බැලීම

බැංකුවේ මෙහෙයුම් අවදානම් මනිනු ලබන්නේ විශ්වාසය කඩ කිරීම්, අපේක්ෂිත/පුරෝකථනය කරන ලද පාඩු හා ඉදිරියේදී ඇතිවිය හැකි අනපේක්ෂිත තත්වයන් අනුවය. තෙමසකට වතාවක් අභ්‍යන්තර හා බාහිර වශයෙන් වන පාඩු අන්වේෂණය කරනු ලබන්නේ ඒවා වැලැක්වීමේ හා අවදානම්වල බලපෑම සමනය කිරීමටය. මෙම තත්වයන් ප්‍රධාන වශයෙන්ම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රැස්වීමේදී ස්වයං අවදානම් තක්සේරු වාර්තාව හරහා සාකච්ඡා කරනු ලැබේ.

- බැංකුවේ ප්‍රකාශිත අරමුණු කෙරෙහි බලපෑ හැකි බාහිර හා අභ්‍යන්තර සාධක එනම් ආකෘති සංකීර්ණතාවය, ක්‍රියාකාරකම්වල ස්වභාවය, පුද්ගල ගුණාත්මක බව ආයතනික වෙනස්කම් හා සේවක පිරිවැටුම හා බැංකුවේ ප්‍රකාශිත අරමුණු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බාහිර සාධක සලකා බැලීම.
- පාලනය කළ හැකි හා පාලනය කළ නොහැකි මෙහෙයුම් අවදානම් අවස්ථාවන් අතර පැහැදිලි වෙනසක් ඇති කිරීම.
- ස්වයං තක්සේරු මෙහෙයුම් අවදානම් සිද්ධි සංග්‍රහයකට අනුව, එනම්, අභ්‍යන්තර හා බාහිර වංචා, රැකියා නියුක්ති පරිචයන් සහ සේවා ස්ථානයේදී ආරක්ෂාව, සේවා දායක නිෂ්පාදන හා ව්‍යාපාරික පරිචයන්, භෞතික වත්කම්වලට සිදුවන හානි, ව්‍යාපාරික පැතිරීම හා ක්‍රම පද්ධති බිඳ වැටීම් තුලින් මෙහෙයුම් ක්‍රියාකාරකම් මැන බැලීම.

මෙහෙයුම් අවදානම් වාර්තාකරණය

කැපී පෙනෙන අවදානම් නිරාවරණයන්, ස්වයං අවදානම් තක්සේරු වාර්තාව හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට වාර්තා කරනු ලැබේ. මේවාට ඇතුලත්වන කරුණු නම් මෙහෙයුම් හා වංචාකාරී හානි සිදුවීම්, සහ අදාල කාලය තුලදී නිවැරදි කරන ලද කැපී පෙනෙන පාලන බිඳවැටීම් ඇතුලත් වේ. එමෙන්ම මෙහෙයුම් අවදානම් සංකුලතා සමඟ වූ අනෙකුත් ප්‍රශ්ණගත කරුණුද ක්‍රමික පදනමක් මත වාර්තා කෙරේ.

නෛතික අවදානම් කළමනාකරණය

නෛතික ක්‍රියාමාර්ග හා අදාලත්වය සම්බන්ධයෙන් ඇතිවන අවිනිශ්චිත හෝ ගිවිසුම් නීති හෝ රෙගුලාසි අර්ථ දැක්වීම පිළිබඳ පවතින අවිනිශ්චිතතා වලින් නෛතික අවදානම් උද්ගත වේ.

තම සාමාන්‍ය කටයුතුවලදී බැංකුව ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් වන විවිධාකාරයේ අධිකරණ ක්‍රියාමාර්ගවල බැංකුව නිරත වේ. ඇතැම්විට, බැංකුව වගඋත්තරකරු කරමින් වන්දි ඉල්ලීමට පෙළඹෙන, බැංකුවේ කලින් සේවය කළ සේවකයින් ද සිටිය හැකිය.

නීති කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා ආපසු අයකරගැනීමේ කමිටුව සක්‍රිය ලෙස අවදානම් කළමනාකරණයෙහි නිරතව සිටිති.

අනුකූලතාව හා පාලනාත්මක අවදානම් කළමනාකරණය

අර්ථ දක්වා ඇති පරිදි අනුකූලතා අවදානම යනු නීතිරීති, රෙගුලාසි, ආශ්‍රිත පාලනාත්මක සංවිධානවල ස්වයං ප්‍රමිති හා තම බැංකුවේ ක්‍රියාකාරකම්වලට අදාල වන චර්යාධර්මවලට අනුකූලව කටයුතු නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට නෛතික හෝ පාලනාත්මක වශයෙන් බැංකුවේ කීර්තිනාමයට හානියක් ගෙන දෙන ආකාරයේ අවදානම්ය.

වෙළඳපොල හැසිරීම පිළිබඳ විධිමත් ප්‍රමිතීන්වේදැයි නිරීක්ෂණය කිරීම සම්බන්ධතා කළමනාකරණය, ගනුදෙනුකරුවන්ට සාධාරණව සලකමින් රජයේ බදු නිරවුල් කිරීම, ගණුදෙනුකාර සේවාවන්හි යෝග්‍යතාව සහතික කිරීම යන කරුණු බැංකුකරණයට අදාල නීතිරීති හා ප්‍රමිතීන් මගින් ආවරණය වේ.

- පෙර වර්ෂයේ යථෝක්ත නීතිරීති හා ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වූ අවස්ථා සහ ඒවා නැවත සිදුවීම වැලැක්වීමට ගත් ක්‍රියාමාර්ග.
- අනුකූලතා විෂයෙහි ස්වාධීනතාව
- පෙර වර්ෂයේදී නිකුත් කරන ලද සියලු පාලනාත්මක මාර්ගෝපදේශ ලේඛණය හා ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස ගත් පියවර
- අභ්‍යන්තර විගණන, ව්‍යවස්ථාපිත විගණන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පරීක්ෂණ වාර්තා වලින් පෙන්වා දී ඇති අඩුපාඩුකම් නිවැරදි කිරීමේ ප්‍රගතිය හා ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්වය.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

බලාපොරොත්තු නොවන ආකාරයේ පාඩු ඇති නොවන ලෙස බැංකුවේ වත්කම් වලින් අරමුදල් වැඩි කිරීම හා වගකීම් නියමිත අවස්ථාවේදී පියවීම ද්‍රවශීලතාවේ හැකියාව වේ. කෙටිකාලීන තැන්පතු දිගුකාලීන ණය ගෙවීම් නිසා බැංකුව ව්‍යාපාරික ස්වභාවයෙන් මෙන්ම සමස්තයක් වශයෙන් ගත්කළ වෙළඳපොලට එයින් බලපෑමක් එල්ලවේ.

ද්‍රවශීලතාව පාලනය කිරීම වූ කලී භාණ්ඩාගාර කටයුත්තට අදාලව පවත්නා පැහැදිලි වගකීමක් නොවේ. ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය තුල සඵලදායී ලෙස අධ්‍යක්ෂක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අධීක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්‍රවශීලතා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වත්කම් වගකීම් කළමනාකරණ කමිටුව වෙත පැවරී ඇති අතර, එකී ප්‍රතිපත්තිය තුල ඊට උපදෙස් ලබාදී තිබෙන අතර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපරිපාටි හා පරිචයන් සමාලෝචනය කිරීමද එයට අයත් වේ.

ද්‍රවශීලතා කළමනාකරණයේ කාර්යභාරය

- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය පිණිස බැංකුවට ශක්තිමත් ක්‍රියාදාමයක් තිබිය යුතු අතර එයින් ප්‍රමාණාත්මක උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රවශීල වත්කම් ද ඇතුළුව අනාරක්ෂිත හෝ ආරක්ෂිත මූල්‍යකරණ ප්‍රභවයන් හානිවීම් හෝ අපචයවීම් ද පවත්වාගෙන යන බව සහතික කළ යුතුය.
- බැංකුව විසින් තමන්ගේ ව්‍යාපාරික ක්‍රමෝපායට හා තම මූල්‍ය ක්‍රම පද්ධතියට යෝග්‍ය ද්‍රවශීලතා අවදානමට ඔරොත්තු දීමේ තත්වය පැහැදිලිව ගණනය කළ යුතුය.
- අවදානමට ඔරොත්තු දීමේ හැකියාව අනුව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම පිණිස ක්‍රමවේදයක්, ප්‍රතිපත්ති හා පරිචයන් මණ්ඩලය විසින් හා බැංකුවේ සංයුක්ත ද්‍රවශීලතා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් නිර්මාණය කළ යුතු අතර ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගන්නා බව ද සහතික කළ යුතුය.
- සංයුක්ත ද්‍රවශීලතා පිරිවැය, ඵලදාව, අභ්‍යන්තර මිලකිරීමේ අවදානම හා කාර්යසාධනය බැංකුව හඳුනා ගතයුතුය. සාමාන්‍ය ව්‍යාපාරික අංශයන් ඵලදායී ලෙස විවිධාංගීකරණය කිරීම සඳහා බැංකුව විසින් මූල්‍ය සම්පාදන ක්‍රමෝපායක් ස්ථාපනය කිරීමට නියමිතය.

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්

බැංකුවේ ද්‍රවශීලතා අවදානම් තත්වය හඳුනා ගැනීම, මැනීම, අන්වේෂණය කිරීම සහ පාලනය කිරීමට බැංකුවේ ඇති හැකියාව :-

(ආ) වත්කම් හා වගකීම්වල අනාගත මුදල් ප්‍රවාහ
(ආ) අවිනිශ්චිත ද්‍රවශීලතා ඉල්ලුම සඳහා ප්‍රභවයන් හා ශේෂපත්‍රයෙන් පරිබාහිර තත්වයන් සමඟ සම්බන්ධව තිබෙන ප්‍රේරකයන්
(ඇ) ලිපි හුවමාරු, භාර සහ නිරවුල් කටයුතු

ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සුවිශේෂී වූ වෙළඳපොල සිසාරා පවතින කථින ද්‍රවශීලතා කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා බැංකුවේ හැකියාව වර්ධනය කරන විකල්පමය මූල්‍ය සම්පාදන ප්‍රභවයන් බැංකුව විසින් හඳුනාගැනීම අවශ්‍ය ය. ද්‍රවශීලතා කම්පනයේ ස්වභාවය හා කාලසීමාව අනුව මූල්‍ය සම්පාදන හැකියාව ඇති ප්‍රභවයන්ට පහත දැක්වෙන දේ ඇතුලත් වේ.

- තැන්පතු වර්ධනය
- බැඳියාවන්හි කල්පිරීම් දිගු කිරීම
- කෙටිකාලීන හා දිගුකාලීන ණය සාධනපත්‍ර අළුතින් නිකුත් කිරීම
- වත්කම් ආරක්ෂණය
- නිර්භාද, ඉහල ද්‍රවශීලතාවක් ඇති වත්කම් ප්‍රතිමිලදී ගැනීම් හෝ විකිනීම
- වෙනත් රජයේ ආන්තික ණයට දීම් පහසුකම් වලින් ණයට ගැනීම

අදාල නිලධාරීන් හා කමිටු විසින් ද්‍රවශීලතා තත්වය පහත සඳහන් පරිදි අන්වේෂණය කරනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මූල්‍ය) බැංකුවේ ද්‍රවශීල තත්ත්වය අන්වේෂණය කරයි.
- ද්‍රවශීලතාවන්හි වෙනස සමාලෝචන කරමින් වත්කම් වගකීම් කළමනාකරණ කමිටුව විසින් ද්‍රවශීලතා අනුපාතය නිරීක්ෂණය කරයි.
- විවිධ කල්පිරීම් කාල සහිත තැන්පතු ක්‍රම හඳුන්වාදීම සහ සංවර්ධනය කිරීම.
- විවිධ නැවත ගෙවීමේ කාල ඇති ණය ප්‍රදානයන් සිදු කිරීම.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ දුර්වලතා හෝ අධික ද්‍රවශීලතා අවදානම් පහත දැක්වෙන ඒවාට ඇතුලත් වේ.


- මධ්‍යගත දත්ත පදනම, අභ්‍යන්තර ප්‍රතිපත්ති පද්ධති වර්ධනය තුලනය මගින් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට ගන්නා ලද පියවර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට හෝ අධ්‍යක්ෂක මණ්ඩලයට වාර්තා කිරීම.
- ද්‍රවශීලතා අඩුපාඩු අවම කර ගැනීම සඳහා බැංකුව විසින් පියවර ගැනීම -

  උදා:- මූල්‍ය සම්පාදන අඩුපාඩුකම් අඩුකිරීම හෝ නිර්භාද, උසස් ද්‍රවශීල වත්කම් සංචිතයක් පවත්වා ගැනීම

ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මූල්‍ය) නිරතුරුව බැංකුවේ ද්‍රවශීලතා තත්වය නිරීක්ෂණය කරයි. කෙටිකාලීනව බැංකුව ද්‍රවශීලතාවන්ට මුහුණ නොදෙන බවත් බැංකුවට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් තිබෙන බවත් බැංකුවේ කළමණාකාරිත්වය හඳුනාගෙන ඇත.

වාර්තා වී ඇති, 2013.12.31 ට බැංකුවේ ආයෝජන විෂයාංගය පහත දැක්වේ.

ආයෝජන (වර්ග අනුව)



තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

ව්‍යසනයක් හේතුකොට ගෙන ඇතිවන පරිගණක පද්ධතියේ සිදුවන බිඳවැටීමක්, සොරකම් කරන ලද මෘදුකාංග, වයිරස, බාල මෘදුකාංග භාවිතා කිරීම ආදිය නිසා මෙම අවදානම සිදුවේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ තාක්ෂණ කමිටුවේ වගකීම වන්නේ එවැනි අවස්ථාවන්හිදී වහාම ඒවාට පිළියම් යෙදීම හා එකී සංකූලතා වැලැක්වීම සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තීන් කලින් කලට සමාලෝචනය කිරීමය. පරිභෝග මිත්‍රශීලී සේවාවක් කාර්යක්ෂමව හා ඵලදායීව සැපයීම

අරමුණුකොට ගෙන බැංකුව විසින් නව වෙබ් අඩවි තොරතුරු තාක්ෂණ පද්ධතියක් මිලදීගෙන තිබේ.

ක්‍රමෝපායීය අවදානම් කළමනාකරණය

තැන්පතුකරු හා පාර්ශවකරු වටිනාකම් ආරක්ෂා කිරීමේ අරමුණු හා ක්‍රමෝපාය සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවට ඇති හැකියාව අඩාල කරවන ආකාරයේ අභ්‍යන්තර හා බාහිර අවදානම්, අවිනිශ්චිතතාවන් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රමෝපායීය අවදානම් කළමනාකරණය යනුවෙන් හැඳින්වේ.

ඒ අනුව, බැංකුවේ පාරිභෝගික වටිනාකම් මත එල්ලවන මෙහෙයුම් අවදානම්වල බලපෑම අවම කිරීමේ අරමුණු ඇතිව මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සම්පාදනය කරනු ලැබ තිබේ.

ප්‍රසිද්ධිය පිළිබඳ අවදානම් කළමනාකරණය

අතිරේක මූල්‍ය වටිනාකම් හා ව්‍යාපාරික සාර්ථක භාවයන් මත ප්‍රසිද්ධිය ගණනය කිරීම සිදුකෙරේ.

සාම්ප්‍රදායික අවදානම් තත්වයන්හි බලපෑම සෑහෙන පමණ පවතින අතර ප්‍රසිද්ධි අවදානම වඩාත් හානිකර වන අතර නැතිවී ගිය ප්‍රසිද්ධිය නැවත ගොඩනඟා ගැනීමට සමාගම්වලට අවුරුදු ගණන් ගතවේ. බොහෝ සාධක පදනම් කරගෙන බැංකුවේ ප්‍රසිද්ධිය පසුගිය වර්ෂයන්හිදී වැඩිවී ඇත.

- සන්නිවේදන ක්‍රමයේ සිදුවන පරිවර්තන හේතු කොට ගෙන තොරතුරු ක්ෂණයෙන් හා පුළුල් අයුරින් ලබාගැනීමට ඉඩ සැලසී ඇත.
- බාහිර වශයෙන් සේවාවන් ලබා ගැනීමට තුඩුදෙන වඩාත් සංකීර්ණ වූ සැපයීම්දාම හේතුකොට ගෙන තුන්වැනි පාර්ශවයන්ගෙන්, ආයතනයේ කීර්තියට හානියක් සිදුවීමේ අවදානම වැඩි කරයි.
- සමාගම් තුලින් පොදු මහජනතාව තුල වෙනස් බලාපොරොත්තු ඇතිවීම
- ව්‍යාපාරික තීරණ ගැනීම කෙරෙහි වඩාත් සක්‍රීය හා උපදේශක සංවිධාන තුලින් බලපෑමක් එල්ලවීම.

විශාල ප්‍රසිද්ධියක් ලැබීම තුලින් බැංකුවට තම වෙළඳපොල වටිනාකම වැඩිකර ගැනීම, බොහෝ තැන්පතු ලබා ගැනීම, නිපුණතා සහිත සේවකයින් ආකර්ෂණය කර ගැනීම, සමාජයෙන් එල්ලවන ප්‍රතිරෝධය අඩුවීම, රෙගුලාසි, අඩුවීම වඩාත් යහපත් නෛතික පරිසරය අවාසිදායක අවස්ථාවන්හි දී සැකයේ වාසිය ලැබීම වැනි ප්‍රතිලාභ බැංකුවට ලැබිය හැකිය. මෙයින් බැංකුවේ කීර්තියට සිදුවන අවදානම කළමනාකරණය කර ගැනීමට ප්‍රමාණවත් දිරියක් ලැබේ.

ක්‍රමෝපාය හා එහි බලපෑම අතර සම්බන්ධය හා ප්‍රසිද්ධිය හා වටිනාකම කෙරෙහි එහි බලපෑම අවබෝධ කර ගන්නා අධ්‍යක්ෂක මණ්ඩලය ව්‍යාපාරික ඒකකයන්හි සිටින ගනුදෙනුකරුවන්ට හා කළමනාකරණ කණ්ඩායම්වලට ප්‍රසිද්ධිය කෙරෙහි තමන් ගත් සක්‍රිය ක්‍රියාමාර්ග තුලින් ඇති වූ බලපෑම පැහැදිලි කරනු ලැබේ.

සමාප්තිය

විශේෂිත ව්‍යාපාරික මෙහෙයුම් හේතුකොට ගෙන බැංකුව විවිධාකාරයේ අවදානම්වලට මුහුණ දේ. Basel II ක්‍රියාරාමුව යටතේ ප්‍රධාන අවදානම් වන්නේ ණය, වෙළඳපොල හා මෙහෙයුම් අවදානම්ය. කෙසේ නමුත් බැංකුවට ද්‍රවශීලතා, නෛතික, අනුකූලතා, තොරතුරු තාක්ෂණ හා ප්‍රසිද්ධි අවදානම් වැනි වෙනත් අවදානම් ද වේ.

ආයතනික කළමනාකරණය, අනුකූලතා නිලධාරී ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය බැංකුවේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් හා මහජන විශ්වාසය වැඩිදියුණු කිරීම පිළිබඳව වගකීම පැවරී ඇත. සමස්ත අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය අවදානම් කළමනාකරණ කමිටුව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර තිබෙන අතර නිසි කාලවේලාවන්ට අනුව අධ්‍යක්ෂක මණ්ඩලයට වාර්තාකොට තිබේ.

අනුකූලතා වාර්තාව 2013

වැදගත් මූල්‍ය පාඩු හා බැංකුවේ ප්‍රසිද්ධියට හානිකර දේවල්වලට තුඩුදෙන අයුරින්, නීතිරීති, රෙගුලාසි, බැංකුවේ ප්‍රමිතීන්ට හා බැංකු කටයුතුවලට අදාල යහපාලන කටයුතුවලට අනුකූලව කටයුතු කිරීම නිසා උද්ගතවන අවදානම් ඇතිනොවන සේ අධීක්ෂණය කිරීම අනුකූලතාවය ලෙස නිර්වචනය කෙරේ.

බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරික කටයුතුවලදී ප්‍රශස්ත ආදර්ශ සපයන විටදී කාර්යක්ෂම අනුකූලතාවන් නිර්මාණය වේ. එමෙන්ම අනුකූලතාවයට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනවරත අවධානය යොමුකරනු ලැබිය යුත්තේ බැංකුව තුල ඇතිවිය යුතු සංස්කෘතිය පදනම් වූ ඉහල අවංකභාවයක් හා ඒකාග්‍රතාවයක් උදෙසාය. අනුකූලතාව වූ කලී අනුකූලතා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේම රාජකාරියක් පමණක් නොවිය යුතු අතර එය බැංකුවේ එක් එක් සේවකයාගේ වගකීම වන්නේය.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්තිය තුල ඒකාග්‍රතාව හා අවංකභාවය පිළිබඳ ප්‍රමිතීන් අවධාරණය කොට තිබේ. බැංකුවේ අනුකූලතා ශ්‍රිතය අවදානම් කළමනාකරණ විෂයාංගය යටතේ අනුකූලතාව සංවිධාන කොට තිබේ. අනුකූලතා දෙපාර්තමේන්තුව ස්වාධීන දෙපාර්තමේන්තුවක් වන අතර බැංකුව එහි ස්වාධීනතාව තහවුරු කොට තිබේ.

අනුකූලතා දෙපාර්තමේන්තුවේ වගකීම් පැහැදිලිව නිශ්චිත වශයෙන් දක්වා ඇති අතර ඒවා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාලීන විගණනයන්ට හා ස්වාධීන සමාලෝචනයට බඳුන් වේ.

අනුකූලවීමේ කාර්යභාරය බැංකුවේ කාර්ය මණ්ඩලය වෙත පවතී. අනුකූලවීමේ වගකීම් ආයතනයේ සාර්ථකභාවය කෙරෙහි බලපාන අතිශය වැදගත් සාධකයක් වන අතර එය විශේෂඥයින් කොටසකට භාර කිරීමට නොහැකි දෙයක් වන අතර කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම එහි වගකීම දැරිය යුතුය. අනුකූලතා 'ප්‍රධානියා' යනු බැංකුවේ අනුකූලතා අවදානම් හඳුනාගැනීම, සමායෝජනය හා කළමනාකරණය මෙන්ම සෙසු අනුකූලතා නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම පිණිස වූ නිලධාරියෙකි. තවද, නව අනුකූලතා නීතිරීති, රෙගුලාසි හා කාර්ය මණ්ඩල ප්‍රමිතීන් නව ප්‍රවනතාවන්ට අනුව යාවත්කාලීන කිරීම ඔහුගේ කාර්යභාරය වේ.

2013 පැනවූ නව රෙගුලාසිවලට අනුකූලවීම

දිනය	රෙගුලාසි/නියෝග/තීරණ	ප්‍රමිතිය
2013.02.11	බැංකුවේ විගණනය කළ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා ප්‍රසිද්ධ කිරීම.	අනුකූලව කටයුතු කර ඇත.
2013.04.04	බලපත්‍ර ලත් විශේෂිත බැංකු හා බලපත්‍ර ලත් වාණිජ බැංකු කොටස් වෙළඳපොලට නිරාවරණයවීම සම්බන්ධයෙන් වූ 2013 බැංකු පනතේ 01 නියෝගය	අනුකූලව කටයුතු කොට ඇත.
2011.04.05	1988 අංක 30 දරණ බැංකු පනතේ 86 වගන්තිය යටතේ නෛතික දේපොල පිළිබඳ නිර්වචනය	අනුකූලව කටයුතු කොට ඇත.
2013.06.07	ණයපත්, වෙනත් ණය හා අත්තිකාරම් වෙනුවෙන් පොලී අනුප්‍රමාණ	අනුකූලව කටයුතු කොට ඇත.
2013.06.26	සංචිත අවශ්‍යතා	අනුකූලව කටයුතු කොට ඇත.
2013.07.26	බලපත්‍ර ලත් බැංකු විසින් ණය හා අත්තිකාරම් මත දණ්ඩන පොලී අයකිරීමේ සීමා	අනුකූලව කටයුතු කොට ඇත.
2013.07.31	බලපත්‍ර ලත් වාණිජ බැංකු හා බලපත්‍ර ලත් විශේෂිත බැංකු සඳහා වූ අධීක්ෂණාත්මක සමාලෝචන ක්‍රියාවලිය (Pillar 2 of Based II) පිළිබඳ 12013 අංක 05 දරණ බැංකු පනතේ නියෝගය.	අනුකූලව කටයුතු කොට ඇත.
2013.09.07	මූල්‍ය ප්‍රකාශණ හා වෙනත් හෙළිදරව් කිරීම් වෙබ් අඩවියේ පළ කිරීම.	අනුකූලව කටයුතු කොට ඇත.
2013.11.08	නොමගයවන හා සදාචාරාත්මක නොවන වෙළඳ දැන්වීම්	අනුකූලව කටයුතු කොට ඇත.
2013.12.05	1988 අංක 30 දරණ බැංකු පනතේ 86 වැනි වගන්තිය යටතේ නෛතික වත්කම් නිර්වචනය කිරීම.	අනුකූලව කටයුතු කොට ඇත.

මානව සම්පත් සංවර්ධනය හා ආයතනික කටයුතු

1. මානව සම්පත් හා වැටුප් කමිටුව.

1.1 කමිටුවේ විෂය පථය

මණ්ඩලය විසින් පත් කරන ලද බලතල සහිත කමිටුව විසින් බැංකුවේ සියළු කැපී පෙනෙන මානව සම්පත් හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති සමාලෝචනය කළ යුතුවේ. කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික තීරණය කරනු ලැබේ. ප්‍රධාන කාර්ය සාධන ඉලක්ක, ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා පිළියෙල කිරීම සහ ඔවුන්ගේ කාර්ය සාධන අගැයීම පිළිබඳ වගකීම කමිටුව වෙත පැවරී ඇත.

1.2 සාමාජිකයින්

මණ්ඩලය විසින් පත් කරන ලද මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

ප්‍රියංග අල්ගම මහතා - සභාපති
පාලිත ගමගේ මහතා - අධ්‍යක්ෂක
එස් පරාක්‍රම පෙරේරා මහතා - අධ්‍යක්ෂක

ප්‍රියංග අල්ගම මහතා කමිටුවේ සභාපති වශයෙන් ක්‍රියාකළ අතර මානව සම්පත්/ආයතන ජ්‍යෙෂ්ඨ කළමනාකරු එහි ලේකම් වශයෙන් කටයුතු කළේය.

1.3 රැස්වීම්

2013 වර්ෂය තුල රැස්වීම් 12 ක් පවත්වන ලද අතර අධ්‍යක්ෂක මණ්ඩලයට කෙරුණු සියලු නිර්දේශ ක්‍රියාත්මක කරන ලදී.


අධ්‍යක්ෂකගේ නම	පැවැත්වූ රැස්වීම්	
	ගණන	සහභාගීත්වය
ප්‍රියංග අල්ගම මහතා	12	11
පාලිත ගමගේ මහතා	12	11
එස්. පරාක්‍රම පෙරේරා මහතා	12	11

2. ප්‍රධාන කටයුතු

(අ) 2013 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ බැංකු පහසුකම් වෙනුවෙන් පවතින ඉහළ ඉල්ලුම් ප්‍රවනතාවයට ගැලපෙන වඩාත් සුදුසු තැනැත්තන් බඳවාගෙන බැංකු ජාලය ව්‍යාප්ත කිරීමට උර දීමය. වර්ෂය තුලදී 'අනුකූලතා නිලධාරී' බැංකුවට සම්බන්ධ විය.

2013 ජනවාරි 01 දිනට සිටි කාර්ය මණ්ඩලයේ මුළු ගණන 75 ක් වූ අතර වර්ෂය අවසාන වනවිට එය 89 ක් දක්වා වැඩි විය.

(අ) විධායක මට්ටමේ කළමනාකාරිත්වයේ අධ්‍යාපනික/වෘත්තීමය පසුබිම පහත දැක්වේ.



(අ) නව අභියෝගවලට මුහුණදීම සඳහා බාහිරව පුහුණුව හා සංවර්ධනය සැලසීම අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍රය විය. ලබාදුන් පුහුණුව පිළිබඳ විස්තර පහතින් වෙන වෙනම දක්වා ඇත.

	පැය	සහභාගී වූ ගණන
ණය	80	17
මූල්‍ය කළමනාකරණය හා විගණනය	166	104
බැංකු මෙහෙයුම්	62	67
මානව සම්පත් හා සාමාන්‍ය කළමනාකරණය	281	132
තොරතුරු තාක්ෂණය	19	48
නෛතික	33	09
අවදානම් කළමනාකරණ	84	09

නිලධාරීන් දෙදෙනෙකු විදේශ පුහුණුව ලැබූහ. කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම පිණිස බැංකු කටයුතු හා ආශ්‍රිත විෂයයන් පිළිබඳව බැංකු ආයතනය තුලම ඔවුන්ට පුහුණුවක් ලබාදෙන ලදී.

ගණුදෙනුකරුවන්ට ඵලදායී සේවාවක් ලබාදෙනු පිණිස රාජ්‍ය භාෂා ප්‍රවීනතා ප්‍රතිපත්තියට අනුව බැංකුව තුල දෙමළ භාෂා පන්ති නොකඩවා පවත්වන ලදී.

උසස් අධ්‍යාපන කටයුතු විශේෂයෙන් බැංකුකරණය හා සන්නිවේදනය පිළිබඳ නිපුණතා ඇති සේවකයින්ට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය හා කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන විභාග සම්පූර්ණ කර ගැනීම සඳහා අනුග්‍රාහක මුදල් පිරිනමයි.

උසස් අධ්‍යාපන කටයුතුවල නියැලි සීමාවාසික තැනැත්තන්ට, සමාජ වගකීමක් ලෙසින් පුහුණු අවස්ථා ලබාදීම.

(ඇ) බොහෝ කලක් අඩුපාඩුවක්ව පැවති අනුකූලතා ශ්‍රිතය ස්ථාපනය කිරීම

(ඈ) 2013 දී පහත දැක්වෙන ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන ලදී.

රඳවාගැනීමේ සැලැස්ම
ප්‍රසාද දීමනා ප්‍රතිපත්තිය
පිටතින් සේවා ලබා ගැනීමේ ප්‍රතිපත්තිය

(ඉ) බැංකුවේ වර්ධන අදියර තුළදී අත්‍යාවශ්‍ය වන සන්නිවේදනය හා තීරණ ක්ෂණිකව ක්‍රියාවේ යෙදැවීම පහසුකරවනු පිණිස ආයතනයේ ආකෘතිය සාපේක්ෂකව යෝග්‍යව පවතී.

(ඊ) පාරිශ්‍රමික හා වෙනත් ප්‍රතිලාභ සේවකයින්ට ලබාදීම සම්බන්ධයෙන් ලංකා බැංකු සේවකයින්ගේ සංගමය සමඟ සාමුහික ගිවිසුමක් අත්සන් කරන ලදී.

(උ) සෞඛ්‍ය රක්ෂණය, අසාධ්‍ය රෝග රක්ෂණ ආවරණය, පෞද්ගලික අනතුරු රක්ෂණ ආවරණය, කාර්ය මණ්ඩල ණය, මාතෘ පහසුකම් වැඩි කිරීම, ප්‍රසාද දීමනා, පාවිච්චි නොකළ නිවාඩු හිමිකම් සඳහා ගෙවීම් කිරීම හා පුස්තකාල පහසුකම් තුලින් සේවක උත්ප්‍රේරණය ඇතිකොට ඔවුන් සේවාවන් තුල රඳවා ගැනීමට බැංකුව විසින් විවිධ ප්‍රතිලාභ ක්‍රම හඳුන්වා දෙන ලදී.

විගණන කමිටුවේ වාර්තාව

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහභාගීත්වය ආරාධනය මත සිදුවේ. කමිටුවේ ආරාධනය මත විගණකාධිපතිගේ නියෝජිතයෙක්, බාහිර විගණකයිනගේ නියෝජිතයින්, සේවකයින් හා බාහිර උපදේශකයින් පවා රැස්වීම් සඳහා සහභාගී වේ. කමිටුවේ තීරණ සඳහා අවැසි ගණ පූර්ණය කමිටු සාමාජිකයන් දෙදෙනෙකි. වසරකට අවම වශයෙන් තෙමසකට වරක් කමිටුව තෙමසකට වරක් රැස්වන අතර ඇතැම් අවස්ථාවල කමිටු සභාපතිට අවශ්‍යවන පරිදි ද කමිටුව රැස්වේ.

බැංකුවේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර විගණන කමිටු රැස්වීම්වල වාර්තා සටහන් කොට පවත්වා ගෙන යාම ඔහු විසින් කරනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩය විසින් අනුමත කරන ලද විගණන කමිටුව සඳහා වූ නිර්ණේය විෂයන් ප්‍රකාරව, විගණන කමිටු රැස්වීම්වල කටයුතු අධ්‍යක්ෂක මණ්ඩලයට ක්‍රමිකව වාර්තා කරනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේදී එකී කමිටුවලට සහභාගී වූ නිලධාරීන් පහත දැක්වේ.

(1) ප්‍රියංග අල්ගම මහතා
(විගණන කමිටුවේ සභාපති)
(2) තිලක් වන්නිගම මහතා
(විගණන කමිටුවේ සාමාජික)

තිලක් වන්නිගම මහතා විගණන කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් කටයුතු කිරීම 2013 ඔක්තෝබර් 28 දිනෙන් පසු අවසන් විය.

(3) කෝසල රණවීර මහතා
(විගණන කමිටුවේ සාමාජික)
(4) එච්.ජී. සුමනසිංහ මහතා
(විගණන කමිටුවේ සාමාජික)

එච්.ජී. සුමනසිංහ මහතා විගණන කමිටුවට 2013 නොවැම්බර් 25 දින සිට පත් කෙරුණි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමට, අභ්‍යන්තර පාලනක්‍රම ප්‍රමාණවත් බව සළුලදායීත්වය පරීක්ෂා කිරීමට, පාලනාත්මක නියමයන්ට අනුව අනුකූලතාව අගැයීමට, මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමට හා අභ්‍යන්තර හා බාහිර විගණකයන් විසින් ඉදිරිපත් කරන ලද ස්වාධීන වාර්තාවන්හි ඇතුලත් නිරීක්ෂණ හා නිර්දේශ සළකා බැලීමට විගණන කමිටුවට බලය තිබේ. විගණන කමිටුව විසින් අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තාවන්හි අඩංගු වූ මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සමාලෝචනය කරන ලද අතර, බාහිර විගණකයන්ගේ කළමනාකරණ ලිපියේ විශේෂයෙන් දක්වා ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඉන් ඉක්බිතිව බැංකු කළමනාකාරිත්වය විසින් ඊට දක්වා ඇති ප්‍රතිචාර පිළිබඳ පසු විපරම් කරන ලදී. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වාර්තා සාකච්ඡාවට ගන්නා විට ඔවුන් ඊට කැඳවනු ලැබේ. මෙනයින් අභ්‍යන්තර හා බාහිර විගණකයින්ගේ වාර්තා සමාලෝචනය කිරීම සඳහා විගණන කමිටුව සංසදයක් නිර්මාණය කරමින් කැපී පෙනෙන ව්‍යාපාරික අවදානම් කළමනාකරණය කිරීමටත් පාලන ක්‍රම වැඩි දියුණු කිරීම උදෙසා කළමනාකාරිත්වය විසින් කරන ලද 'නිවැරදි කිරීම්' ක්‍රියාමාර්ග හා නිර්දේශ සමාලෝචනය කොට ඒවායේ තොරතුරු වාර්තා කරයි.

විගණන කමිටුව පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීමේ වගකීම්භාරය දරයි.

- මූල්‍ය ප්‍රකාශ, වාර්ෂික වාර්තාව, මාසික ගිණුම් සහ ත්‍රෛමාසික වාර්තාවල සංයුක්ත භාවය අන්වේෂණය කරනු පිණිස බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- බැංකුවේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි ගුණාත්මක භාවය හා ඒවා පිළිගැනීමට

සුදුසුද යන බව මණ්ඩලයට වාර්තා කිරීම.

- ගිණුම් හා මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය හා පාලනාත්මක අනුකූලතාවය සමාලෝචනය කිරීම.
- දුර්වලතා, ක්‍රියාපරිපාටි වලින් බැහැරවීම් හා උල්ලංඝනය කිරීම්, වංචා සහ දෝෂ අවම කිරීම සඳහා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට නිවාරක පියවර ගැනීම සඳහා ආයතනික කළමනාකාරිත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- අනවරත ලෙස අදාල කරගන්නා වූ ව්‍යවස්ථාපිත විධිවිධාන, ගිණුම් ප්‍රමිතීන්, සහ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත්දැයි සහතික කිරීම සඳහා ඒවා ප්‍රකාශයට පත්කිරීමට පෙර සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය අගැයීමකට ලක්කිරීම සහ අභ්‍යන්තර විගණන ප්‍රධානියා පත්කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු හා කාර්ය සාධනය අන්වේෂණය කිරීම.
- බාහිර විගණනය, එහි පිරිවැය හා සඵලදායීබව ඇතුළුව පත්වීම්, වන්දි, සේවයෙන් ඉවත්වීම්, සේවයෙන් පහ කිරීම පිළිබඳව පරීක්ෂාකර බැලීම හා බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය පිළිබඳව අන්වේෂණය කිරීම.
- මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය සහ බාහිර කාර්යාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශ, අදාල ගිණුම් ප්‍රමිතීන් ප්‍රකාරව හා පාලනාත්මක නියමතාවන්ට අනුව පිළියෙල කොට තිබෙන බව සහතික කරනු පිණිස බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සඳහා බැංකුවේ අභ්‍යන්තරික පාලන ක්‍රම පද්ධතියේ සඵලදායීබව සමාලෝචනය කිරීම.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කමිටුව පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

(අ) ප්‍රධාන විනිශ්චයක ක්ෂේත්‍ර

(ආ) ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි කැපී පෙනෙන වෙනස්වීම්

(ඇ) අවසාන විගණනයෙන් උද්ගතවන සීරුමාරු කිරීම්

(ඈ) අඛණ්ඩව ක්‍රියාත්මක වන සමාගමක් බවට වන උපකල්පනයේ වලංගුභාවය

(ඉ) දේශීය හා ජාත්‍යන්තර ගිණුම් හා විගණන ප්‍රමිතීන් හා වෙනත් පාලනාත්මක නියමතාවලට අනුකූලවීම

(ඊ) අවදානම් පිළිබඳ ගැටළුවලට නිසි විසඳුම් ලබාදීමට පියවර ගැනීම හා කළමනාකරණය කෙරේද යන්න සොයා බැලීම.

(ඔ) අභ්‍යන්තර පාලන ක්‍රමපද්ධතිවල සඵලදායී බව.

බැංකුවේ වත්කම් ආරක්ෂා කෙරෙන බවට හා මූල්‍ය වාර්තාවල හෙළිදරව් කොට ඇති පරිදි මූල්‍ය තත්වය හා ප්‍රතිඵල වලින් කිසිදු සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමක් සිදු නොවී ඇති බවට අධ්‍යක්ෂකවරුන්ට සහතික කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන විධීන් සහ ක්‍රියා පරිපාටීන් ද ඒවායේ වැඩි දියුණු කිරීම් ද සිදුවෙමින් පවතින බව කමිටුවේ අදහසයි.

විගණන කමිටුව වෙනුවෙන්

.....

ප්‍රියංග අල්ගම
විගණන කමිටුවේ සභාපති
කොළඹ, ශ්‍රී ලංකාව

අභ්‍යන්තර පාලන තහවුරු වාර්තාව

වගකීම්

බැංකු පනතේ 2007 අංක 11 දරණ නියෝග යේ අංක 3(8)(ii) (ආ) වගන්තිය අනුව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන (Internal Control Report) වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබයි.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත් භාවය සහ සඵලදායී බව පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය ('මණ්ඩලය') වගකිව යුතුවේ.

මෙම තත්වය තුල බැංකුව විසින් මුහුණ පාන ලද කැපී පෙනෙන අවදානම් හඳුනා ගැනීම, අගැයීම හා කළමනාකරණය කිරීම සඳහා අනවරත ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කොට තිබෙන අතර මෙම ක්‍රියාවලියට ඇතුලත්වන දෙයක් නම් ව්‍යාපාරික පරිසරයට හෝ පාලනාත්මක මාර්ගෝපදේශයන්ට සංශෝධන සිදුවන විටදී හා සිදුවන ආකාරයට මූල්‍ය වාර්තාකරණයේදී අභ්‍යන්තර පාලන ක්‍රමපද්ධතිය යොදා ගැනීමයි. මෙම ක්‍රියාවලිය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ට නිකුත් කොට ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මාර්ගෝපදේශ අනුව ක්‍රමිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. එකී මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමපද්ධති අගැයීමේ සිද්ධාන්ත සැලකිල්ලට ගනිමින් මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගැයීමට ලක්කොට තිබේ.

මේ අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය මගින්, මූල්‍ය තොරතුරු, වාර්තා හෝ මූල්‍ය පාඩු හෝ වංචා බරපතල අයුරින් සාවද්‍ය ලෙස සඳහන් කිරීමට එරෙහිව සෑහෙන ප්‍රමාණයකට එහෙත් නියත වශයෙන්ම සහතික විය නොහැකිය.

මූල්‍ය වාර්තාකරණය කෙරෙහි විශ්වාසය තැබිය හැකි බවත් බාහිර කාර්යාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශ, අදාල ගිණුම් මූලධර්ම හා පාලනාත්මක නියමතාවන්ට අනුව පිළියෙල කොට ඇති හෙයින් අභ්‍යන්තර පාලන තුලින් ඒවා තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සැපයෙන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

බැංකුව විසින් මුහුණ දී ඇති අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම මගින් අවදානම් හා ඒවා පාලනය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටින් ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරීත්වයේ සහාය අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබෙන අතර ඒවා සමනය කර ගැනීමට අන්වේෂණය කිරීමට හා මෙහෙයවීමට සුදුසු අභ්‍යන්තර පාලන විධීන් සැලසුම් කරයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳව ක්‍රම හා ඒවායේ ඵලදායීබව සමාලෝචනය කිරීමේදී යොදාගත් ක්‍රියාවලියේ මූලිකාංග.

මූල්‍ය වාර්තාකරණ අභ්‍යන්තර පාලනවිධීන්හි ප්‍රමාණවත් බව හා සංසක්තභාවය සමාලෝචනය කිරීමේ ප්‍රධාන ක්‍රියාවලියට පහත දැක්වෙන දෑ ඇතුලත් වේ.

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල සඵලදායීබව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ කමිටු ස්ථාපනය කොට තිබේ. බැංකුවේ මෙහෙයුම් කටයුතු අනුමතියලත් ආයතනික අරමුණු, ක්‍රමෝපාය හා වාර්ෂික අයවැය, ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝග යනාදියට අනුකූලව සිදුවේ.

- අභ්‍යන්තර පාලන විධීන් බැංකුවේ ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටීන්ට අනුකූලව සිදු කෙරෙමින් පවතින්නේද යන වග සහ ඒවායේ සඵලදායී බව අනවරත පදනමක් මත අභ්‍යන්තර විගණන අංශය පරීක්ෂා කර බලයි. මෙහිදී නියැඳි හා චක්‍රීය ක්‍රියාපරිපාටි සහ අනුකූල නොවීම පිළිබඳ වැදගත් වාර්තා යොදාගනී. සියලු අංශ සහ ශාඛාවන් පිළිබඳව විගණන සිදුකෙරෙන අතර ඒවා කෙරෙන කාල පරතර තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුව තීරණය කෙරෙනුයේ ස්වාධීන හා අපක්ෂපාතී වාර්තාවක් සැකසීමට පිළිවන්වන අයුරිනි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වාර්තාව විගණන කමිටුවට සමාලෝචනය පිණිස

ඉදිරිපත් කරනු ලැබේ.

- ඒ ඒ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු පාලනාත්මක අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගන්නා ලද අභ්‍යන්තර පාලන විධීන් පිළිබඳ කරුණු මණ්ඩලයේ විගණන කමිටුව විසින් සමාලෝචනය කොට අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත්භාවය හා සඵලදායීබව අගය කරනු ලැබේ. එමෙන්ම විගණනයන්හි විෂයපථය හා අභ්‍යන්තර විගණනවල ගුණාත්මකභාවය පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් ඔවුන් අභ්‍යන්තර කටයුතු පිළිබඳව සමාලෝචනය කරති. කාලීන පදනමක් මත විගණන කමිටු රැස්වීම්වල වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. තවද බැංකුවේ විගණන කමිටුව විසින් ඉටුකරනු ලබන කටයුතු විගණන කමිටු වාර්තාවේ 74 සිට 75 දක්වා පිටුවල සඳහන්කොට තිබේ.

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය ඇගයීමේදී හඳුනාගන්නා ලද නිලධාරීන්ට මූල්‍ය ප්‍රකාශවල කැපීපෙනෙන ගිණුම් හා හෙළිදරව් කිරීම්වලට සම්බන්ධතාවයක් දක්වන ක්‍රියාපටිපාටි හා පාලන විධීන් ක්‍රියාත්මක කිරීම පවරා ඇත. මේවා ඉන්ඉක්බිතිව සැලසුම්වල යෝග්‍යතාවය හා ඵලදායීතාවය අනවරත පදනමක් මත අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව නිසින් නිරීක්ෂණය කොට නිවැරදිතාවය පරීක්ෂා කරනු ලැබේ. බැංකුව විසින් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතා කරන ලදී. ඊට LKAS හා SLFRS අඩංගුය.

තහවුරු කිරීම

මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සැලකිය යුතු ලෙස තහවුරු කරනු පිණිස බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම් කරනු ලැබ ඇති බවත් බාහිර කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇති බවත් හා ඒවා සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා මහබැංකුවේ පාලනාත්මක නියාමන අනුගමනය කර ඇති බවත්, ඉහත සඳහන් ක්‍රියාවලිය පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

බාහිර විගණකයන් විසින් ප්‍රකාශ සමාලෝචනය කිරීම

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය බාහිර විගණකයන් විසින් සමාලෝචනය කරනු ලැබ ඇති අතර එය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ සඳහන් වී ඇත. එමගින් ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කොට ඇත්තේ ඔවුන්ගේ දැනුම පරිදි වාර්තාවට අනුකූලව දැක්වෙන කිසිදු කරුණක් ඔවුන් විසින් නිරීක්ෂණය නොකරන ලද බවත් මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන විෂයෙහි මූල්‍ය වාර්තාකරණයේ ආකාරය හා සඵලදායී බව පිළිබඳ සමාලෝචනය පිණිස අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටියෙහි අනනුකූල බවක් ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බවත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ආරියතිලක දහනායක
සභාපති

සනත් වීරතුංග
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

ප්‍රියංග අල්ගම
සභාපති - මණ්ඩලයේ විගණන කමිටුව

ඒඩ්රියන් වීරසේකර
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

සී/ස ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ කොටස්කරුවන් වෙත ඉදිරිපත් කෙරෙන ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

SJMS
ASSOCIATES
Independent Correspondent Firm to
Deloitte Touche Tohmatsu
SJMS Associates
Chartered Accountants
No. 02, Castle Lane,
Colombo 04, Sri Lanka.
Tel:+94(11)2580409, 2503262
Fax:+94(11)2582452

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

මේ සමග ඇති ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශය ඇතුළුව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, කොටස් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙන්ම කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය සහ අනෙකුත් පැහැදිලි කිරීම් සටහන් අප විසින් විගණනය කරන ලදී. 2012 දෙසැම්බර් 31 දිනට වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශ තවත් විගණකයෙකු විසින් විගණනය කොට තිබේ. 2013 ජුනි 28 වැනි දිනැති ඔහුගේ වාර්තාව මගින් සම්පූර්ණ මතයක් ප්‍රකාශකොට තිබේ.

මූල්‍ය ප්‍රකාශ වෙනුවෙන් කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් ප්‍රකාරව මෙකී මූල්‍ය ප්‍රකාශ සාධාරණව පිලියෙලකොට ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරිත්වයේ වගකීමයි. මෙකී වගකීම් භාරයට සැලසුම් කිරීම වංචාසහගතව හෝ වැරදීමෙන් කෙරෙන බරපතල අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශ සාධාරණව පිලියෙලකොට ඉදිරිපත්කිරීමට අදාල අභ්‍යන්තර පාලන විධි ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම, උචිත ගිණුම් ප්‍රතිපත්තීන් තෝරා ගැනීම හා භාවිත කිරීම සහ පවතින තත්ත්වයන්ට අනුව ගිණුම් ඇස්තමේන්තු පිලියෙල කිරීම යනාදිය ඇතුළත්ය.

විගණනයේ විෂය පථය හා මතයට පාදක වූ කරුණු

අපගේ වගකීම වන්නේ අපගේ විගණනය පාදක කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමටය. අපි ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව අපගේ විගණනය සිදුකලෙමු. මූල්‍ය ප්‍රකාශ බරපතල අවප්‍රකාශවලින් තොරව තිබේදැයි සහතිකයක් ලබාගනු පිණිස අපගේ විගණනය සැලසුම් කොට සිදුකල යුතු බව එයින් නියමකොට දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශවල ගණන් හිලව් හා හෙලිදරව් කිරීම් තහවුරු වන සාක්ෂි පරීක්ෂන පදනමක් මත (test basis) ලබාගැනීම විගණනයට ඇතුලත් දෙයක් වේ. තවද විගණන කටයුත්තට ඇතුලත් වන දෙයක් නම් භාවිත කරනලද ගිණුම් සිද්ධාන්ත කළමනාකාරිත්වය විසින් පිලියෙල කරන ලද ඇස්තමේන්තු මෙන්ම මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ත ඉදිරිපත් කිරීම තක්සේරුවකට භාජන කිරීමය.

මතය දැක්වෙන අංක 01 සිට 04 දක්වා ඡේදයන්හි දැක්වෙන කරුණු හැරුණුකොට, විගණනගේ කාර්යාර්ථය සඳහා අපගේ විශ්වාසය හා දැනුම අනුව අවශ්‍ය යයි හැඟීගිය කිසිදු තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. එබැවින් අපගේ විගණනයෙන් මතයක් සඳහා පදනමක් සැපයී ඇති බව විශ්වාස කරමු.

මතය

01. රු. 62,129,296ක් සහ රු. 29,695,404 ක වටිනාකමක් ඇති පිලිවෙලින් 2012 සහ 2011 වර්ෂයන්ට අදාල වන සීරුමාරු කිරීම් කොටස් වෙනස්වීම් ප්‍රකාශයට ඇතුළත් කොට තිබෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් සංචිතවල රු. 91,824,700 ක අඩුවීමක් සිදුවී තිබේ. ඉහත ගැලපීම් වෙනුවෙන් කිසිදු වලංගු කරුණු පැහැදිලි කිරීමක් අපට ලැබී නැත.

02. පහත දැක්වෙන බැංකු සැසඳීම්වල දැක්වෙන හර සහ බැර සටහන් කිරීම් තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නැත. වත්කම් හා බැදියාවන් අත්‍යාධිකව සඳහන්කොට තිබේ. පහත සඳහන් බැංකු සැසඳුම් වාර්තා කිරීමේ දිනට පිලියෙල කිරීමෙන් පසු වැඩිදුර ජර්නල් සටහන් අනුමතකොට තිබෙන අතර ඒ සඳහා අපට නිවැරදි කළ බැංකු සැසඳුම් නොලැබුනි.

බැංකු ගිණුම	සටහන් නොකළ හර රු.	සටහන් නොකළ බැර රු.	පසු ජර්නල් සටහන් Dr/(cr)
මහජනබැංකුව 309100172536876			114,850,000
මහජන බැංකුව 309100158517396		22,070,300	3,280,938
මහජන බැංකුව 078100170000683	28,100,000	32,644,256	(43,200,000)

ඉහත දැ නිවැරදි කරමින් සිදුකරන ගැලපුම් සටහන් පසු කාලයකදී අනුමත කරන ලද බව කළමනාකාරීත්වය විසින් දක්වන ලදී.

03. තවද අන්තර්ශාඛා ජංගම ගිණුම් හා මූලස්ථාන ශාඛාවේ ජංගම ගිණුම් අතර නොසැසඳූ වෙනස්කම් තිබෙන අතර එහි අගය රු.75,367,777ක් වේ. වාර්තා කිරීමේ දිනයෙන් ඉක්බිතිව ඉහත දැක්වූ වෙනස ගලපා තිබේ. කෙසේ නමුත්, රු. 258,744,215 ක අගයකින් යුත් අන්තර්ශාඛා හර සහ රු. 168,654,483ක අගයකින් යුත් ණය ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බව නිරීක්ෂණය නොවීය.

04. තවද, තහවුරු කරන ලද සමස්ත ශේෂය හා ප්‍රතිමිලදීගැනීම් ආයෝජන සඳහා වූ මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂය අතර වූ වෙනස තහවුරු නිසැකව දැනගැනීම සඳහා තහවුරුවක් හෝ ඒවා ඔප්පු කෙරෙන සාක්ෂි අපට නොලැබුනි. විස්තර පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ අනුව ශේෂය	රු. 665,059,735
තහවුරු කිරීම් ප්‍රකාරව මුළු ශේෂය	රු.639,859,735
තහවුරු නොකළ ශේෂය	රු. 2,520,000

05. ඉඩමේ සහ ගොඩනැගිල්ලේ වටිනාකම්, මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම සඳහන්කොට නොතිබිනි. මෙය "දේපොල, පිරියත හා උපකරණ" යනුවෙන් වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිය. 16 අනුව කටයුතු නොකිරීමක් වේ. තවද ගොඩනැගිලි ක්ෂය නොදක්වා තිබුනු අතර වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණය දක්වා වැඩියෙන් සඳහන්කොට තිබේ.

06. ක්‍රම ක්ෂය උපලේඛණය සසඳා බැලීමේදී භාණ්ඩාගාර බැඳුම්කර ආදායම රු. 11,020,164 ක් වැඩියෙන් ප්‍රකාශවී තිබේ.


අපගේ මතයට අනුව මේ දක්වා වූ අපගේ පරීක්ෂාවෙන් පෙනී යන පරිදි (1) සහ (6) ඡේදයන් මගින් දක්වා ඇති කරුණු හා ඒ පිළිබඳ සීරුමාරු කිරීම්වලින් ඇතිවන බලපෑම හැරුනුකොට මූල්‍ය ප්‍රකාශවලින් 2013 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ කටයුතු, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව, සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු වන බව ප්‍රකාශ කරමු.

වෙනත් නෛතික අවශ්‍යතාව පිළිබඳ වාර්තාව

මෙම මූල්‍ය වාර්තා 1988 අංක 30 දරන බැංකු පනතේ නියමතාවන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති අංක 151(2) හි දැක්වෙන නියමතාවන්ට ද අනුකූල බව අපගේ මතය වේ.

එස්. ජේ. එම්. එස්. ඇසෝසිඒට්ස්
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ

2014 වූ ජූලි මස 18 වැනි දින



BEYOND JUST NUMBERS

Financial Statements



ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
ආදායම් ප්‍රකාශය
2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සටහන	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
පොලී ආදායම		996,419,833	742,457,238
පොලී වියදම්		(141,289,063)	(138,840,399)
ශුද්ධ පොලී ආදායම	5	855,130,769	603,616,839
ගාස්තු සහ කොමිස් ආදායම		1,281,863	1,861,168
ගාස්තු සහ කොමිස් වියදම්		(6,854,458)	(6,671,840)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	6	(5,572,595)	(4,810,672)
මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ (අලාභය)/ ආදායම		-	3,925,137
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	7	19,810,424	11,661,150
මුළු මෙහෙයුම් ආදායම		869,368,598	614,392,454
ණය හානිකරණය (ගාස්තු) / ප්‍රතිවර්තනය සහ වෙනත් අලාභ	8	(104,708,881)	132,121,170
ශුද්ධ මෙහෙයුම් ආදායම		764,659,717	746,513,624
කාර්යමණ්ඩල වියදම්	9	(44,043,195)	(43,267,025)
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය සහ හානිකරණය		-	(12,916,832)
වෙනත් වියදම්	10	(104,501,911)	(47,417,725)
එකතු කළ අගය මත බද්ද (වැට්) ට පෙර මෙහෙයුම් ලාභය		616,114,612	642,912,042
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (වැට්)		(64,974,293)	(50,522,187)
එකතු කළ අගය මත බද්ද (වැට්) ට පසු මෙහෙයුම් ලාභය		551,140,319	592,389,855
ආදායම් බදු වියදම්	11	12,088,392	(167,342,068)
වර්ෂය සඳහා ලාභය		563,228,710	425,047,787
කොටසට මූලික ඉපැයීම	12	122.86	92.71

1 - 42 දක්වා වූ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත පූරණය සඳහා අවශ්‍ය කොටසක් නියෝජනය කරයි.



ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

		2013 ශ්‍රී රු	2012 ශ්‍රී රු (නැවත ප්‍රකාශිත)
වර්ෂය සඳහා ලාභය		563,228,710	425,047,787
වෙනත් විස්තීරණ ආදායම්/ (වියදම්) බදු ගෙවූ පසු			
ආයෝජන සුරැකුම්පත් සඳහා ප්‍රතිපාදන ප්‍රතිවර්තනය	13	-	75,000,000
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් නැවත ගණනය කිරීමෙන් ලැබූ ලාභ / (අලාභ)		62,355,250	(41,218,299)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය		(4,243,336)	3,154,652
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්		58,111,913	36,936,353
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		621,340,624	461,984,140



ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සටහන	31.12.2013 ශ්‍රීරු	31.12.2012 ශ්‍රීරු (නැවත ප්‍රකාශිත)	31.12.2011 ශ්‍රීරු (නැවත ප්‍රකාශිත)
වත්කම්				
මුදල් හා මුදල් සමානයන්	15	109,981,171	149,282,062	22,952,777
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	16	780,267,712	610,743,079	1,095,964,916
ණය සහ ලැබිය යුතු දෑ - බැංකුවලින්	17	4,748,996,983	4,936,317,559	3,179,043,891
ණය සහ ලැබිය යුතු දෑ - වෙනත් ගනුදෙනුකරුවන්ට	18	1,895,627,772	1,285,504,432	2,043,865,890
මූල්‍ය ආයෝජන - විකිණීමට සඳහා පවතින	19	111,893,728	135,661,047	176,879,346
දේපළ පිරියත හා උපකරණ	20	120,132,164	115,438,075	119,174,596
ආයෝජන දේපළ	21	83,274,936	83,274,936	6,274,936
ප්‍රවර්තන බදු වත්කම්	26	23,170,556	3,506,190	-
විලම්බිත බදු වත්කම්	22	-	-	108,274,803
වෙනත් වත්කම්	23	138,015,528	22,734,174	30,980,821
මුළු වත්කම්		8,011,360,549	7,342,461,554	6,783,411,975
වගකීම්				
බැංකුවට ගෙවිය යුතු	24	65,148,691	155,463,588	29,102,927
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	25	749,211,486	663,753,822	711,474,154
නිකුත් කරන ලද ණය සුරැකුම්පත් සහ වෙනත් ණය ගැනීම්	27	3,083,640,505	3,098,294,568	3,054,056,690
ප්‍රවර්තන බදු වගකීම්		-	-	13,885,657
වෙනත් වගකීම්	28	280,022,954	150,823,991	130,818,209
මුළු වගකීම්		4,178,023,636	4,068,335,969	3,939,337,637
හිමිකම්				
ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය	29	3,440,679,279	3,440,679,279	3,440,679,279
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	30	106,514,347	78,352,911	52,176,013
ආයෝජන අරමුදල් ගිණුම	31	106,226,336	68,784,990	21,618,978
රඳවාගත් ඉපැයුම්	32	2,324,970,408	1,893,717,112	1,495,790,476
වෙනත් සංචිත	33	(2,145,053,457)	(2,207,408,707)	(2,166,190,408)
මුළු හිමිකම		3,833,336,913	3,274,125,585	2,844,074,338
මුළු හිමිකම සහ වගකීම්		8,011,360,549	7,342,461,554	6,783,411,975
				-
බැඳීම සහ අවිනිශ්චිත අවස්ථා		5,500,000	600,000	-

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල බව සහතික කරමි.

කේ. ඒ. ටී. එම්. දමයන්ති
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය හා සැලසුම්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

1 - 42 දක්වා වූ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත පූරණය සඳහා අවශ්‍ය කොටසක් නියෝජනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

ආරියතිලක දහනායක මහතා	සරත් වීරතුංග මහතා
සභාපති	අධ්‍යක්ෂ
2014 ජූලි 18 වැනි දින	2014 ජූලි 18 වැනි දින

ශ්‍රී ලංකා ඉන්ධිරිකිරීමේ බැංකුව
හිමිකමේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය (නැවත ප්‍රකාශිත)
2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ප්‍රාග්ධනය			සංචිත				
	සාමාන්‍ය කොටස් ශ්‍රීරු	ප්‍රාග්ධන අපේක්ෂිත විභාජනය ශ්‍රීරු	පැවරීමට පෙර ආදායම් හිඟය ශ්‍රීරු	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල ශ්‍රීරු	ආයෝජන අරමුදල ශ්‍රීරු	විකිණීමට ඇති සංචිත අරමුදල ශ්‍රීරු	ආදායම් සංචිත ශ්‍රීරු	එකතුව ශ්‍රීරු
2012.01.01 ට ශේෂය	458,446,600	2,982,232,679	(2,166,190,408)	52,176,013	21,618,978	-	1,497,573,995	2,845,857,857
වැරදි නිවැරදි කිරීමට ගැලපීම්							(4,021,008)	(4,021,008)
2012.01.01 ට නැවත ප්‍රකාශිත ශේෂය	458,446,600	2,982,232,679	(2,166,190,408)	52,176,013	21,618,978	-	1,493,552,987	2,841,836,849
පූර්ව වර්ෂයේ ගැලපීම්	-	-	-	-	-	-	(29,695,404)	(29,695,404)
වර්ෂය සඳහා ලාභය - නැවත ප්‍රකාශිත	-	-	-	-	-	-	425,047,787	425,047,787
වෙනත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	75,000,000	75,000,000
සාධාරණ අගයේ වෙනස්වීම්	-	-	-	-	-	(41,218,299)	-	(41,218,299)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය	-	-	-	-	-	-	3,154,652	3,154,652
ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීම	-	-	-	-	47,166,012	-	(47,166,012)	-
ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම	-	-	-	26,176,898	-	-	(26,176,898)	-
2012.12.31 ට ශේෂය	458,446,600	2,982,232,679	(2,166,190,408)	78,352,911	68,784,990	(41,218,299)	1,893,717,112	3,274,125,585
2013.01.01 ට ශේෂය	458,446,600	2,982,232,679	(2,166,190,408)	78,352,911	68,784,990	(41,218,299)	1,893,717,112	3,274,125,585
පූර්ව වර්ෂයේ ගැලපීම්	-	-	-	-	-	-	(62,129,296)	(62,129,296)
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	563,228,710	563,228,710
වෙනත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-
ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීම	-	-	-	-	37,441,346	-	(37,441,346)	-
සාධාරණ අගයේ වෙනස්වීම්	-	-	-	-	-	62,355,250	-	62,355,250
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය	-	-	-	-	-	-	(4,243,336)	(4,243,336)
ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම	-	-	-	28,161,436	-	-	(28,161,436)	-
2013.12.31 ට ශේෂය	458,446,600	2,982,232,679	(2,166,190,408)	106,514,347	106,226,336	21,136,951	2,324,970,408	3,833,336,913



ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2013 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සටහන	31.12.2013 ශ්‍රීරු	31.12.2012 ශ්‍රීරු
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ			
බද්දට පෙර ලාභය		551,140,319	592,389,855
ගැලපීම :			
පූර්ව වර්ෂයේ ගැලපීම		(62,129,296)	(29,695,404)
ගිණුම් ප්‍රතිපත්තිවල සිදුවූ වෙනස්වීම්		-	(4,021,008)
බද්දට පෙර ලාභයෙහි ඇතුළත් මුදල් නොවන අයිතමයන්	38	101,852,333	(52,122,583)
මෙහෙයුම් වත්කම්වල සිදුවූ වෙනස්වීම්	39	(726,032,478)	(373,322,557)
මෙහෙයුම් වගකීම්වල සිදුවූ වෙනස්වීම්	40	194,474,611	19,303,556
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවූ දායකත්ව මුදල		(368,330)	-
ගෙවූ බදු		(7,575,975)	(76,459,114)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල්		51,361,183	76,072,746
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ			
ආයෝජන දේපළ මිලදී ගැනීම්		-	(77,000,000)
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්		(23,112,178)	(7,592,987)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්		22,765,000	6,705,346
ආයෝජන (කටයුතුවලට යොදවන ලද) කටයුතුවලින් ලද ශුද්ධ මුදල්		(347,178)	(77,887,641)
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ			
යටත් ණයකර ආපසු ගෙවීම		-	-
ආයෝජන (කටයුතුවලට යොදවන ලද)/ කටයුතුවලින් ලද ශුද්ධ මුදල්		-	-
මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		51,014,005	(1,814,895)
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්		(6,181,526)	(6,150,150)
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමානයන්	41	44,832,479	(7,965,045)
		44,832,479	(6,181,526)

1 - 42 දක්වා වූ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත පූරණය සඳහා අවශ්‍ය කොටසක් නියෝජනය කරයි.

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය.

1. සංස්ථාපිත තොරතුරු

1.1 පොදුකරුණු

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2006 ජූලි මාසයේ දී කොළඹ දී සංස්ථාපිත කරනු ලදුව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2008 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී නැවත ලියාපදිංචි කරන ලද සීමාසහිත වගකීම් සමාගමකි. මෙම බැංකුව 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි කරන ලද බලපත්‍රලත් විශේෂිත බැංකුවක් වේ. ලියාපදිංචි කාර්යාලය අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ස්ථානයෙහි පිහිටා ඇති මෙම සමාගමේ ශාඛා කාර්යාල මන්නාරම, මාතර, අනුරාධපුරය සහ බොරැල්ල යන නගරවල පිහිටා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

ඉතිරිකිරීමේ සහ කාලීන තැන්පතු රැස්කිරීම, ණය, කල්බදු, කුලීපිට ගැනුම්, උකස් සහ අනෙකුත් ණය පහසුකම් ලබා දීම සහ ගෙවීම් පැහැර හරින ලද සීමා සහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිෂ්ඨාපනය කිරීම මඟින් සී/ස ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ තැන්පතු වගකීම් නිරවුල් කිරීම සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

1.3 නිකුත් කිරීම සඳහා බලය ලබාදුන් දිනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි මස 18 වැනි දින නිකුත් කිරීම සඳහා බලය ලබාදී ඇත.

2 පිළියෙල කිරීම සඳහා පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

සටහන 3.6 සඳහන් දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති අනුකූලතා නොවීම හැර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර සහ ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.) වලට සහ 1988 අංක 30 දරන බැංකු පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත.

- විකිණීමට ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.
- ප්‍රතිලාභ බැඳීම් යටතේ සඳහන් වගකීම් වර්තමාන අගයට ගණනය කරනු ලැබ ඇත.

2.3 ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය බැංකුවේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

2.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ මූල්‍ය තත්වය පෙන්නුම් කරන අයිතමයන් පුළුල් වශයෙන් ද්‍රවශීල පිළිවෙල අනුව ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයට (ප්‍රවර්තන) මාස 12 ක් ඇතුළත හෝ වාර්තාකරණ දිනය (ප්‍රවර්තන නොවන) පසුවී මාස 12කට වඩා වැඩි කාලයක් තුළ සිදුකරනු ලබන අයකරගැනීම් හෝ නිරවුල් කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශනයේ 41 වැනි සටහනින් ඉදිරිපත් කරනු ලැබේ.

2.5 ප්‍රමාණවත් බව හා එකතු කිරීම්

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ශ්‍රී.ලං.ගි.ප්‍ර . 01ට අනුකූලව සමාන අයිතමයන්ගේ ප්‍රමාණාත්මක අයිතමයන් මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබේ. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයකින් යුත් අයිතමයන් ද ඒවා වැදගත් වන්නේ නම් වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගන්නා ලද මුදල් ප්‍රමාණ හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ වත්කම් ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ උපලබ්ධි කිරීමට සහ ඒ හා සමානව වගකීම් නිරවුල් කිරීමට අභිප්‍රායක් ඇතිවිට පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් මූල්‍ය වත්කම් හා වගකීම් හර කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ නිර්වචනයක් මඟින් හෝ අවසර දෙනු ලැබ නොමැත්තේ නම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් විශේෂයෙන් හෙළිදරව්කොට නොමැත්තේනම් ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වීමට අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක දී සංසන්දනාත්මක තොරතුරු යළි වර්ගීකරණය කරනු ලැබේ.

2.7 වැදගත් ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිත කිරීම

නිසඟ අවිනිශ්චිතතා නිසා වෙනස්වීම සඳහා නම්‍යමතාවයක් දක්වන උපකල්පන භාවිතය සහ අභිමතානුසාරී තීරණ හා සම්බන්ධ වන තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කරගැනීම සඳහා අවශ්‍ය වේ.

කෙසේ නමුත්, අනාගත කාලපරිච්ඡේදය තුළ වත්කමේ හෝ වගකීමේ පවත්වා ගැනීමේ අගය සඳහා වැදගත් තීරණයක් ගැනීමට අවශ්‍ය වන ප්‍රතිඵලයක් ඇතිවීම කෙරෙහි මෙම උපකල්පන සහ ඇස්තමේන්තුවල පවතින අවිනිශ්චිතතාව හේතුවිය හැකිය.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ ක්‍රියාවලියේ දී මූල්‍ය ප්‍රකාශනවල අගයන් හඳුනාගැනීම සඳහා වඩා වැදගත් බලපෑමක් ඇති පහත සඳහන් තීරණ, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පන කළමණාකරණය විසින් ගෙන ඇත.

I. දේපළ සහ උපකරණවල සඵල ආයුකාලය.

සෑම වාර්තාකරණ දිනයක් වන විට වත්කම්වල පවතින ශේෂ අගය, සඵල ආයුකාලය සහ ක්ෂයවීමේ ක්‍රමවේදය පිළිබඳව බැංකුව සමාලෝචනය කරයි. කළමණාකරණයේ තීරණ මෙම අගයන්, ප්‍රමාණ සහ ක්‍රමවේද තක්සේරු කිරීමේ දී ක්‍රියාත්මක කරනු ලබන අතර එමනිසා ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත්වේ.

II. අඛණ්ඩ පැවැත්ම.

අඛණ්ඩ පැවැත්මක් ඇති බැංකුවක් වශයෙන් අඛණ්ඩවම ක්‍රියාත්මක වීම සඳහා බැංකුව සතු සඛ්‍යතාවය පිළිබඳ මණ්ඩලය විසින් තක්සේරුවක් කරනු ලැබ ඇති අතර ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩව නිරතවීම සඳහා අවශ්‍ය සම්පත්, බැංකුව සතුව පවතින බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමකට පත් වී ඇත.

තවද, බැංකුවට අඛණ්ඩව පවත්නා ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රමාණවත් සැකයන් ඇතිවීමට හේතුවිය හැකි තරමේ අවිනිශ්චිතතා පිළිබඳ මණ්ඩලය දැනුවත් නොවන අතර බැංකුවේ මෙහෙයුම් ඇවර කිරීමට හෝ නතර කිරීමට හෝ මණ්ඩලය අදහස් නොකරති. එමනිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවතීමේ පදනම මත දිගින්දිගටම පිළියෙල කරනු ලබයි.

III. ණය සහ අත්තිකාරම් මත හානිකරණ පාඩු

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කළ යුතු හානිකරණ පාඩුවක් පවතින බවට කිසියම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න පිළිබඳව තීරණය කරනු පිණිස සෑම වාර්තාකරණ දිනයක් වන විට බැංකුව තක්සේරු කරයි. කේවල වශයෙන් වැදගත්කමක් ගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් කේවල වශයෙන් ද කේවල වශයෙන් වැදගත්කමක් නොගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් ද හානිකරණ පාඩු තක්සේරු කරනු ලැබේ. වත්කම් වර්ගීකරණය සඳහා සහ හානිකරණ පාඩුව තක්සේරු කිරීම සඳහා කළමණාකරණයේ තීරණය ලබාගැනීම අවශ්‍ය ය. තත්‍ය ප්‍රතිඵලය වෙනස්විය හැකි වුවද හානිකරන පාඩුව තක්සේරු කිරීමේ ක්‍රමවේදය සාධක ගණනාවක් සම්බන්ධයෙන් වන උපකල්පන මත පදනම් වන අතර එසේ පිළියෙල කරන බැවින් අනාගතයේ දී වෙනස් විය හැකිය.

IV. විකුණුම් ආයෝජන සඳහා ලබාගතහැකි හානිකරණය

කොටස් විකුණුම් ආයෝජන සම්බන්ධයෙන් ලබාගතහැකි හානිකරණ පිළිබඳ වෙනස්වීම් ඒවායේ සාධාරණ අගය ඒවායේ පිරිවැයට වඩා සැලකිය යුතු ලෙස හෝ දීර්ඝ ලෙස පහළ යෑමක් පවතින අවස්ථාවක දී ඒ බව බැංකුව වාර්තා කරයි. ''සැලකිය යුතු'' හෝ ''දීර්ඝ'' යන්න නිශ්චය කිරීම සඳහා තීරණයක් අවශ්‍යය. මෙය තීරණය කිරීමේ දී අනෙකුත් සාධක අතර ඓතිහාසික කොටස් මිල සංචලතාවය, කාලපරාසය සහ ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට වඩා කොපමණ ප්‍රමාණයකින් අඩුව පවතී ද යන කාරණා පිළිබඳ බැංකුව අගැයීම් කරයි.

V. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

පාරිතෝෂික බැඳීම් සඳහා වන නියමිත ප්‍රතිලාභ සැලසුම්, පිරිවැය, ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කර නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත සහ අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ පුරෝකථන කිරීම් මෙම ක්‍රමවේදය හා සම්බන්ධ වේ. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා ඇස්තමේන්තු සැලකිය යුතු තරමේ අවිනිශ්චිතතාවයන්ට භාජනය වේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහතින් දැක්වේ. පහතින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කොට ඇති සියලුම කාලපරිච්ඡේදසඳහා එකාකාරයෙන්ම භාවිතාකර ඇත.

3.2 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල්වලට සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවේ ඇති ශේෂ ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල්වලට සමාන දෑ යන්නට ඉහතින් දක්වා ඇති පරිදි මුදල් සහ කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

3.3 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහගණනය කිරීම

3.3.1 හඳුනාගැනීමේ දිනය

සියලුම මූල්‍ය වත්කම් මූලිකව විකුණූ දිනයට හඳුනාගනී. උදා:- බැංකුව මූල්‍ය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත්වන දිනය. මෙයට වෙළඳපොලේ දී රෙගුලාසියකින් හෝ සම්මුතියකින් සාමාන්‍යයෙන් නියම කරන ලද කාලපරිච්ඡේදයක් තුළ වත්කම් බාරදීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිලදීගැනීම් හෝ විකිණීම් එනම් ''නිත්‍ය වෙළඳ ක්‍රමය'' ඇතුළත් වේ.

3.5.2 මූල්‍ය උපකරණවල මූලික ගණනය කිරීම්

මූල්‍ය උපකරණ වර්ගීකරණයේදී මූලිකව හඳුනාගැනීමේ දී වර්ගීකරණය කිරීම ඒවායේ කාර්යයන් සහ ලක්ෂණ සහ ඒවා අත්පත් කරගැනීම සම්බන්ධයෙන් වන කළමණාකරණයේ අභිප්‍රාය මත පදනම් වේ. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයට වාර්තාකර ඇති අවස්ථාවලදී හැර සියලුම මූල්‍ය වත්කම් මූලිකව ඒවායේ ගනුදෙනු පිරිවැය එකතුකොට සාධාරණ අගයට අනුව ගණනය කරනු ලැබේ.

3.5.3 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

ආයෝජන කල්පිරීමට තබා ගැනීම, ණය සහ ලැබිය යුතු සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා ලබාගැනීමට යන වර්ගීකරණ තුනට අනුකූලව බැංකුව විසින් ව්‍යුත්පන්න නොවන වත්කම් හඳුනාගනු ලැබේ.

I. මූල්‍ය ආයෝජන කල්පිරීමට තබාගැනීම

කල්පිරීම සඳහා තබාගන්නා ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් ඇති මූල්‍ය ආයෝජන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. එමෙන්ම බැංකුවට, කල්පිරීම සඳහා තබාගැනීමට අභිප්‍රායක් හෝ හැකියාවක් ඇති වත්කම් ස්ථිර කල්පිරීම් වත්කම් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව කල්පිරීම සඳහා තබාගත් මූල්‍ය ආයෝජන ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය අනුව හානිවීම් අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයේ කොටසක් වන අත්පත් කරගැනීමක් මත වන වට්ටමක් හෝ වාරිකයක් සහ කිසියම් ගාස්තුවක් වේනම් ඒ පිළිබඳ සැලකිල්ල යොමු කොට ක්‍රක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ සඳහන් ''පොලී ආදායම්'' වල ක්‍රමක්ෂය ඇතුළත් වේ. එවැනි ආයෝජන හානිවීම් තුළින් සිදුවන පාඩු කිසිවක් වේනම් ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

කල්පිරීම සඳහා තබාගත් ආයෝජනවල සැලකිය යුතු ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් පරිණත වීමට පෙර (ඇතැම් විශේෂ අවස්ථාවලදී හැර) යළි වර්ග කිරීමට හෝ විකිණීමට බැංකුව අදහස් කරන්නේනම් මුළු ප්‍රමාණයම විකිණීම සඳහා ලබා ගතහැකි ආයෝජන සේ යළි වර්ග කළ යුතුය. තව ද ඉදිරි වර්ෂ දෙක තුළ දී කල්පිරීම සඳහා තබා ඇති මූල්‍ය වත්කමක් වර්ගීකරණය කිරීම බැංකුවට අවසර නොදිය යුතුය.

i. ගනුදෙනුකරුවන්ගෙන් නියමිත ණය සහ ලැබිය යුතු

ගණුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ

- වහාම හෝ නුදුරු අනාගතයේ දී බැංකුව විසින් විකිණීමට අදහස් කරන සහ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව බැංකුව විසින් ලාභ හා පාඩු හරහා සාධාරණ අගයට නම් කරන ලද මූල්‍ය වත්කම්
- මූලික හඳුනාගැනීමෙන් අනතුරුව බැංකුව විසින් ලබා ගතහැකි විකුණුම් ලෙස නම් කර ඇති මූල්‍ය වත්කම් සහ
- ණය පිරිහීම හේතුවෙන් හැර බැංකුව විසින් ප්‍රමාණවත් පරිදි එහි මූලික ආයෝජන සියල්ල නැවත අයකරගනු නොලැබිය හැකි මූල්‍ය වත්කම් හැර ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළඳපොල තුළ මිල නියම කරනු නොලබන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

මූලික ගණනය කිරීමෙන් අනතුරුව ''ගණුදෙණුකරුවන්ගෙන් නියමිත ණය සහ ලැබීම්'' ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් හානිවීම් සඳහා වන දීමනා අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයේ සම්බන්ධ කොටසක් වන අත්පත් කරගැනීමක් මත වන වට්ටමක් හෝ වාරිකයක් සහ ගාස්තු හෝ පිරිවැය කිසිත් වේනම් ඒ පිළිබඳ සැලකිල්ල යොමුකොට ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශනයේ ''පොලී ආදායමට'' ඇතුළත් කරනු ලැබේ. හානිකරණය තුළින් සිදුවන පාඩුව ආදායම් ප්‍රකාශනයේ දී ණය සහ ලැබියයුතු මත ''හානිකරණ ලාබ/(පාඩු)'' වලදී හඳුනාගනු ලැබේ.

බැංකුව එක්තරා ණය දීමනා බැඳීමකට එළඹිය හැකි අතර එහි දී භාවිත මුදල් ප්‍රමාණය මත වන ණය කෙටිකාලයකදී විකිණීමට අදහස් කිරීම නිසා වෙළඳාම සඳහා තබන ලද ණය ලෙස වර්ගීකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ණය දීම සඳහා වන මෙම බැඳීම් ව්‍යුත්පන්න ලෙස සටහන් කරනු ලබන අතර ලාභ හා පාඩු හරහා සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. භාවිත මුදල් ප්‍රමාණය මත වන ණය බැංකුව විසින් රඳවා ගැනීමට සහ කෙටිකාලයකදී නොවිකිණීමට අපේක්ෂා කරන විට බැඳීම් සටහන් කරනු ලබන්නේ එය පාඩු සිදුවීමට ඉඩ ඇති දුෂ්කර ගිවිසුමක් වන අවස්ථාවකදී පමණි.

ii මූල්‍ය වත්කම් විකිණීම සඳහා ලබාගැනීම

මූල්‍ය වත්කම් විකිණීම සඳහා ලබාගැනීම යන්නට හිමිකම් සුරකුම් ඇතුළත්වේ. වෙළඳාම සඳහා තබා ඇතිසේ වර්ගීකරණය නොකරන ලද, ලාභ හා පාඩු හරහා සාධාරණ අගයට නම් නොකරන ලද හිමිකම් ආයෝජන සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ලබාගත හැකි විකුණුම් ලෙස වර්ගීකරණය කෙරේ. කිසිදු ණයක් හෝ ලැබිය යුත්තක් ලබා ගතහැකි විකුණුම් ලෙස බැංකුව විසින් නම්කර නොමැත.

මූලික ගණනය කිරීමෙන් අනතුරුව ලබා ගතහැකි විකුණුම් මූල්‍ය ආයෝජන සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. උපලබ්ධි නොවූ ලාබ සහ පාඩු ''ලබා ගත හැකි විකුණුම් සංචිතයේ'' හිමිකම්වලදී (වෙනත් විස්තීර්ණ ආදායම්) ඍජුවම හඳුනාගනී. ආයෝජනය විකුණන අවස්ථාවේ දී හිමිකම්වලදී කලින් හඳුනාගන්නා ලද සම්මුච්චිත ලාබය හෝ පාඩුව ආදායම් ප්‍රකාශනයේ ''වෙනත් මෙහෙයුම් ආදායම්'' වලදී හඳුනාගැනේ.

3.5.5 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූලික හඳුනාගැනීමේ දී ලාබ හෝ පාඩු හරහා සාධාරණ අගයට නම්කරන ලද මූල්‍ය වත්කම් හැර ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් බැංකුව විසින් යළි වර්ගීකරණය කරනු ලැබිය හැකිය. ඇතැම් අවස්ථාවලදී

- වෙළඳාම සඳහා තබා ඇති වර්ගයේ සිට ලබාගතහැකි විකුණුම්, ණය සහ ලැබිය යුතු, හෝ පරිනතිය සඳහා තබන ලද වර්ගයට
- ලබාගත හැකි විකුණුම් වර්ගයේ සිට ණය සහ ලැබිය යුතු, වෙළඳාම සඳහා තබා ඇති හෝ පරිනතිය සඳහා තබන ලද වර්ගයට යනාදී ලෙස ප්‍රති වර්ගීකරණ දිනයට සාධාරණ අගය යටතේ ප්‍රතිවර්ගීකරණ සටහන් කරනු ලබන අතර මෙය නව ක්‍රමක්ෂය පිරිවැයක් බවට පත් වේ. ලබා ගත හැකි විකුණුම් වර්ගයේ මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කිරීමේ දී එම වත්කමේ හිමිකමේ දී හඳුනාගන්නා ලද කිසියම් පූර්ව ලාබයක් හෝ පාඩුවක් වේ නම් එය ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරි ආයුකාලය මත ලාබයට හෝ පාඩුවට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර කිසියම් වෙනසක් පවතීනම් එය ද ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ඉතිරි ආයුකාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. පසු අවස්ථාවකදී වත්කම හානිවූවා යැයි නිශ්චය කරනු ලැබුවහොත් එවිට හිමිකමේ සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයට නැවත ඇතුලත් කරනු ලැබේ. මූල්‍ය වත්කමක් නැවත වර්ගීකරණය කරන්නේ නම් සහ මුදල් ලැබීම්වල අයකරගැනීම් හැකියාව ඉහළයාම හේතුකොටගෙන බැංකුව විසින් පසුව එම වත්කමේ අනාගත මුදල් ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු වැඩිකරයි නම් එම වැඩිවීමේ බලපෑම ඇස්තමේන්තු වෙනස්කළ දිනයේ සිට ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයට ගැලපුමක් ලෙස හඳුනාගනී.

3.5.6 මූල්‍ය වත්කම් නැවත හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් මෙන් (අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්):

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය අවසන් වී ඇති විට,
- බැංකුව විසින් වත්කමෙන් මුදල් ලැබීමට ඇති අයිතිය පවරනු ලැබ ඇති විට හෝ හුවමාරු ගිවිසුමක් යටතේ සැලකියයුතු තරමේ ප්‍රමාදයකින් තොරව ලැබී ඇති මුදල් තෙවන පාර්ශ්වයකට ගෙවීම සඳහා බැඳීමක් ඇති විට සහ
  - බැංකුව විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ ඇති විට හෝ
  - බැංකුව විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ හෝ රඳවාගෙන නොමැති වුවත් වත්කමේ පාලනය පවරනු ලැබ ඇති විට හඳුනා නොගනී.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය පවරනු ලැබ ඇති විට හෝ හුවමාරු ගිවිසුමකට එළඹ ඇතිවිට, සහ වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ හෝ රඳවාගෙන නොමැතිවිට හා වත්කමේ පාලනය පවරා නොමැතිවිට වත්කම පිළිබඳ බැංකුවේ පවතින අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණයට වත්කම හඳුනාගනී. එහිදී ඒ ආශ්‍රිත වගකීමක් ද බැංකුව විසින් හඳුනාගනී. මාරුකරන ලද වත්කම හා ඒ හා සම්බන්ධ වගකීම බැංකුව විසින් රඳවාගෙන ඇති අයිතීන් සහ බැඳීම් පිළිබිඹු කරන පදනම මත ගණනය කරනු ලැබේ. මාරුකරන ලද වත්කමක ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ සම්බන්ධතාවය වත්කමේ මූලික ධාරණ අගයේ අවමයට සහ බැංකුව විසින් නැවත ගෙවීමට නියමිත ගෙවීම්වල වටිනාකමේ උපරිමයට ගණනය කරනු ලැබේ.

3.5.7 මූල්‍ය වත්කම් හානිවීම

බැංකුව විසින් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයක් වන විට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේද යන්න පිළිබඳ තක්සේරු කරයි. වත්කමේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදු වූ යම් සිදුවීමක් හෝ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් හානිවීම් (පාඩු අවස්ථා) සිදු වී ඇති බවට සහ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට එකී පාඩු සිදුවීම (හෝ සිදුවීම්) බලපෑමක් එල්ලකර ඇති බවට වාස්තවික සාක්ෂියක් තිබෙනම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවූවා සේ සලකනු ලැබේ.

හානිවීමක් සම්බන්ධයෙන් වන සාක්ෂි වශයෙන් ණය ගත් තැනැත්තා හෝ තැනැත්තන් සමූහයක් බරපතල මූල්‍ය දුෂ්කරතාවයකට ලක් වී ඇති බවට, බංකොලොත් බාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීමට ඉඩ ඇති බවට, පොලී හෝ ප්‍රාග්ධන මුදල් ගෙවීම් පැහැර හැරීමකට ලක් වීඇති බවට සහ හිඟ මුදල් සහ ආර්ථික තත්ත්වයන් වෙනස්වීම වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ ගණනය කළ හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මඟින් හැඟවීමක් වන බවට වන යම් කරුණු සඳහන් කිරීමක් ඇතුළත් වේ.

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන ආ මූල්‍ය වත්කම් හානිවීම

මූල්‍ය වත්කම් (බැංකුවේ තැන්පතු, ගණුදෙණුකරුවන්ට ලබා දෙන ලද ණය සහ අත්තිකාරම්, කල්බදු සහ කුලීපිට ගැනුම්වල ලැබිය යුතු කුලී සහ කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යාම සඳහා බැංකුව විසින් පළමුව කේවල වශයෙන් වැදගත්කමක් ගන්නා මූල්‍ය වත්කම් හානිවීම් සම්බන්ධයෙන් කේවල සාක්ෂි පවතීද යන්න හෝ කේවල වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් වාස්තවික සාක්ෂි පවතීද යන්න පිළිබඳ තක්සේරු කරනු ලබයි. කේවල වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් හානිවීම් සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂි නොමැති බවට බැංකුව විසින් තීරණය කරනු ලැබුවහොත් එම වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ සහිත වත්කම් සමූහයක් තුළට ඇතුළත් කරනු ලබන අතර හානිවීම් සම්බන්ධයෙන් ඒවා සාමූහික වශයෙන් තක්සේරු කරයි. හානිවීම් සම්බන්ධයෙන් කේවල වශයෙන් තක්සේරු කරන ලද මෙන්ම හානිකරණ පාඩුවක් පවතින හෝ අඛණ්ඩව පවතින බවට හඳුනාගන්නා ලද වත්කම් සාමූහික වත්කම් තක්සේරුව සඳහා ඇතුළත් නොකරයි.

හානිකරණ පාඩුවක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතීනම් එම පාඩුවේ ප්‍රමාණය වත්කම්වල ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය (මෙතෙක් සිදු වී නොමැති අනාගත ණය පාඩු හැර) අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ. වත්කමේ ධාරණ අගය දීමනා ගිණුමක් භාවිතා කිරීම මඟින් අවකරණය කරනු ලබන අතර පාඩුවේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාග නී. ණය සහ ආශ්‍රිත දීමනා අනාගතයේ දී යළි අයකරගැනීම සම්බන්ධයෙන් සැබෑ අපේක්ෂාවක් නොමැති කල්හි ඒවා ලියාහරිනු ලබන අතර සියලු ණය ඇප උපලබ්ධිකර හෝ සමූහයට මාරු කරනු ලැබේ. හානිවීම හඳුනාගැනීමෙන් අනතුරුව වූ යම් සිදුවීමක් හේතුවෙන් හානිකරණ පාඩුව පිළිබඳ ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණය පසුව එළඹෙන වර්ෂයකදී වැඩි වන්නේ නම් හෝ අඩු වන්නේ නම් කලින් හඳුනාගන්නා ලද

හානිකරණ පාඩුව දීමනා ගිණුමට ගැලපුම් කිරීම මගින් වැඩිකිරීම හෝ අඩු කිරීම සිදුකරනු ලබයි. අනාගත ලියා හැරීමක් පසුව අයකරගනු ලැබුවවහොත් එම අයකරගැනීම ''ණය සහ වෙනත් පාඩු සඳහා වන හානිකරණ ගාස්තු'' වලට බැර කරනු ලැබේ.

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය මූල්‍ය වත්කමේ මූලික ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සම්බන්ධයෙන් විචල්‍ය පොලී අනුපාතයක් පවතී නම් කිසියම් හානිකරණ පාඩුවක් ගණනය කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වනුයේ වර්තමාන ඵලදායී පොලී අනුපාතයයි.

හානිකරණය සාමූහික වශයෙන් තක්සේරු කිරීමේ කාර්යය සඳහා මූල්‍ය වත්කම, වත්කමේ වර්ගය, භූගෝලීය පිහිටීම, අතීතයේ නියමිත තත්ත්වය සහ අනෙකුත් අදාළ සාධක වැනි ණය අවදානම් සුවිශේෂිත ලක්ෂණ පිළිබඳ සැලකිල්ල යොමුකොට කාණ්ඩගත කරනු ලැබේ. සමාන ණය අවධානම් සහිත ණය සඳහා සාමූහික පදනම මත හානිකරණ පාඩු තීරණය කරනු පිණිස සංඛ්‍යාත ක්‍රම භාවිතා කරනු ලැබේ.

ණය මුදල් හිඟව පවතින මාස සංඛ්‍යාව අනුව ශ්‍රේණිගත කරනු ලැබේ. එක් එක් ශ්‍රේණියට අයත් ණය එම ණය මුදල් ගෙවීම පැහැර හැරීමේ විවිධ අදියරයන් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක විය හැකි බවට තක්සේරු කිරීම සඳහා සංඛ්‍යාලේඛනමය විශ්ලේෂණ භාවිතා කරයි.

ලබාගත හැකි විකුණුම් මූල්‍ය ආයෝජන හානිවීම

ලබාගතහැකි විකුණුම් මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන් බැංකුව විසින් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයක් වන විට ආයෝජනයක් හානි වී ඇති බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේද යන්න පිළිබඳ ව තක්සේරු කරයි. ණය උපකරණ ලබාගතහැකි විකුණුම් සේ වර්ගකර ඇති විට බැංකුව විසින් මූල්‍ය වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය පවත්වාගෙන යනු ලබන නිර්ණායකයන්ම පදනම් කරගෙන ආයෝජන හානිවීමක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්න පිළිබඳ ව කේවල වශයෙන් තක්සේරු කරයි. කෙසේනමුත්, හානිකරණය සටහන් කළ ප්‍රමාණය වනුයේ ආයෝජනය සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා ලද කිසියම් හානිකරණ පාඩුවක් වෙතොත් එය අඩු කළ ක්‍රමක්ෂය පිරිවැය සහ වර්තමාන සාධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද සමුච්චිත පාඩුවයි. අනාගත පොලී ආදායම අවකරණය කරන ලද ධාරණ අගය මත පදනම් වන අතර හානිකරණ පාඩුව ගණනය කිරීම සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිතා කරන ලද පොලී අනුපාතය භාවිතා කොට උපචිත කරනු ලබයි.

පොලී ආදායම ''පොලී සහ සමාන ආදායම්වල'' කොටසක් ලෙස සටහන් කරනු ලැබේ. පසු කාලපරිච්ඡේදයකදී ණය උපකරණයක සාධාරණ අගය වැඩිවේනම් සහ එම වැඩිවීම ආදායම් ප්‍රකාශනයේ හානිකරණ පාඩුව හඳුනාගැනීමෙන් පසුව සිදුවන ණය අවස්ථාවකට වාස්තවිකව අදාළ කරගත හැකිනම් එම හානිකරණ පාඩුව ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කරනු ලැබේ.

හිමිකම් ආයෝජන ලබාගත හැකි විකුණුම් ලෙස වර්ගීකරණය කර ඇති විට වාස්තවික සාක්ෂි යන්නට ආයෝජනයේ සාධාරණ අගය එහි පිරිවැයට වඩා ''සැලකිය යුතු ලෙස'' හෝ ''දීර්ඝ ලෙස'' පහළ යාමක් ඇතුළත් වේ. ''සැලකිය යුතු'' යන්න ආයෝජනයේ මූලික පිරිවැයට සාපේක්ෂව තක්සේරු කරනු ලබන අතර ''දීර්ඝ ලෙස'' යන්න සාධාරණ අගය ආයෝජනයේ මූලික පිරිවැයට වඩා පහළ මට්ටමක පැවැති කාලයට සාපේක්ෂව තක්සේරු කරනු ලබයි. හානිවීමක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතින විට එම ආයෝජනය සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශනයේ කලින් හඳුනාගන්නා ලද කිසියම් හානිකරණ පාඩුවක් වෙතොත් එය අඩුකළ අත්පත් කරගැනීමේ පිරිවැය සහ වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද සමුච්චිත පාඩුව හිමිකම්න් ඉවත් කරනු ලබන අතර ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගැනේ. හිමිකම් ආයෝජන මත වන හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කරනු නොලබන අතර හානිකරණයෙන් පසුව සාධාරණ අගයේ වූ වැඩිවීම් වෙනත් විස්තීර්ණ ආදායමේ දී හඳුනාගැනේ.

3.5.8 ණය මුදල් ඇප තක්සේරුව

මූල්‍ය වත්කම්වල අවදානම ලිහිල් කරනු පිණිස හැකි අවස්ථාවලදී බැංකුව ණය මුදල් ඇප භාවිතා කිරීමට උත්සාහ කරයි. ණය මුදල් සඳහා වන ඇපමුදල්, සුරැකුම්, ණයවර ලිපි/ ඇප සහතික, දේපොළ, ලැබිය යුතු දෑ, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් ස්වරූපයෙන් සහ සමූහ ණය ගිවිසුම් වැනි ණය එකතු කිරීමේ ගිවිසුම් වේ. ණය මුදල් සඳහා වන ඇපවල සාධාරණ අගය ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් මත පදනම්ව සාමාන්‍යයෙන් ආරම්භයේ දී අවම මට්ටමට තක්සේරු කරනු ලැබේ.

දේපළ වැනි මූල්‍ය නොවන ඇප ස්වාධීන තක්සේරුකරුවන් සහ ණය සමාගම්වල විගණිත මූල්‍ය ප්‍රකාශන වැනි තෙවැනි පාර්ශ්වයන් විසින් සපයනු ලබන දත්ත මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

3.6 මූල්‍ය නොවන වත්කම්

3.6.1 දේපළ සහ උපකරණ

හඳුනාගැනීම සහ ගණනය කිරීම

වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා යා හැකි ප්‍රවණතාවක් පැවතීම අනුව දේපල සහ පිරියත හඳුනාගනු ලබන අතර වත්කමේ පිරිවැය ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 අනුව දේපළ, පිරියත සහ උපකරණ ප්‍රකාරව අගය විශ්වසනීය ලෙස ගණනය කෙරේ. මූලිකව දේපළ සහ උපකරණ පිරිවැයට ගණනය කරනු ලැබේ.

පිරිවැය ආකෘතිය

සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි වටිනාකම් අඩුකළ දෛනික සේවා පිරිවැය හැර දේපළ සහ උපකරණ පිරිවැයට සඳහන් කරන මෙම පිරිවැයට යන්නට හඳුනාගැනීමේ නිර්ණායක සම්පූර්ණ කරන ලද උපකරණ කොටස් ඇතුළත් වේ.

පසු පිරිවැය

අයිතමයේ අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලායාමේ ප්‍රවණතාවයක් පවතීනම් සහ එය විශ්වසනීය ලෙස ගණනය කළ හැකිනම් මෙම පිරිවැය අයිතමයේ ධාරණ අගයට හඳුනාගනී.

ක්ෂයවීම්

ක්ෂයවීම් සරල මාර්ග ක්‍රමය මත පහත සඳහන් ප්‍රමාණයන්ට අනුව සලසනු ලැබේ. සින්නකර ඉඩම් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු නොලැබේ. ක්ෂයවීමේ කාර්යය සඳහා අදාළ සඵල ආයුකාලය පහතින් දැක්වේ.

පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	අවුරුදු 04
ගෘහභාණ්ඩ සහ සවිකුරු	අවුරුදු 05
මෝටර් රථ	අවුරුදු 05
කාර්යාල උපකරණ සහ අනෙකුත් ස්ථාවර වත්කම්	අවුරුදු 05

හඳුනා නොගැනීම

දේපළ සහ උපකරණ විකිණීමේ දී හෝ ඒවා භාවිතය තුළ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවේ දී දේපළ සහ උපකරණ හඳුනා නොගනී. වත්කම ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් වන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (ශුද්ධ විකුණුම් මුදල් සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණන් බලන ලද) වත්කම හඳුනා නොගන්නා වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ ''වෙනත් මෙහෙයුම් ආදායම්'' ලෙස හඳුනාගනී.

විකිණීමෙන් පසු යම් වත්කමක් විකිණීමට අදාළ කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේනම් එය රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

3.6.2 මූල්‍ය නොවන වත්කම් හානිවීම

බැංකුව විසින් සෑම වාර්තාකරණ දිනයක් වන විට වත්කමක් හානිවිය හැකි බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න පිළිබඳ තක්සේරු කරනු ලබයි. එවැනි යම් ඇඟවීමක් තිබේනම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානි පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය වේ නම් බැංකුව විසින් වත්කමේ අයකර ගත හැකි අගය තක්සේරු කරනු ලබයි.

3.6.3 ආයෝජන දේපළ

ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ එම අයිතම දෙකම හෝ, කුලී ඉපයීම සඳහා තබාගන්නා ලද අයිතම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ එම අයිතම දෙකම මත සිදුකරන ආයෝජන, දේපළ ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. ගණුදෙනු පිරිවැය ද ඇතුළුව ආයෝජන දේපළ (මූලිකව සහ පසුව) පිරිවැය පදනම මත ගණනය කරනු ලැබේ. කළමණාකරණය විසින් දේපළක ආයෝජන සාධාරණ අගය වාර්ෂික පදනම මත ගණනය කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වල වෙනවෙනම හෙලිදරව් කරනු ලැබේ. ලැබිය යුතු කුලී සරල මාර්ග පදනම මත අදාළ බදු කාලසීමාව තුළ ව්‍යාප්ත කරනු ලැබේ. කුලී නිවැසියෙකුට යම් දිරිගැන්වීමක් (බදු නිදහස් කාලයක් වැනි) ලබා දී ඇති විට මෙම පදනම මත කුලී ආදායමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් වෙනම වත්කමක් වශයෙන් සඳහන් කරන ලද කිසියම් අගයක් ආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් බැහැර කෙරේ.

3.6.4 භාණ්ඩ තොග

ලිපිද්‍රව්‍ය තොග වැනි භාණ්ඩ තොග යල් පැනගිය සහ අඩු චලන සහිත අයිතම සඳහා අදාළ දීමනා සැලසීමෙන් අනතුරුව පිරිවැයෙහි අවමයට සහ ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කරනු ලැබේ.

3.6.5 ණය පිරිවැය

වත්කමක් අත්පත් කරගැනීමට හෝ අපේක්ෂිත පරිදි භාවිතා කිරීමට හෝ විකිුණම සඳහා සූදානම් කිරීමට අනිවාර්යයෙන්ම සැලකිය යුතු කාලයක් ගන්නා වත්කමක් ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම අදාළ වන ණය පිරිවැය අදාළ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය පිරිවැය අදාළ කාලය තුළ දරනු ලැබේ. ණය පිරිවැය යන්නට අරමුදල් ණයට ගැනීමට අදාළව ආයතනය විසින් දරනු ලබන පිරිවැය සහ ඊට අදාළ පොලිය ඇතුළත් වේ.

3.7 මූල්‍ය වගකීම

3.7.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී.ලං.ගි.ප්‍ර.39 ප්‍රකාරව මූල්‍ය වගකීම් යෝග්‍ය පරිදි බැංකුවට ගෙවීමට නියමිත ගණුදෙනුකරුවන්ගේ තැන්පතු සහ ණය ප්‍රතිමූල්‍ය ණය යෝග්‍ය පරිදි වශයෙන් වර්ගීකරණය කෙරේ. බැංකුව විසින් එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේ දී නිශ්චය කරනු ලබයි.

බැංකුව විසින් මූල්‍ය වගකීම් ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයට වන මූල්‍ය වගකීම් වලට හෝ කොන්ත්‍රාත් ගිවිසුමේ කරුණු ප්‍රකාර වෙනත් මූල්‍ය වගකීම්වලට සහ මූල්‍ය වගකීම්වල නිර්වචනයන්ට අනුව වර්ගීකරණය කරනු ලැබේ. බැංකුව මූල්‍ය වගකීමේ කොන්ත්‍රාත් විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත්වන විට බැංකුව විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හඳුනාගනී.

i. ලාභය හෝ පාඩුව හරහා මූල්‍ය වගකීම් සාධාරණ අගයට

ලාභය හෝ පාඩුව හරහා මූල්‍ය වගකීම් සාධාරණ අගයට යන්නට වෙළඳාම සඳහා තබාගන්නා ලද මූල්‍ය වගකීම් සහ මූලික හඳුනාගැනීමේ දී එලෙස නම් කරන ලද මූල්‍ය වගකීම් අයත් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ලාභය හෝ පාඩුව හරහා සාධාරණ අගයට මූල්‍ය වගකීම් සාධාරණ අගයට ගණනය කරනු ලබන අතර ඒවායේ වෙනස්වීම් ලාභයේ දී හෝ පාඩුවේදී හඳුනාගනී.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ගණුදෙණු පිරිවැය සෘජුවම අත්පත් කරගැනීම හා සම්බන්ධ වන අතර ලාභය හෝ පාඩුවේ දී එය දරන ලද පිරිවැයක් ලෙස හඳුනාගනී.

මූල්‍ය වගකීම් ලාභය හෝ පාඩුව හරහා සාධාරණ අගයට මූලික හඳුනාගැනීමේ දී නම් කිරීම සඳහා අදාළ නිර්ණායක වනුයේ මූල්‍ය වත්කම් ලාභය හෝ පාඩුව හරහා නම්කිරීමට යොදාගන්නා නිර්ණායකයන්ම වේ.

ii. අනෙකුත් මූල්‍ය වගකීම්

තැන්පතු, බැංකුව විසින් නිකුත් කරන ලද ණය සහ අනෙකුත් ණය අරමුදල් ඇතුළත් අනෙකුත් මූල්‍ය වගකීම් මූලිකව අත්පත්කර ගැනීම්වලට සෘජුවම අදාළ වන ගණුදෙණු පිරිවැය අඩුකළ සාධාරණ අගයට ගණනය කරනු ලබන අතර අනතුරුව ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. නිකුත් කිරීම මත වන කිසියම් වට්ටමක් හෝ වාරිකයක් හෝ ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයේ අවියෝජනීය අංගයක් වන පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

3.7.2 මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

වගකීම් යටතේ වන බැඳීම් නිදහස්වන හෝ අවලංගුවන හෝ අවසන් වන විට මූල්‍ය වගකීම් හඳුනා නොගනී. පවත්නා මූල්‍ය වගකීම් සැලකියයුතු ප්‍රමාණයේ වෙනස් නියමයන් මත එම ණයදෙන්නා විසින්ම වෙනත් ස්වරූපයකින් ආදේශ කරනවිට හෝ පවත්නා වගකීමේ නියමයන් සැලකිය යුතු ලෙස සංශෝධනය කරනවිට එවැනි වෙනසක් හෝ සංශෝධනයක් මූලික වගකීමේ හඳුනා නොගැනීමක් ලෙස හා නව වගකීමේ හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. මූලික මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභයේ හෝ පාඩුවේ දී හඳුනාගනේ.

3.8 විශ්‍රාම පාරිතෝෂික බැඳීම්

3.8.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19 ට (සේවක ප්‍රතිලාභ) අනුකූලව සියලුම සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික ලබා දීම පිණිස ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම් පිළිබඳ වගකීම ඇතිවන්නේ සේවකයා අඛණ්ඩව වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමේ දීය. මෙම වගකීම සඳහා භාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වූ කලී නිශ්චිත දායක සැලසුමක් හැර පශ්චාත් - රැකියා ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන බැංකුවේ ශුද්ධ බැඳීම් සේවකයන් විසින් වර්තමාන සහ පූර්ව කාලපරිච්ඡේදයන් තුළ සේවා සැපයීම වෙනුවෙන් ඔවුන් උපයාගත් අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය තක්සේරු කිරීම මඟින් ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභවල වර්තමාන අගය නිශ්චය කිරීම පිණිස ප්‍රතිලාභ වට්ටම් කරනු ලැබේ. හඳුනානොගන්නා ලද පූර්ව සේවා පිරිවැය අවකරණය කරනු ලැබේ.

වට්ටම් අනුපාතය වූ කලී වාර්තාකරණ දිනයට ඉහළ තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලයයි. බැංකුවේ බැඳීම් පිළිබඳ නියමයන් අනුව කල්පිරෙන දිනයක් එයට ඇති අතර ප්‍රතිලාභ ගෙවීමට අපේක්ෂා කරනු ලබන මුදල් ඒකකවලට එය පරිවර්තනය කරනු ලැබේ. පුරෝකථනය කළ ණය ක්‍රමය භාවිතා කර වාර්ෂිකව ගණනය කිරීම් සිදු කරනු ලැබේ.

3.8.2 නිශ්චිත දායක සැලසුම්

සේවකයන් විසින් බැංකුවට ඉටුකරනු ලබන සේවයට සමානුපාතිකව නිශ්චිත දායක සැලසුමකට ගෙවිය යුතු දායක මුදල ''කාර්යමණ්ඩල වියදම්'' යටතේ වියදමක් ලෙස සටහන් කරනු ලැබේ. ගෙවනු නොලැබූ දායක මුදල් වගකීමක් වශයෙන් සටහන් කරයි.

සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයන් විසින් පිළිවෙලින් 12% ක හා 8% ක දායක මුදල් අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදලකට ගෙවනු ලබයි.

සේවා නියුක්තයන්ගෙන් භාර අරමුදල

සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට බැංකුව විසින් 3% ක දායක මුදල් ගෙවනු ලබයි.

3.9 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ව්‍යුහාත්මක) පවතින විට ප්‍රතිපාදන හඳුනාගනී. බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර බැඳීමේ ප්‍රමාණයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කළ හැකිය. ප්‍රතිපූර්ණය කිරීම් හැර කිසියම් ප්‍රතිපාදනයකට වියදමක් ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

3.10 මූල්‍ය සහතික

සාමාන්‍ය ගනුදෙනු කටයුතුවලදී බැංකුව ණයවර ලිපි සහ සහතිකවලින් සමන්විත මූල්‍ය සහතික ලබා දේ. මූල්‍ය සහතික මූල්‍ය ප්‍රකාශනයේ දී මූලිකව සාධාරණ අගයට (අනෙකුත් වගකීම් ඇතුළත) හඳුනාගනී. එසේ හඳුනාගැනීමෙන් අනතුරුව එක් එක් සහතික යටතේ වන බැංකුවේ වගකීම්, ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගන්නා ලද සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මූලිකව හඳුනාගත් ප්‍රමාණයේ ඉහළ අගයට ගණනය කරනු ලබන අතර සහතිකවීම නිසා ඇතිවුන කිසියම් මූල්‍ය බැඳීමක් නිරවුල් කිරීම පිණිස වඩාත් හොඳම ඇස්තමේන්තුව අවශ්‍ය වේ. මූල්‍ය සහතිකවලට අදාළ වගකීමේ කිසියම් වැඩිවීමක් ආදායම් ප්‍රකාශනයේ ''පොලී වියදම්'' යටතේ දක්වනු ලැබේ. ලද වාරික සහතිකයේ බලාත්මක කාලය තුළ සරල රේඛීය පදනම මත ''ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම'' ලෙස ආදායම් ප්‍රකාශනයේ දී හඳුනා ගනේ.

3.11 බදුකරණය

ආදායම් බදු වියදම් වර්තමාන බදු සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. ආදායම් බදු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගැනේ.

3.12.1 වර්තමාන බදු

වර්තමාන බදු වත්කම් හා වගකීම් ප්‍රවර්තන වර්ෂයට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබා ගැනීමට අපේක්ෂිත හෝ ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයෙන් සහ පූර්ව වර්ෂයට අදාළව කිසියම් ගෙවිය යුතු බදු ගැලපුමකින් සමන්විත වේ. මුදල් ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද බදු අනුපාත සහ බදු නීති මූල්‍ය ප්‍රකාශන දිනය වන විට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු

අනුපාත සහ බදු නීති වේ. ලාභාංශ ආදායම සහ පොලිය හැර ආදායම සහ ලාභය 2013 අංක 13 දරන දේශීය ආදායම් පනතේ 7(ආ) වගන්තිය යටතේ ප්‍රවර්තන වර්ෂයෙන් නිදහස් කෙරේ.

3.12.2 විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණය කාර්යය සඳහා වත්කම්වල සහ වගකීම්වල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම්වල බදු පදනම අතර තාවකාලික වෙනස මත විලම්බිත බදු සලසනු ලබන අතර එය බදු කාර්යය සඳහා එම වත්කමට හා වගකීමට අදාළ වන ප්‍රමාණයයි. සලසන ලද විලම්භිත බදු මුදල් ප්‍රමාණය වාර්තාකරණ දිනය වන විට පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාතයන් භාවිතා කරමින් සහ වගකීම්වල ධාරණ අගය උපලබ්ධි කිරීමට හෝ නිරවුල් කිරීමට අපේක්ෂිත ආකාරය මත පදනම් වේ. බැංකුව ආදායම් බද්දෙන් නිදහස් කර ඇති නිසා විලම්භිත බදු ගැලපුම් සලසා නොමැත.

3.12.3 එකතු කළ අගය මත බද්ද - මූල්‍ය සේවා මත

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත වන බදු 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත හා එයට පසුව සිදුකරනු ලැබූ සංශෝධන වලට අනුකූලව ගණනය කරනු ලැබේ. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ගණනය කිරීම සඳහා පදනම වනුයේ එකතුකළ අගය මත බද්දට පෙර ගිණුම්කරණ ලාභය සහ ආර්ථික පරිහානිය සඳහා ගලපන ලද ආදායම් බද්ධ සහ නියමිත ප්‍රමාණයක් මත ගණනය කරන ලද පාරිශ්‍රමයන්ය.

3.13 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලායා හැකි තරමට සහ ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි තරමට ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීමට පෙර පහත සඳහන් හඳුනා ගැනීමේ නිර්ණායක සපුරා තිබිය යුතුය.

3.13.1 පොළී ආදායම් සහ පොළී වියදම්

ලාභයේ දී හෝ පාඩුවේ දී ඵලදායී පොළී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් පොළී ආදායම සහ වියදම හඳුනාගනී. මූල්‍ය වත්කම් හෝ වගකීමේ අපේක්ෂිත ආයුකාලය තුළ (හෝ අදාළ පරිදි කෙටි කාලපරිච්ඡේදයක් තුළ) ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් සහ ගෙවීම් මූල්‍ය වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට සැබෑ ලෙසම වට්ටම් කරන අනුපාතය ඵලදායී පොළී අනුපාතය වේ. ඵලදායී පොළී අනුපාතය ගණනය කිරීමේ දී බැංකුව විසින් මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගෙන අනාගත මුදල් ප්‍රවාහ තක්සේරු කරන නමුත් අනාගත ණය පාඩු තක්සේරු නොකරයි.

ඵලදායී පොළී අනුපාතය ගණනය කිරීමේ දී ඵලදායී පොළී අනුපාතයේම කොටසක් වන සියලුම ගණුදෙණු පිරිවැය සහ ගාස්තු එයට ඇතුළත් වේ. මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කරගැනීමට හෝ නිකුත්කිරීමට සෘජුවම සම්බන්ධ වන වර්ධක පිරිවැය ගණුදෙණු පිරිවැයට ඇතුළත් වේ.

ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කොට ඇති පොළී ආදායම සහ වියදම තුළ ඵලදායී පොළී පදනමක් මත ගණනය කරන ලද ක්‍රමක්ෂය පිරිවැයට අනුව ගණනය කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් මත වන පොලිය අන්තර්ගත වේ.

පොළී ආදායම තුළ ඵලදායී පොළී පදනමක් මත ගණනය කරන ලද හා විකිණීමට ඇති ආයෝජන සුරැකුම් මත වන පොළී ආදායම ද අන්තර්ගත වේ.

හානිකරණ පාඩුවක් හේතුවෙන් මූල්‍ය වත්කමක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක් ලියා හරිනු ලැබ ඇති විට හානිකරණ පාඩුව ගණනය කිරීම පිණිස අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සඳහා භාවිතා කරන ලද පොළී අනුපාතය භාවිතා කරමින් පොළී ආදායම හඳුනාගනී.

3.13.2 ගාස්තු සහ කොමිස් ආදායම

මූල්‍ය වත්කමක හෝ වගකීමක ඵලදායී පොළී අනුපාතය සඳහා අත්‍යවශ්‍ය වන ගාස්තු සහ පොළී ආදායම ඵලදායී පොළී අනුපාත ගණනයේ දී එයට ඇතුළත් කොට ඇත.

ගිණුම් සේවා ගාස්තු, ආයෝජන කළමණාකරණ ගාස්තු, විකුණුම් කොමිස් මුදල්, ස්ථාපන හා සංයෝජන ගාස්තු ඇතුළත් ගාස්තු සහ කොමිස් ආදායම අදාළ සේවාව ඉටුකරනු ලබන විට හඳුනාගනී.

අනෙකුත් ගාස්තු සහ කොමිස් වියදම් ප්‍රධාන වශයෙන් ගනුදෙනුවට සහ සේවා ලබන අවස්ථාවේ වැය කරනු ලබන සේවා ගාස්තුවලට අදාළ වේ. ගාස්තු සහ කොමිස් වියදම් උපචිත පදනමක් මත හඳුනාගනී.

3.13.3 ලාභාංශ ආදායම

ලාභාංශ ලැබීම පිණිස බැංකුවේ අයිතිය තහවුරු වන අවස්ථාවේ දී ලාභාංශ ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ලාභාංශ ආදායමක් ලෙස හඳුනාගනී.

3.14 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

''චක්‍ර ක්‍රමය'' භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කොට ඇති අතර එමඟින් මෙහෙයුම් කටයුතුවල, මූල්‍ය කටයුතුවල සහ ආයෝජන කටයුතුවල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත.

3.15 නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලපවත්වා නොමැති ප්‍රමිත

නිකුත් කරන ලද නමුත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කරනු ලැබූ දිනය වන විට බලපැවැත්වීමක් නොමැති ප්‍රමිත පහතින් දැක්වේ. මෙම ප්‍රමිත බලපැවැත්වීමෙන් පසු බැංකුව විසින් ඒවා අනුගමනය කරනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයකට අනුව මෙම මූල්‍ය වත්කම් ප්‍රකාශකරන දිනය වන විට මූල්‍ය බලපෑම සාධාරණ ලෙස තක්සේරු කොට නොමැත.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. - මූල්‍ය උපකරණ : වර්ගීකරණය සහ ගණනය කිරීම
ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.13 - සාධාරණ අගය ගණනය කිරීම

4 මූල්‍ය උපකරණ - අවදානම් කළමනාකරණය

4.1 අවදානම් කළමනාකරණ ව්‍යූහය

බැංකුව වෙනුවෙන් එහි සමස්ත කළමනාකරණ කාර්ය රාමුව පිළිබඳ තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර අවදානම් කළමනාකරණ ක්‍රමෝපා ඵලදායී ලෙස යොදාගැනීම පිළිබඳ අධීක්ෂණය කිරීමේ වගකීම ද එයට පැවරී ඇත. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති අනුමත කරනු ලබන අතර අවදානම් නැඹුරුතා සහ ක්‍රමෝපා සම්බන්ධයෙන් අදාළ ඉලක්ක සහ සීමා නියම කිරීම සිදුකරනු ලබයි. බැංකුව මුහුණදෙන සෑම ආකාරයකම අවදානමක්ම සාර්ථක ලෙස කළමනාකරණය කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනු කමිටු පිහිටුවා ඇත. මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පත් කරනු ලැබ ඇති අතර බැංකුව තුළ සමස්ත අවදානම් ක්‍රියාවලිය පිළිබඳ අධීක්ෂණය කිරීමේ වගකීම එයට පැවරී ඇත.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා ඉලක්කයක් ලබා දීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීම සඳහා ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සකස් කිරීම සහ එම ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති උපදෙස් සහ ප්‍රතිපත්තිවලට අනුකූලව සමස්ත මෙහෙයුම් පවත්වාගෙන යාම පිළිබඳ වගබලා ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වගකීම දරයි.

ස්ථාපිත කර ඇති ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සී.ස.ශ්‍රී.ලං.ඉ. බැංකුවේ දෛනික මෙහෙයුම්වලට අදාළ කරගනු ලැබේ. සමස්ත බැංකුව සම්බන්ධයෙන්ම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් අභ්‍යන්තර විගණන වැඩසටහනක් මඟින් (අභ්‍යන්තර වශයෙන් ස්ථාපිත) වාර්ෂිකව විගණනය කරනු ලබන අතර එමඟින් කාර්ය පටිපාටිවල ප්‍රමාණවත් බව සහ බැංකුව විසින් එම කාර්ය පටිපාටිවලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව පරීක්ෂා කරනු ලබයි. සමස්ත තක්සේරුවේ ප්‍රතිඵල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ඒකකය කළමනාකරණය සමඟ සාකච්ඡා කර එහි තීරණ සහ නිර්දේශ විගණන කමිටුව වෙත වාර්තා කරයි.

මණ්ඩලයේ ඒකාබද්ධ කළමනාකරණ කමිටුවට විධායක නොවන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් ඇතුළත් වන අතර එයින් එක් අයකු විසින් කමිටුවේ සභාපතිත්වය දරනු ලැබේ. තවද ඊට අධ්‍යක්ෂ-ප්‍රධාන විධායක නිලධාරී, රැස්වීම්වලට සහභාගීවන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ නිලධාරීන් එනම්, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ආයතනික සම්බන්ධතා), කළමනාකරු (ණය) සහ කළමනාකරු (තොරතුරු තාක්ෂණ) ඇතුළත් වේ.

වෙළඳපොල, ණය, ද්‍රවශීලතා, මෙහෙයුම්, අනුකූලවීම් සහ කීර්තිනාමය සහ ක්‍රමෝපා අවදානම් නිරන්තරයෙන් තක්සේරු කිරීම මඟින් බැංකුවේ අවදානම් අධීක්ෂණය කිරීම, පවතින සීමාවන් තුළ බැංකුවේ අවදානම් කළමනාකරණය කරනු පිණිස වත්කම් සහ වගකීම් කමිටුව සහ ණය කමිටුව වැනි කමිටුවල මෙහෙයුම් සහ ඵලදායීතාවය පිළිබඳ සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කමිටුව විසින් සිදුකරනු ලබයි.

මෙහෙයුම් කටයුතුවල සෑම ක්ෂේත්‍රයකටම අදාළව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලනය සහ අනුමත ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුව කටයුතු කිරීම පිළිබඳ තක්සේරු කිරීම සඳහා අනුකූලතා වැඩසටහනක් ද ස්ථාපිත කර ඇත.

අනෙකුත් සියම කටයුතු සම්බන්ධයෙන් පොදුවේ බලනකළ බැංකුව එහි මූල්‍ය උපකරණ භාවිතාකිරීම තුළින් පැනනඟින අවදානමකට නිරාවරණය වී ඇත. එකී අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන බැංකුවේ අභිමතාර්ථ, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් මෙන්ම ඒවා ගණනය කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේද මෙම සටහනින් විස්තර කෙරේ.

තවද මෙම අවදානම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු මෙම මූල්‍ය වාර්තා පුරාම ඉදිරිපත් කර ඇත.

සටහන්වල අන්‍ය ආකාරයකින් සඳහන් වෙතොත් හැර පසුගිය කාලපරිච්ඡේදයේ සිට මූල්‍ය උපකරණ අවදානයට බැංකුව නිරාවරණය වීම, එකී අවදානම් කළමනාකරණය කිරීම සඳහා එහි අභිමතාර්ථ, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් හෝ ඒවා ගණනය කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදවල සැලකිය යුතු තරමේ වෙනස්කම් සිදු වී නොමැත.

5. ශුද්ධ පොළී ආදායම

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
පොළී ආදායම		
පොළී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර	50,514,493	48,642,525
පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	3,268,098	17,674,789
පොළී ආදායම - රෙපෝ ආයෝජන	15,516,145	12,958,373
පොළී ආදායම - ණයකර HDFC	780,938	-
පොළී ආදායම - තැන්පතු - බැංකු	731,279,349	467,207,454
පොළී ආදායම - සුරැකුම් කළ පත්‍රිකා	1,626,930	7,090,656
පොළී ආදායම - වාණිජ පත්‍රිකා	-	49,550,038
පොළී ආදායම - PSDB ණය	43,311,670	48,710,496
පොළී ආදායම - කල්බදු	11,279,749	3,892,738
පොළී ආදායම - තැන්පත් ශේෂ මත ණය	48,737	51,143
පොළී ආදායම - කුලී පිට ගැනුම්	3,839,452	884,228
පොළී ආදායම - පාර්ශ්ව සංවිධානවලට ණය	94,260,648	78,278,991
පොළී ආදායම - දොරින් දොර ණය	1,105,987	792,982
පොළී ආදායම - කාර්යමණ්ඩල ණය	1,290,140	551,482
පොළී ආදායම - පෞද්ගලික ණය	7,528,405	1,574,063
පොළී ආදායම - පුද්ගල හා ඒකාබද්ධ ණය	19,024,888	1,118,258
පොළී ආදායම - MFD ණය	11,365,712	3,479,021
පොළී ආදායම - උකස් අත්තිකාරම්	2,799	-
පොළී ආදායම - වාහන ණය	375,694	-
මුළු පොළී ආදායම	996,419,833	742,457,238
වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු	33,634,175	22,808,504
PSDB තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	9,368,373	10,347,375
නිකුත් කළ ණයකර	65,022,619	65,200,719
වෙනත් ණයට ගැනීම්	33,263,897	40,483,801
මුළු පොළී වියදම්	141,289,063	138,840,399
ශුද්ධ පොළී ආදායම	855,130,769	603,616,839

5.1 **ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් ශුද්ධ පොළී ආදායම**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
පොළී ආදායම	69,298,736	79,275,687
ශුද්ධ පොළී ආදායම	69,298,736	79,275,687

6. **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
ගාස්තු හා කොමිස් ආදායම	1,281,863	1,861,168
ගාස්තු හා කොමිස් වියදම්	(6,854,458)	(6,671,840)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	(5,572,595)	(4,810,672)
පහත සඳහන් දෑ අඩංගු වේ		
ඉතුරුම් ගිණුම්වලින් කොමිස්	5,338	3,938
ලේඛනගත කිරීමේ ගාස්තු	72,679	18,800
ලේඛනගත කිරීමේ ගාස්තු - MFD	70,200	72,177
ලේඛනගත කිරීමේ ගාස්තු - කල්බදු	208,500	359,250
භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් මත කොමිස්	23,096	66,862
ඇප සහතික මත කොමිස්	77,083	50,667
පසුදාතම් කළ චෙක්පත් වලින් කොමිස්	3,230	4,268
ලේඛනගත කිරීමේ ගාස්තු - පෞද්ගලික ණය	135,175	70,550
ලේඛනගත කිරීමේ ගාස්තු - පුද්ගල හා ඒකාබද්ධ ණය	162,550	27,650
පිරිසැකසුම් ගාස්තු - කුලීපිට ගැනුම්	6,000	16,500
කපාහළ ණය අයකර ගැනීම	-	941,780
පිරිසැකසුම් ගාස්තු ණය	10,000	47,700
පරීක්ෂණ ගාස්තු	226,855	180,762
කොමිස් රක්ෂණ සාමාන්‍යය	174,157	264
ආපසු නොගෙවන තැන්පතු ආදායම	107,000	-
මුළු ගාස්තුව සහ කොමිස් ආදායම	1,281,863	1,861,168

ගාස්තුව සහ කොමිස් වියදම්		
උපදේශක ගාස්තු	1,004,579	1,314,688
වෘත්තිමය ගාස්තු	1,081,285	119,245
නෛතික ගාස්තු	2,165,846	2,527,263
හිමිකම් ගාස්තු	2,250,000	2,000,000
ගෙවීම් සෙවීම් ගාස්තු	16,160	70,640
බැංකු ගාස්තු	180,154	148,233
CRIB ගාස්තු	156,434	177,851
ලේකම් ගාස්තු	-	3,920
ලියාපදිංචි කිරීමේ ගාස්තු - කල්බදු	-	250,000
බෙරුම් කිරීම් ගාස්තු - නෛතික	-	60,000
මුළු ගාස්තු සහ කොමිස් වියදම්	6,854,458	6,671,840

7. **වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය	11,890,000	2,886,484
ලාභාංශ ආදායම	7,233,063	7,112,444
විවිධ ආදායම්	252,769	9,000
ආදායම - නුවරඑළිය බංගලාව	129,700	216,000
ආදායම - අනුරාධපුර බංගලාව	13,000	-
ආදායම - බස් කුලියට දීම	114,530	296,215
වැවිලි ආදායම	40,000	180,000
වෙනත් ලැබිය යුතු දෑ වෙනුවෙන් අයකරගත් ප්‍රතිපාදන	-	961,007
දණ්ඩන පොලිය	136,862	-
අයකරගත් නෛතික ගාස්තු	500	-
වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)	19,810,424	11,661,150

8. **මූල්‍ය වත්කම් හානිකරණය**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
ණය සහ ලැබිය යුතු දෑ - වෙනත් පාරිභෝගිකයන් සඳහා (සටහන 18.5)	104,546,297	(132,121,170)
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	162,584	-
මුළු එකතුව	104,708,881	(132,121,170)

9. **කාර්යමණ්ඩල වියදම්**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
වැටුප් හා ප්‍රසාද දීමනා	37,078,886	30,752,800
නිශ්චිත දායකත්ව/ ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්ව මුදල්	4,111,821	3,453,754
වෙනත් දීමනා හා කාර්යමණ්ඩල ආශ්‍රිත වියදම්	1,199,540	8,686,047
පාරිතෝෂිකය	1,652,948	374,424
මුළු එකතුව	44,043,195	43,267,025

10. **වෙනත් වියදම්**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	3,012,453	2,909,316
විගණනය ආශ්‍රිත ගාස්තු	286,875	105,600
බෘත්තිමය ගාස්තු	285,714	10,714
දේපල, පිරියත හා උපකරණවල ක්ෂය වීම්	7,542,971	7,510,647
කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම්	14,405,936	10,611,876
නඩුවලට අදාළ වන්දි	32,158,940	-
අලුත්වැඩියා හා නඩත්තු	3,992,569	4,439,344
වෙළඳ දැන්වීම්	13,115,407	7,026,345
CSR කටයුතු	52,325	60,378
විනෝදාත්මක කටයුතු	685,728	165,650
ශ්‍රමය අනු කොන්ත්‍රාත්තු වියදම	1,101,569	293,736
ආරක්ෂක ගාස්තු	5,146,437	4,230,066
රක්ෂණ	807,375	502,738
මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය	5,693,832	3,348,989
වරිපණම් සහ බදු	119,933	72,003
පරිත්‍යාග	195,500	1,500
ජාතික රක්ෂණ භාර අරමුදල් බද්ද	4,617,690	-
ප්‍රවාහන සහ ඉන්ධන වියදම්	8,644,236	5,768,203
යැපීම් දීමනා සහ ඉඳුම් හිටුම් වියදම්	830,020	-
කොටස් ආයෝජන - පොතෙන් අස් කළ	22,954	-
විවිධ	1,783,447	360,622
මුළු එකතුව	104,501,911	47,417,725

11. **බදු වියදම්**

	2013 ශ්‍රීරු	2012 ශ්‍රීරු
ප්‍රවර්තන බදු වියදම		
ප්‍රවර්තන වර්ෂය	-	71,041,527
පසුගිය වර්ෂයේ ප්‍රතිපාදන සඳහා ප්‍රතිවර්තනය	(12,088,392)	(11,974,262)
